# “සුනිල සයුරක පහසින් ධරණීය සංවර්ධනයක් කරා”

# වාර්ෂික වාර්තාව 2016

## සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

# පටුන


| | | |
|---|---|---|
| **1** | පසුබිම | |
| | 1.1 හැඳින්වීම | 9 |
| | 1.2 අධිකාරියේ වගකීම සහ කාර්යභාරයන් | 9-11 |
| **2** | පාලන වාර්තාව | 12-14 |
| **3** | විගණන කළමනාකරණ කමිටු වාර්තාව | 15-16 |
| 4 | මෙහෙයුම් පිළිබඳ සමාලෝචනය | 17-36 |
| **5** | පරිපාලන, මානව සම්පත් සංවර්ධන, අභ්‍යන්තර විගණන, මූල්‍ය හා නීති අංශවල සේවය සහ වගකීම | |
| | 5.1 පරිපාලන අංශය | 37 |
| | 5.2 නීති අංශය | 37 |
| | 5.3 අභ්‍යන්තර විගණන අංශය | 37-38 |
| | 5.4 මානව සම්පත් සංවර්ධන අංශය | 38-44 |
| | 5.5 සැලසුම් අංශය | 45 |
| | 5.6 මූල්‍ය අංශය | 45-47 |
| **6** | අධිකාරියේ ගිණුම්කරන ප්‍රතිපත්ති, මූල්‍ය ප්‍රකාශන හා සටහන් | |
| | 6.1 ගිණුම්කරන ප්‍රතිපත්ති | 48-50 |
| | 6.2 2015.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 51 |
| | 6.3 2015.12.31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය | 52 |
| | 6.4 2015.12.31 දිනෙන් අවසන් වසර සඳහා ශුද්ධ වත්කම් හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය | 53 |
| | 6.5 2015 වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 54 |
| | 6.6 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 55-69 |
| | 6.7 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා මූල්‍ය තත්ත්ව ප්‍රකාශ | 70-71 |
| | 6.8 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශ | 72 |
| **7** | විගණකාධිපති වාර්තාව | 73-83 |




**1981** වර්ෂයේ අංක **59** දරණ සමුද්‍ර දූෂණය වැලැක්වීමේ පනත අනුව සමුද්‍ර දූෂණ වැලැක්වීමේ අධිකාරිය ස්ථාපනය කරන ලදී. සමුද්‍ර දූෂණය වැලැක්වීම, අවම කිරිම හා පාලනය සඳහා කටයුතු කිරීම සහ ශ්‍රී ලංකා රජයට අදාල වන සමුද්‍ර දූෂණය පිළිබඳ අන්තර්ජාතික සම්මුතීන් ක්‍රියාත්මක කිරීම උදෙසා අධිකාරිය වෙත පැවරි තිබුණු නෛතික බලතල ශක්තිමත් කිරිමට එවකට පැවති පනත අවලංගු කර 2008 අංක 35 දරණ සමුද්‍ර දූෂණය වැලැක්වීමේ නව පනත සම්මත කරන ලදුව, එය 2009 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක කරන ලදී.

# සංස්ථාමය තොරතුරු

## අධිකාරියේ නම

## සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

## නෛතික පුද්ගලභාවය

**2008 අංක 35 දරණ සමුද්‍ර දූෂණ වැලැක්වීමේ පනත යටතේ ස්ථාපිත කර ඇති නියාමන ආයතනයකි.**

## ලියාපදිංචි ලිපිනය සහ ප්‍රධාන කාර්යාලය

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
අංක 758, බේස්ලයින් පාර,
කොළඹ 09.
ටෙලි: 011 2687520/011 2690604/ 011 2690605
ෆැක්ස් :011 2687451/011 4615960
ඊ මේල් :: info@mepa.gov.lk වෙබ්: mepa.gov.lk

## අධ්‍යක්ෂක මණ්ඩලය

### සභාපති

01.රියර් අද්මිරාල් (විශ්‍රාමික) රෝහණ පෙරේරා මහතා, ඇමතිතුමා විසින් පත්කල සාමාජික

### අධ්‍යක්ෂකවරු

02.ආර්.ආර්.ආර්.ඒ. රූපසිංහ මහතා
අතිරේක ලේකම්, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

03.එන්.එල්.එම්.බී. ලියනගේ මහතා
ජනාධිපතිතුමාගේ පාර්ලිමේන්තු කටයුතු ලේකම්, ඇමතිතුමා විසින් පත්කල සාමාජික

04.ඒ.ඩබ්.සෙනවිරත්න මහතා
අධ්‍යක්ෂ ජෙනරාල්, වෙළඳ නෞකා දෙපාර්තමේන්තුව

05. එම්.ඒ.නන්දනි මිය
අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව

06.මහේන්ද්‍ර පෙරේරා මහතා
ඇමතිතුමා විසින් පත්කල සාමාජික

07. පොෂිත පෙරේරා මහතා
විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ නියෝජිත

08. සේපාලිකා වික්‍රමසිංහ මිය
ධීවර අමාත්‍යාංශයේ ලේකම්ගේ නියෝජිත

09.කොමදෝරු ඒ. කේ. එම්. ජිනදාස මහතා
නාවික හමුදාපතිගේ නියෝජිත

10.ආචාර්ය පී.බී.ටර්නි ප්‍රදීප් කුමාර මහතා
සාමාන්‍යාධිකාර

## සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ පළාත් කාර්යාල සහ දිස්ත්‍රික් කාර්යාල

**1 බස්නාහිර හා වයඹ පළාත් කාර්යාලය සහ කොළඹ දිස්ත්‍රික් කාර්යාලය**
අංක 758, බේස්ලයින් පාර, කොළඹ 09.
ටෙලි: 011 2687520/011 2690604
ෆැක්ස්:011 2687451/011 4615960

**2 දිස්ත්‍රික් කාර්යාලය–කළුතර දිස්ත්‍රික්කය**
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය,
187,3 වන මහල, ගාලු පාර, බේරුවල.
ටෙලි:034 2298407/071 8100821
ෆැක්ස්: 034 2298407

**3 දකුණු පළාත් කාර්යාලය සහ ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය**
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය,
04, ක්ලෝසන් බර්ග් පාර, මාගල්ල, ගාල්ල.
ටෙලි: 091 2233547/071 8214184
ෆැක්ස්: 091 2233547

**4 දිස්ත්‍රික් කාර්යාලය - මාතර දිස්ත්‍රික්කය**
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය,
18, විල්මට් බාලසූරිය මාවත, නුපේ,මාතර.
ටෙලි: 041-2234250/071 4926849
ෆැක්ස්: 041 2234250

**5 දිස්ත්‍රික් කාර්යාලය– හම්බන්තොටදිස්ත්‍රික්කය**
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය,
අංක 46, දෙවන මහල, පරිපාලන සංකීර්ණය,
සිරිබෝපුර,හම්බන්තොට.
ටෙලි: 047 2256372/071 3624651
ෆැක්ස්: 047 2256372

**6 දිස්ත්‍රික් කාර්යාලය - අම්පාර දිස්ත්‍රික්කය**
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය,
ප්‍රාදේශිය සභා ගොඩනැඟිල්ල, ග්‍රාමසභා මාවත,
තම්බිලුවිල්
ටෙලි: 067 2265416/ෆැක්ස්: 067 2265416

**7 නැගෙනහිර පළාත් කාර්යාලය සහ දිස්ත්‍රික් කාර්යාලය –ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය,
4 කණුව, ත්‍රිකුණාමලය.
ටෙලි:026 2050805/071 8383363
ෆැක්ස්: 026 2050805

**8 දිස්ත්‍රික් කාර්යාලය - යාපනය දිස්ත්‍රික්කය**
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,යාපනය.
ටෙලි: 021 2212663
ෆැක්ස්: 021 2212663

**9 දිස්ත්‍රික් කාර්යාලය–පුත්තලම දිස්ත්‍රික්කය**
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය,
නුග සෙවන බී කොටස,
වයඹ පළාත් අධිකාරී ගොඩනැගිල්ල,
පම්බල, කාක පල්ලිය .
ටෙලි:031 2222865/071 8099899
ෆැක්ස්: 032 2222865

**10 දිස්ත්‍රික් කාර්යාලය– ගම්පහ දිස්ත්‍රික්කය**
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය,
704/9A, දෙවන කුරන, කොළඹ පාර, මීගමුව.
ටෙලි:031 2228606/071 8325678
**ෆැක්ස්: 031 2228606**

**11 දිස්ත්‍රික් කාර්යාලය - මන්නාරම දිස්ත්‍රික්කය**
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,මන්නාරම
ටෙලි:023 2251758/071 760546
ෆැක්ස්: 023 2251758

**12 දිස්ත්‍රික් කාර්යාලය - මඩකලපුව දිස්ත්‍රික්කය**
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
නො: 03, පිල්ලයාර් කෝවිල් පාර,
පළමු හරස් වීදිය, කල්ලඩි, මඩකලපුව
ටෙලි/ෆැක්ස්:065 2224979

# සභාපතිතුමාගේ පණිවුඩය.

2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ ස්ථාපිත කර ඇති සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය ශ්‍රී ලංකාවේ සමුද්‍රීය කලාපය තුල සමුද්‍ර දූෂණය වැළැක්වීම, අවම කිරීම හා පාලනය කිරීම සඳහා කටයුතු කරනු ලබන නියාමන ආයතනය වේ.

සමුද්‍රීය දූෂණය වැලැක්වීමේ පනත මගින් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය පිහිටුවීමේදී ඉටු කරගැනීමට බලාපොරොත්තු වූ අරමුණු ඉටුකරගැනීම සඳහා අවශ්‍ය නෛතික ප්‍රතිපාදන සකස් කිරීම හා ඒවා කාර්යක්ෂමව හා ඵලදායීව ක්‍රියාවේ යෙදවීම සිදුකිරීම උදෙසා සමුද්‍රීය දූෂණය වැළැක්වීමේ පනතේ 51 වන වගන්තිය යටතේ සකස් කල යුතු රෙගුලාසි වලින් 2016 වර්ෂයේදී සමුද්‍රීය පරිසර ආරක්ෂණ "අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම්" නියෝගයන් නිකුත් කිරීමට හැකියාව ලැබුණි. ඒ අනුව 51 වන වගන්තිය යටතේ මේ වන විට සකස් කරන ලද මුළු රෙගුලාසි සංඛ්‍යාව පහ දක්වා ඉහළ නැංවීමට හැකියාව ලැබුණි.

දේශීය වශයෙන් හා ගෝලීය වශයෙන් සමුද්‍ර පරිසරයට ඇති වී ඇති තර්ජන වලින් එම පරිසරය රැක ගැනීම සඳහා සමාජය තුල කථාබහක් නිර්මාණය කිරීම හා වර්තමානයේ පවතින පාරිසරික ගැටළු හඳුනාගැනීම හා ඒවා නිරවුල් කිරීම සඳහා නව යෝජනා ලබාගැනීම අරමුණු කරගෙන 2016 වසර තුලදී ජාතික සමුද්‍රීය පාරිසරික විද්වත් සමුළුව තෙවන වරට සමුද්‍ර පරිසර ක්ෂේත්‍රයට අදාල සියලුම ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පවත්වන ලදී.

2016 වසර තුලදි අධිකාරියේ කාර්ය මණ්ඩලයේ දීර්ඝකාලීනව පුරප්පාඩු පැවති තනතුරු වන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්), කළමණාකරු (සැලසුම්) , සහකාර කළමණාකරු (නීති), සහකාර කළමණාකරු (සැලසුම්) යන තනතුරු සඳහා නිළධාරීන් කාර්යමණ්ඩලයට බඳවාගැනීමට හැකි වූ අතර සහකාර සමුද්‍ර පරිසර නිළධාරී ඇතුළුව කාර්ය මණ්ඩලයට නව නිළධාරින් 16 ක් බඳවා ගන්නා ලදී. එසේම අධිකාරියට විශාල අඩුපාඩුවක්ව පැවති සැලසුම් අංශය ස්ථාපිත කිරීම වසර තුලදී සිදු වීම සුවිශේෂී ක්‍රියාකාරකම් විය.

ශ්‍රී ලංකාවේ සියලුම වෙරළබඩ දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි අන්තර්ජාතික වෙරළ පවිත්‍රතා දිනයට සමාන්තරව අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව සෑම වසරකම සැප්තැම්බර් මස 03 වන සෙනසුරාදා සිට 04 වන සෙනසුරාදා දක්වා වූ සතියක කාලය " **ජාතික සමුද්‍ර සම්පත් සුරැකීමේ සතිය"** ලෙස නම් කොට ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණි. ඒ අනුව 2016 වසරේ සිට ඉදිරියට සෑම වසරකම සැප්තැම්බර් මස දෙවන සතිය සිට හතරවන සතිය දක්වා සමුද්‍ර පරිසරය හා එහි ආරක්ෂාව අරමුණු කරගෙන ජාතික සමුද්‍ර සම්පත් සුරැකීමේ සතිය ක්‍රියාවට නැංවීමට සිදුවනු ඇත. මෙම ක්‍රියාමාර්ගය මගින් ශ්‍රී ලංකාවේ සමුද්‍ර පරිසරය ආරක්ෂිතව අනාගත පරපුරට හිමිකිරීමේ භාරදූර කාර්යයට විශාල පිටුවහලක් වන බව නියතය.

ඒ අනුව 2016 වසර තුලදී ලංකාව පුරාම ක්‍රියාත්මක කරන වැඩ සටහන් සඳහා සහභාගී වූ සංඛ්‍යාව 5000 කට අධික වේ. මෙම වැඩසටහන සැප්තැම්බර් මස 17 පටන්ගෙන 23 වන දින දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක විය.

අධිකාරියේ මැදිහත් වීම හා මෙහෙයවීම මත ධීවර කර්මාන්තයෙන් ආශ්‍රිත ක්‍රියාකාරකම් මගින් සිදුවන සමුද්‍ර දූෂණය වැළැක්වීම, පාලනය කිරීම හා කළමනාකරණය සඳහා ජාතික උපායමාර්ග සකස් කිරීම සිදුවිය. ඒ අනුව

ඉදිරියේදී ධීවර අමාත්‍යාංශය හා ධීවර දෙපාර්තමේන්තුව, ධීවර වරාය නීතිගත සංස්ථාව සමග එක්ව යෝජිත උපායමාර්ග ඉදිරියේදී ක්‍රියාවේ යෙදවීමට නියමිතය.

සුපිරිසිදු වෙරළ තීරයක් ලංකාව වටා ඇති කිරීමට ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් යටතේ නියමු ව්‍යාපෘතියක් ලෙස ත්‍රිකුණාමල නගර සභාව සමග එක්ව අපද්‍රව්‍ය මුහුදට ගලායන කාණු පද්ධති ආවරණය කිරීම අධිකාරියේ මුදලින් සිදුකරන ලදී. මෙමගින් එතෙක් සෘජුව මුහුදට ගලා ගිය අපද්‍රව්‍ය එක් රැස් කර විධිමත්ව මුහුදට බැහැරකිරීමේ හැකියාව ලැබුණි. එහිදී උගත් පාඩම්ද සමග මෙම ක්‍රමවේදය ශ්‍රී ලංකාව පුරා සියළුම දිස්ත්‍රික් කාර්යාල මඟින් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට යෝජිතය.

2016 වසර ක්‍රියාකාරී සැලැස්ම අනුව වසර සඳහා වෙන් කළ ප්‍රාග්ධන ප්‍රතිපාදනය වන රුපියල් මිලියන 90 වෙන් රුපියල් මිලියන 86 ක් වසර තුලදී වියදම් කරන ලද අතර භෞතික ප්‍රගතිය 98% ක්ද මූල්‍ය ප්‍රගතිය 96% ක්ද විය.

2016 ජනවාරි මාසය තුලදී ශ්‍රී ලංකා ඛණිජ තෙල් තොග ගබඩා පර්යන්තයට අයත් නලයක් ලුනාව ප්‍රදේශයේදී පුපුරායාම නිසා ලුනාව ප්‍රදේශයට සිදු වූ දැවැන්ත පරිසර හානිය අවම කරගැනීමටත්, පාලනය කරගැනීමටත් අදාල ආශ්‍රිත පාර්ශවයේ සහය ලබාගැනීමට කටයුතු කිරීම මගින් අධිකාරියට හැකියාව ලැබුණි. එසේම ඛණිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමට විරුද්ධව අධිකාරිය විසින් නීතිමය කටයුතු සිදු කරමින් පවතී.

නෞකා වලට අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම් සැලසුම් සඳහා වන නව විද්‍යුත් ක්‍රමවේදය 2016.07.01 දින අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද අතර එමගින් අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ සේවා පහසුකම් සැපයීම් කටයුතු විධිමත් කිරීමත්, අධිකාරිය වෙත අතිරේක ආදායම් උපයාගැනීමටත් හැකියාව ලැබුණි.

2016 වසරේදී අධිකාරිය විසින් සමුද්‍ර දූෂණය වැළැක්වීම, පාලනය හා කළමනාකරණ කටයුතු සඳහා විෂය භාර අමාත්‍ය අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගෙන් ලැබුණු නායකත්වය, මගපෙන්වීම සහ විෂය භාර නියෝජ්‍ය ඇමතිතුමා, , අමාත්‍යංශ ලේකම්තුමාගේ උපදෙස් හා සහයෝගය මෙන්ම අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය, සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සහ කාර්යමණ්ඩලය විශේෂයෙන් සිහිපත් කරනු කැමැත්තෙමි.

රියර් අද්මිරාල් (විශ්‍රාමික) රෝහණ පෙරේරා,
ආර්එස්පි,වීඑස්වී,යුඑස්පී
සභාපති



# දැක්ම

"අනාගත පරපුර සඳහා නිරෝගිමත් වෙරළ සහ සාගර පරිසරයක්."

# මෙහෙවර

"දැනුවත් කිරීම, පර්යේෂණ, මහජන සහභාගිත්වය, ජාතික, කලාපීය හා අන්තර්ජාතික සහයෝගීතාව, ක්ෂණික ක්‍රියාත්මක වීම හා බලාත්මක කිරීම තුලින් වෙරළ සහ සාගර පරිසරයේ භාරකරුවීම."

# 1 ,පසුබිම

## 1.1 හැඳින්වීම

දිවයිනක් ලෙස ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ උපාය මාර්ගික වැදගත් ස්ථානයක පිහිටා ඇත. අන්තර්ජාතික නීතින්ට අනුකූලව ශ්‍රී ලංකාවට එහි ගොඩබිම් ප්‍රදේශය මෙන් අටගුණයක් පමණ විශාල සාගර කලාපයක සම්පත් නෙලා ගැනිමේ අයිතිය හිමිව පවතී. අප රටට අයත් සාගර කලාපය තුළින් පෙර අපර දෙදිග යාකරන අන්තර්ජාතික නෞකා මාර්ගය වැටි ඇත. ශ්‍රී ලංකාවට අයත් සාගර කලාපය ස්භාවික සම්පත් රාශියකින් සමන්විත වන අතර මෙම සම්පත් නාවික ගමනාගමනය හා ගොඩබිමෙහි සිදු කරනු ලබන මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් ක්‍රමයෙන් දූෂණයට ලක් වෙමින් පවති.

ඒ අනුව අපේ සමුදුර සම්පත් දූෂණයෙන් තොරව පවත්වාගෙන යාම සඳහා 1981 වර්ෂයේ අංක 59 දරණ සමුද්‍ර දූෂණය වැලැක්විමේ පනත අනුව සමුද්‍ර දූෂණ වැලැක්විමේ අධිකාරිය ස්ථාපනය කරන ලදී. සමුද්‍ර දූෂණය වැලැක්වීම, අවම කිරිම හා පාලනය සඳහා කටයුතු කිරිම සහ ශ්‍රී ලංකා රජයට අදාල වන සමුද්‍ර දූෂණය පිළිබඳ අන්තර්ජාතික සම්මුතීන් ක්‍රියාත්මක කිරිම උදෙසා අධිකාරිය වෙත පැවරි තිබුණු නෛතික බලතල ශක්තිමත් කිරිමට එවකට පැවති පනත අවලංගු කර 2008 අංක 35 දරණ සමුද්‍ර දූෂණය වැලැක්වීමේ නව පනත සම්මත කරන ලදුව, එය 2009 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක කරන ලදී. මෙම පනත අනුව අධිකාරියේ නාමය සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය වශයෙන් වෙනස් කරන ලදී.

2015 පත්වූ නව රජයේ ඉදිරි දැක්ම අනුව ශ්‍රී ලංකාව නාවික මධ්‍යස්ථානයක් ලෙස දියුණු කිරිම එක් ප්‍රධාන අරමුණක් වේ. මෙම අරමුණ සමඟ ලංකාව වටා නව වරායන් ඉදිකිරිම, තිබෙන වරායන් වැඩිදියුණු කිරිම සිදු වේ. එයට අමතරව සාගර සම්පත් උකහා ගැනිම සඳහා වු වැඩසටහන් සම්පාදනය කරමින් පවති. එම නිසා මෙම සංවර්ධන ක්‍රියාමාර්ග වලින් සිදුවිය හැකි දූෂණය අවම කිරිම සහ එම කර්මාන්තවල තිරසාරභාවය පවත්වාගැනිමට මෙම අධිකාරියේ දායකත්වය ලබාදිය යුතුව පවති.

මේ අනුව මෙම අධිකාරිය සමුද්‍රීය ස්භාවික සම්පත් දූෂණය අවම කිරිම, අඩු කිරිම හා පාලනය කිරිම සඳහා වු ආයතනය ලෙස ඒ සඳහා වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරමින් පවති.

## 1.2 අධිකාරියේ වගකිම් සහ කාර්යභාරයන්

අධිකාරියේ කර්තව්‍ය

(අ) පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද නියෝග ඵලදායී ලෙසත් කාර්යක්ෂම ලෙසත් පරිපාලනය කිරිම සහ ක්‍රියාත්මක කිරීම.

(ආ) ශ්‍රී ලංකා ජල තීරයේ හෝ වෙනත් යම් සමුද්‍ර කලාපවල හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපය තුළ නැව් ආශ්‍රිත කාර්යයන්ගෙන් සහ වෙරළ ආශ්‍රිත සමුද්‍රයට සම්බන්ධ කාර්යයන්ගෙන් දූෂණය විම වැළැක්වීම, අඩු කිරීම, පාලනය කිරීමේ සහ කළමනාකරණ කාර්යය සඳහා වු යෝජනා ක්‍රමයක් සකස් කිරීම සහ ක්‍රියාවේ යෙදවීම.

(ඇ) ශ්‍රී ලංකා ජල තීරයේ හෝ වෙනත් යම් සමුද්‍ර කලාපවල හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපය තුළ නැව් ආශ්‍රිත යම් කටයුත්තකින් හෝ වෙරළ ආශ්‍රිත සමුද්‍රයට

සම්බන්ධ යම් කටයුත්තකින් උද්ගත වන දූෂණයවීම වැලැක්වීමේ, අවම කිරීමේ, පාලනය කිරීමේ හෝ කළමනාකරණය කිරීමේ කාර්ය සඳහා වෙනත් දෙපාර්තමේන්තු, නියෝජ්‍යායතන සහ රජයේ සහ පෞද්ගලික ආයතන සමඟ සහයෝගීතාවයෙන් පර්යේෂණ පැවැත්වීම.

(ඈ) ශ්‍රී ලංකා ජල තීරයේ හෝ වෙනත් යම් සමුද්‍ර කලාපවල හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපයේ යම් තෙල්, හානිකර ද්‍රව්‍ය කිසිවක් හෝ වෙනත් යම් දූෂයකයකින් දූෂණය විම මඟහරවා කළමනාකරණය කිරීමට, සුරක්ෂිත කිරීමට හා ආරක්ෂා කිරීමට පියවර ගැනීම.

(ඉ) යම් තෙල් වර්ග, හානිකර ද්‍රව්‍ය හෝ වෙනත් යම් දූෂක ද්‍රව්‍යයක් සඳහා ප්‍රමාණවත් සහ යෝග්‍ය ප්‍රතිග්‍රහන පහසුකම් සැලසීම.

(ඊ) ශ්‍රී ලංකා රජය විසින් ස්ථිර කිරීම, පිළිගැනීම, එකඟවීම හෝ අනුමත කිරීම සිදුකර ඇති හෝ සිදු කරනු ලැබිය හැකි සමුද්‍ර දූෂණය සම්බන්ධය සියලු ජාත්‍යන්තර සම්මුතීන් සහ අදාල ප්‍රොටෝකෝල පිළිගැනිම හා නිර්දේශ කිරීම.

(උ) ජාතික තෙල් දූෂණ හදිසි සැලැස්මක් සකස් කොට ක්‍රියාත්මක කීරීම.

(ඌ) ඛණිජතෙල් හෝ ආශ්‍රිත ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ස්භාවික සම්පත් ගවේෂණය කිරීමේ හෝ එහි යෙදී සිටින කොන්ත්‍රාත්කරුවන්, සේවා උපකොන්ත්‍රාත්කරුවන් සහ වෙනත් තැනැත්තන්ගේ ක්‍රියාකාරීත්වය අධීක්ෂණය කිරිම, විධිමත් කිරීම සහ පරික්ෂා කිරීම.

(එ) සමුද්‍රීය පරිසරය ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ විවිධ ප්‍රජා කණ්ඩායම් අතර දැනුවත් බව ඇති කිරීම.

(ඒ) ඉහතින් වු කාර්යයන් සියල්ල හෝ යම් කාර්යයක් ඉටු කිරිම සඳහා අවශ්‍ය වන්නා වු වෙනත් යම් සියලු ක්‍රියා හා දේ සිදුකිරීම.

## අධිකාරියේ බලතල

(අ) නැව් ආශ්‍රිත යම් කටයුත්තකින් හෝ වෙරළ ආශ්‍රිත සමුද්‍රයට සම්බන්ධ යම් කටයුත්තකින් උද්ගත වන යම් දූෂණයකින් ශ්‍රී ලංකා ජල තීරය හෝ වෙනත් යම් සමුද්‍ර කලාප හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපය ඵලදායී ලෙස සුරක්ෂිත කිරීම සහ ආරක්ෂා කිරීම.

(ආ) යම් නැව් ආශ්‍රිත ක්‍රියාකාරකම්වලින් හෝ වෙරළ ආශ්‍රිත සමුද්‍රයට සම්බන්ධ යම් කටයුත්තකින් උද්ගත වන යම් දූෂණයක් සම්බන්ධයෙන් පරීක්ෂණ සහ විමසීම් පැවැත්වීම සහ නඩු පැවරීම.

(ඇ) දූෂණය වැළැක්විමේ කාර්ය සඳහා, ශ්‍රී ලංකා ජල තීරය තුළ සහ වෙනත් යම් සමුද්‍ර කලාප හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපය තුළ පවත්වාගෙන යන මුහුදු තෙල් ප්‍රවාහන කටයුතු හා බංකරින් මෙහෙයුම් සියල්ල පාලනය කිරීම.

(ඈ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කරගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, මඩපනය කිරිම සහ විකිණිම හෝ අන්‍යාකාරයෙන් බැහැර කිරීම.

(ඉ) අධිකාරියේ කර්තව්‍යයන් ඉටුකිරීමේ දී අවශ්‍ය විය හැකි යම් නිලධරයන් හා සේවකයන් සේවයෙහි නියුක්ත කරවීම.

(ඊ) අධිකාරියේ කර්තව්‍යයන් ඉටුකිරීම සඳහා අවශ්‍ය වන සියලුම ගිවිසුම්වලට කෙලින්ම හෝ තත්කාර්යය සඳහා අධිකාරිය විසින් බලය පවරන ලද යම් නිලධරයකු හෝ නියෝජිතයෙකු මඟින් එළඹීම සහ ඉටු කිරීම.

(උ) පනත යටතේ අධිකාරියට පවරන ලද බලතල සියල්ල හෝ ඉන් කිසිවක් පැවරීම සඳහා

නාමයෙන් හෝ තනතුරින් යම් තැනැත්තෙකු පත් කිරීම.

(ඍ) මණ්ඩලය විසින් අනුමත කරන ලද යම් බැංකුවක හෝ මූල්‍යායතනයක ගිණුම් විවෘත කර ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම.

(එ) අධිකාරියේ කර්තව්‍යයන් ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි මුදල් ප්‍රමාණය ණයට ගැනීම.

(ඒ) චංචල හා නිශ්චල දේපළ යන දෙයාකාරයෙන් ශ්‍රී ලංකාවේ හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් ලැබෙන ප්‍රදාන, පරිත්‍යාග සහ රික්තවරණ පිළිගැනීම හා ලබා ගැනීම සහ අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා ඒවා යොදා ගැනීම.

(ඔ) අධිකාරියේ කටයුතු කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම.

(ඕ) අධිකාරිය මඟින් සපයනු ලබන යම් සේවාවක් සඳහා යම් තැනැත්තෙකුගෙන් හෝ පුද්ගල මණ්ඩලයකින් ගාස්තු අය කිරීම.

(ක) ශ්‍රී ලංකාවේ වරායවලට පැමිණෙන සියලු නැව්වලින් අධිකාරිය විසින් සපයනු ලබන සේවාවන් සම්බන්ධයෙන් ගාස්තු හෝ අයකිරීම් අයකර ගැනීම සහ,

(ග) අධිකාරියේ කර්තව්‍යයන් නියමාකාරයෙන් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ හෝ මේ පනතේ නිශ්චිත ලෙස සඳහන් බලතල කිසිවකට ආනුෂංගික වන්නා වූ හෝ අන්‍යාකාරයකින් අධිකාරිය මත පවරන ලද්දා වූ හෝ භාර කරන ලද්දා වූ වෙනත් සියලු ක්‍රියා හෝ දේ කිරීම.

# 2.පාලන වාර්තාව

**2008 අංක 35** දරණ සමුද්‍ර දූෂණ වැලැක්වීමේ පනතේ අරමුණු පෙරදැරි කරගෙන සකස් කරන ලද 2012-2016 සංයුක්ත සැලැස්ම හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම තුළින් අපේක්ෂිත අරමුණු ලඟාකර ගැනීම සඳහා අධිකාරියේ මෙහෙයුම් කටයුතු සඳහා මඟපෙන්වීම හා ඒවා අධික්ෂණය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකරන ලදී. යහපාලන මූලධර්ම අනුගමනය කිරීම මඟින් ආශ්‍රිත පාර්ශවයන් සඳහා දිර්ඝ කාලීන ප්‍රතිලාභ ලබාදීමටත්, අධිකාරිය නිසි පරිදි පවත්වාගෙන යාමටත් උපකාරී වන බව අධ්‍යක්ෂ මණ්ඩලය වැඩිදුරටත් විශ්වාස කරයි. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයට සාමාජිකයන් දසදෙනෙකු ඇතුළත් වේ.

පාලන වාර්තාව මඟින් අධිකාරියේ සාංගමික පාලන ක්‍රියාවලිය හා සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරකම් ශ්‍රි ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් හඳුන්වාදී ඇති යහපාලනය සඳහා මාර්ගෝපදේශන සංග්‍රහයේ සහ භාණ්ඩාගාරය සහ අනෙකුත් අදාල අධිකාරින් විසින් නිකුත් කර ඇති අනෙකුත් පාලන මූලධර්ම අවශ්‍යතා අනුව සකස් කර ඇත.

සාංගමික පාලන මූලධර්ම වගකීමෙන් හා විනිවිදභාවයකින් යුක්තව අනුගමනය කරන බව තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය කරන අභ්‍යන්තර පාලන ක්‍රම වැඩිදියුණු කිරීම කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය නිරන්තරයෙන් යොමු විය. අභ්‍යන්තර පාලන ව්‍යුහය අධ්‍යක්ෂ මණ්ඩලය හා එහි උප කමිටුව වන විගණන කළමනාකරණ කමිටුව හා සුදුසුකම් සහිත ඉහළ කළමනාකරණ මණ්ඩලයකින් යුක්ත වේ. පහත පෙන්වා දි ඇති සාංගමික පාලන ව්‍යුහය මඟින් අභ්‍යන්තර පාලන ඒකක ප්‍රතිසංවිධාන ක්‍රියාවලින් හා ක්‍රමවේද හරහා ඵලදායිව භාවිතා කරන ආකාරය දක්වා ඇත.

**2.1 අධ්‍යක්ෂ මණ්ඩල වගකීම හා කාර්යභාරය**

සමුද්‍ර දූෂණ වැලැක්වීමේ පනතේ දක්වා ඇති අරමුණු ඉටුකර ගැනීම සඳහා තමන් තුළ වූ කුසලතා හා තීරණ ගැනීමේ හැකියාවන් උපරිම වශයෙන් ප්‍රතිපත්ති සම්පාදනයේදී හා ඇගයීමේදි භාවිතා කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන වගකීමක් වේ. දිර්ඝ කාලීන අරමුණු ලඟාකර ගැනීම හා ඊට අදාල ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරයයි. මෙම ක්‍රියාකාරකම් ඉටුකිරීමේදි අවශ්‍ය අවස්ථාවේ ක්ෂේත්‍රයේ ප්‍රවීනයන්ගෙන් තාක්ෂණික හා උපදේශන සේවා ලබාගැනීමට ද සිදුවිය.

2016 වසර තුළදී සකස් කරන ලද අධිකාරියේ සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම හා අයවැය ඇස්තමේන්තුව මඟින් ලගාකර ගැනීමට අපේක්ෂිත ඉලක්ක ලඟාකර ගැනීම සඳහා යහපාලන මූලධර්ම භාවිතා කරමින් කටයුතු කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම විය.

ඵලදායී හා කාර්යක්ෂම ලෙස කළමනාකරණ හා මෙහෙයුම් කටයුතු ඉටුකිරීම සඳහා ස්වාධින ව විමසුම් කිරීම හා අධීක්ෂණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපකමිටුවක් ලෙස විගණන හා කළමනාකරණ කමිටුව පත්කර ඇත. මෙම කමිටුව මූලික වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ. විගණන හා කළමනාකරණ කමිටුවේ වගකීම හා කාර්යභාරය මෙම වාර්තාවට ඇතුළත් කර ඇත.

## 2.2 අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය


**2016.12.31** දිනට අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය අධ්‍යක්ෂවරුන් **10** දෙනෙකි. එයින් **8** දෙනෙකු විධායක නොවන අධ්‍යක්ෂවරුන් වන අතර සභාපති හා සාමාන්‍යාධිකාරී පමණක් විධායක අධ්‍යක්ෂවරුන් ලෙස කටයුතු කරනු ලබයි.

රියර් අද්මිරාල් රෝහණ පෙරේරා මහතා සභාපතිවරයා වශයෙන් 2016.01.05 සිට කටයුතු කල අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු ක්‍රමානුකූලව සිදුකිරීමට හා මනාව පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් හා මඟපෙන්වීම් ඔහු විසින් සලස්වන ලදී.

විධායක හා විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය **2008** අංක **35** දරණ සමුද්‍ර දූෂණ වැලැක්වීමේ පනතේ දක්වා ඇති ප්‍රතිපාදන වලට අනුකූලව වසර තුළදී පවත්වාගෙන යන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් **6** දෙනෙකුම ප්‍රධාන අමාත්‍යංශ හතරක හා නාවික හමුදාපති, අධ්‍යක්ෂ ජෙනරාල්, වෙළඳ නෞකා දෙපාර්තමේන්තුව නියෝජනය කරනු ලබයි. ඒ අනුව අධිකාරියට අයත් සියලුම විෂය පරාසයන් ආවරණය වන පරිදි විධායක නොවන අධ්‍යක්ෂවරුන් පත්ව ඇති අතර එම ආයතන අතර සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීමේදී මෙම විධායක නොවන අධ්‍යක්ෂවරු සුවිශාල කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

## 2.3 අධ්‍යක්ෂ මණ්ඩල පත්කිරීම හා විශ්‍රාමයාම්

සමාලෝචිත **2016** මූල්‍ය වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල එක් පත්කිරීමක් සිදුකරන ලද අතර එක් විශ්‍රාම ගැනීමක් සිදු වී ඇත.



රූප සටහන් 01

## 2.3 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

**2016** වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 13 ක් පවත්වා ඇත. වඩාත් ඵලදායී හා කාර්යක්ෂම තීරණ ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා හා අවශ්‍ය කරන අනෙකුත් තොරතුරු කල්වේලා ඇතිව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යැවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

## 2.4 අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ නීති කළමනාකරු අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් වශයෙන් කටයුතු කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේඛණ පවත්වාගෙන යාමට අමතරව යහපාලන මූලධර්ම, නෛතික අවශ්‍යතා අනුගතවෙමින් වඩාත් කාර්යක්ෂමව හා කළමනාකරණය කරගනිමින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අවශ්‍ය කරන තොරතුරු කාලීනව හා නිවැරදිව සැපයීම අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් සිදු කරන ලදී.

# 2016 වර්ෂය තුළ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පිළිබඳ වාර්තා

| | නම | අධ්‍යක්ෂ මණ්ඩලයේ දරන තනතුර | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් |
|---|---|---|---|
| 01 | රියර් අද්මිරාල් රෝහණ පෙරේරා | සභාපති (ඇමතිතුමා විසින් පත්කල සාමාජික)- විධායක අධ්‍යක්ෂ | 13/13 |
| 02 | ආචාර්ය පී. බී. ටර්නි ප්‍රදීප් කුමාර මහතා | සාමාන්‍යාධිකාරී විධායක අධ්‍යක්ෂ | 12/13 |
| 03 | ආර්.ඒ.ආර්.ආර්.රූපසිංහ මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 08/13 |
| 04 | ඒ.ඩබ්. සෙනවිරත්න මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 07/13 |
| 05 | එන්. පරණවිතාන (වසර තුළදී විශ්‍රාම ගන්නා ලදී) | විධායක නොවන අධ්‍යක්ෂ | 03/13 |
| 06 | එන්. එල්. එම්. බී. ලියනගේ මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 09/13 |
| 07 | එම්. අනෝමා නන්දනී මිය | විධායක නොවන අධ්‍යක්ෂ | 10/13 |
| 08 | මහේන්ද්‍ර පෙරේරා | විධායක නොවන අධ්‍යක්ෂ | 09/13 |
| 09 | පොෂිත පෙරේරා | විධායක නොවන අධ්‍යක්ෂ | 05/13 |
| 10 | සේපාලිකා වික්‍රමසිංහ | විධායක නොවන අධ්‍යක්ෂ | 06/13 |
| 11 | කොමාදෝරු ඒ. කේ. එම්. ජිනදාස (එන්.පරණවිතාන මහතා වෙනුවට පත් කරන ලදී) | විධායක නොවන අධ්‍යක්ෂ | 09/13 |

# 3.විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

විගණන හා කළමනාකරණ කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරු තුන්දෙනෙකුගෙන් සමන්විත වේ. එහි සභාපතිත්වය හා භාණ්ඩාගාරය නියෝජනය කරනු ලබන එම්. අනෝමා නන්දනී මහත්මිය විසින් දරනු ලැබීය. පරිසර අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ආර්.ආර්.ඒ.ආර්.රූපසිංහ හා එන්.එල්.එම්.බී. ලියනගේ යන මහත්වරුන් සෙසු කමිටු සාමාජිකයන් විය. ඊට අමතරව විගණකාධිපති දෙපාර්තමේනතුවේ පරිසර අමාත්‍යාංශයභාර විගණන අධිකාරී සහ පරිසර අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක,ප්‍රධාන නිරීක්ෂකයන් ලෙස කමිටු රැස්වීම් වලට සහභාගී විය. විගණන හා කළමනාකරණ කමිටුවේ කැඳවීම මත සාමාන්‍යාධිකාරී සහ ගණකාධිකාරී සහ අනෙකුත් අදාල තනතුරු දරණ නිලධාරීන් අවශ්‍ය අවස්ථාවලදී කමිටුව ඉදිරියේ පෙනී සිටිමින් අදාල කරුණු පැහැදිලි කිරීම් සිදුකරන ලදී.

අභ්‍යන්තර විගණන කටයුතු අභ්‍යන්තර විගණන අංශය විසින් සිදුකරන ලදී. විගණනයේ විෂය පථය විශේෂයෙන් අවධානය යොමුකල යුතු මෙහෙයුම්,මූල්‍ය,පරිපාලන හා නීති අංශ ආවරණය වන පරිදි වසර තුළ ක්‍රියාත්මක වන ආකාරයට සැලසුම් කර ඇත. ඊට අමතරව විගණකාධිපති දෙපාර්තමේන්තුව මඟින් මූල්‍ය ප්‍රකාශන විගණනයට සාමාන්තරව මෙහෙයුම්,පරිපාලන හා මූල්‍ය අංශවල දුර්වලතා හා අභ්‍යන්තර පාලන ක්‍රමවල පවත්නා අඩුපාඩු ඇගයීමට ලක් කරන ලදී.

අභ්‍යන්තර විගණන වාර්තාව සම්බන්ධයෙන් කළමනාකරණය සමඟ සාකච්ඡා කර අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකිරීමට ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලැබීය. අධිකාරියේ අභ්‍යන්තර චක්‍රලේඛ, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය හා අනෙකුත් රෙගුලාසිවල දක්වා ඇති පරිදි අධිකාරියේ කටයුතු සිදු කරනු ලබන බවට තහවුරුවක් ලබාගැනීම සඳහා විගණනය සැලසුම් කොට ක්‍රියාත්මක කරනු ලැබීය. මෙහිදී අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම්, අධිකාරියේ වත්කම් ආරක්ෂා කිරීම හා නඩත්තුව, ප්‍රමාණවත් පරිදි දුවශීලතාවය පවත්වාගෙන යාම ඇතුළු සියලුම මූල්‍ය,පරිපාලන හා මෙහෙයුම් ක්‍රියාකාරකම් විගණනයට භාජනය විය. විගණන හා කළමනාකරණ කමිටුව විසින් ගණකාධිකාරීවරයා විසින් සකස් කර ඉදිරිපත් කරනු ලැබූ මූල්‍ය ප්‍රගති වාර්තා පරික්ෂා කර බලා ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සභාපතිතුමා හා සාමාන්‍යාධිකාරීතුමා වෙත අවශ්‍ය කරන නිර්දේශ ලබාදෙන ලදී.

විගණන හා කළමනාකරණ කමිටුව විසින් රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම හා ඔවුන්ගේ නීරික්ෂණ, නිගමන හා නිර්දේශ සම්බන්ධයෙන් විගණන හා කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කරන ලදී. ඊට අතිරේකව විගණන හා කළමනාකරණ කමිටුව විසින් අභ්‍යන්තර විගණන වාර්තා වලින් අනාවරණය කරගත් කරුණු හා විගණන ක්‍රමවේදවල ඵලදායීතාවය ඇගයීමට ලක්කල අතර එහිදී අඩුපාඩු අවම කරගැනීමට අවශ්‍ය කරන උපදෙස් හා මඟපෙන්වීම් අභ්‍යන්තර විගණන අංශයට ලබාදෙන ලදී. වසර තුළදී විගණන හා කළමනාකරණ කමිටුව තුන්වතාවක් රැස්වීම් සිදුකරන ලදී.

## 2016 වර්ෂය තුළ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ විගණන හා කළමනාකරණ රැස්වීම් පිළිබඳ වාර්තා

| | නම | විගණන හා කළමනාකරණ කමිටුව | විගණන හා කළමනාකරණ රැස්වීම් |
|---|---|---|---|
| 01 | එම්.අනෝමා නන්දනී මහත්මිය | සභාපති | 04/05 |
| 02 | එන්.එල්.එම්.බී. ලියනගේ මහතා | සාමාජික | 01/05 |
| 03 | ආර්.ආර්.ඒ.ආර්.රූපසිංහ මහතා | සාමාජික | 04/05 |
| 05 | එල්.ඩී.එන්.කුමාරසිරි මහතා | නිරීක්ෂක - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | 05/05 |
| 06 | කේ. කේ. එස්.ජයකොඩි මහතා | නිරීක්ෂක - විගණකාධිපති දෙපාර්තමේන්තුව | 05/05 |

# 4. මෙහෙයුම් ක්‍රියාකරකම් පිළිබඳ සමාලෝචනය

## 1. සමුද්‍ර දූෂණය අවම කිරීම

### 1.1 හදිසි තෙල් විසිරීමකදී ක්‍රියාත්මක ජාතික සැලැස්ම (NOSCOP) ක්‍රියාත්මක කිරීම හා යාවත්කාලීන කිරීම.

#### 1.1.1 පලාත් මට්ටමේ වැඩසටහන්

ශ්‍රී ලංකා ජල තීරයේ තෙල් විසිරීම හේතුවෙන් සිදු විය හැකි සමුද්‍ර දූෂණය වැලැක්වීම හා අවම කිරීම සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් හදිසි තෙල් විසිරීමකදී ක්‍රියාත්මක ජාතික සැලැස්ම ක්‍රියාවේ යොදවනු ලබයි. ඒ පිළිබඳ ව දැනුවත් කිරීම සඳහා පළාත් මට්ටමේ වැඩමුළු 2 ක් 2016 වසර තුළ පවත්වන ලදි. පළමු පුහුණු වැඩමුළුව 2016 මැයි 26 හා 27 දින උණවටුන දී හා ගාලු වරායේදී පැවත්වුණු අතර දෙවන වැඩමුළුව 2016 ජුලි 07 හා 08 දින වල ත්‍රිකුණාමලය වරාය ආශ්‍රිතව පැවැත්විණි.

#### 1.1.2 ජාතික මට්ටමේ වැඩසටහන්

අගෝස්තු 09 වන දින ශ්‍රී ලංකා බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රයේදී හදිසි තෙල් විසිරීමකදී ක්‍රියාත්මක වීම පිළිබඳ සැලැස්ම යාවත්කාලීන කිරීම පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී. මෙහිදී මෙම සැලැස්මට රසායන ද්‍රව්‍ය විසිරීමකදී ප්‍රතිචාර දැක්වීමට අදාළව විවිධ ආයතනයන්ට ඇති වගකීම් සංශෝධනය කිරීමද නව වගකීම ඇතුලත් කිරීමද වෙනත් වගකිව යුතු ආයතනයන්හි නම් ඇතුලත් කිරීමද සිදු කරන ලදී. මේ සඳහා සැලැස්මේ වගකිව යුතු ආයතන වල සාමාජිකයන්ද සහභාගි විය.







වැඩමුළුවේ විවිධ අවස්ථා

තෙල් විසිරීමකදී අදාළ ආයතනවල පළමු ප්‍රතිචාර දැක්වීමේ හැකියාව වර්ධනය හා එවැනි සිදුවීම් උද්ගත වීමකදී මෙහෙයුම් කටයුතුවලට සහභාගී වන නිළධාරීන් පුහුණු කිරීම යන අරමුණු පෙරදැරි කරගෙන අගෝස්තු මස 31 හා සැප්තැම්බර් මස 01 වන දින පුහුණු වැඩමුළුවක් ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පැවැතිවිය. එයට අදාළ ප්‍රායෝගික පුහුණුවක් දික්ඕවිට ධීවර වරායේදී සැප්තැම්බර් මස 02 වන දින පැවැත්විණි. තෙල් විසිරීමකදී සිදු විය හැකි දූෂණය අවම කිරීම කෙරෙහි ඉක්මනින් නිවැරදිව ප්‍රතිචාර දැක්වීම සෘජුවම බලපායි. ඒ

සඳහා අදාල පාර්ශවකරුවන් පුහුණු කිරීම ඉතා වැදගත් වේ.


ඒ අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා යුධ හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකාව ගුවන් හමුදාව, ශ්‍රී ලංකා පොලීසිය, ශ්‍රී ලංකා වෙරළාරක්ෂක බලකාය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඛනිජතෙල් ගබඩා පර්යන්තය, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන ආයතනය, ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශය, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව හා කොළඹ නැව් තටාකාංගනය යන ආයතන සමඟ එක්ව, දෙසැම්බර් මස 09 සහ 10 යන දෙදින පුරා හදිසි තෙල් විසිරීමකදී ක්‍රියාත්මක වීම පිළිබඳ පෙර පුහුණු වැඩසටහනක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේහිදී හා දික්ඕවිට ධීවර වරාය ආශ්‍රිතවද පවත් වන ලදී.



ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේහිදී පවත් වන ලද පෙරහුරුවේ අවස්ථා




ප්‍රායෝගික පෙරහුරුවේ වෙරළ ආශ්‍රිතව



මෙහිදී මෙවන් සිද්ධිවලට ප්‍රතිචාර දැක්වීමට ජාතික තෙල් විසිරුමකදී ප්‍රතිචාර දැක්වීම පිළිබඳ සැලැස්මෙහි ඇති කාර්යය පටිපාටිය අධ්‍යයනය ද මෙවැනි අවස්ථාවකදී මුහුණ දීමට අදාළ ආයතනවලට ඇති ශක්‍යතාවය ද (සිද්ධි විධාන පද්ධතිය පිළිබඳ සිද්ධි කළමනාකරණ කණ්ඩායමේ සාමාජිකයන්ගේ මෙවැනි අනපේක්ෂිත සිදුවීම්වලට මුහුණ දීමේ ඇති අවබෝධය සහතික කිරීමද හදිසි අවස්ථාවලදී ක්‍රියාත්මක වීම, සන්නිවේදනය කිරීම සහ අදාළ කාර්යයන්හි යෙදීමේ හැකියාව පිළිබඳවද) අධ්‍යයනය කරන ලදී.





ගුවනේදී ගන්නා ලද ඡායාරූප

දිස්ත්‍රික්ක මට්ටමෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි හදිසි තෙල් විසිරීමකදී ක්‍රියාත්මක වීම සඳහාත් හදිසි තෙල් විසිරීමකදී ක්‍රියාත්මක ජාතික සැලැස්ම යාවත්කාලීන කිරීම සඳහාත් දැනුවත් කිරීමේ වැඩසටහන් පහත පරිදි සිදු කරන ලදී.

**වගුව. 1 හදිසි තෙල් විසිරීමකදී ක්‍රියාත්මක වීම සඳහා 2016 තුළ දිස්ත්‍රික්ක මට්ටමින් පවත්වන ලද දැනුම්වත් කිරීමේ වැඩසටහන් පිළිබඳ විස්තර**

| දිස්ත්‍රික්කය | දිනය | ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය |
|---|---|---|
| ගම්පහ | 2016/03/04 | මීගමුව |
| | 2016/03/11 | වත්තල |
| පුත්තලම | 2016/06/01 | වෙන්නප්පුව |
| | 2016/06/24 | හලාවත |
| | 2016/11/09 | කල්පිටිය |
| කළුතර | 2016/08/23 | බේරුවල |
| | 2016/08/31 | පානදුර |
| | 2016/09/07 | කළුතර |
| ගාල්ල | 2016/04/07 | ගාල්ල |
| | 2016/05/11 | බෙන්තර |

## 1.2 හදිසි තෙල් විසිරීම් සඳහා ප්‍රතිචාර දැක්වීම

මුහුදේ හා ගොඩබිම ගංගා ආශ්‍රිතව සිදු වන තෙල් විසිරීම් හේතුවෙන් සමුද්‍ර පරිසරයට මෙන්ම භෞමික පරිසරයටද හානි සිදු වේ. එබැවින් 2016 වසර පුරා එවැනි තෙල් විසිරීම් රාශියක් මඟින් සිදුවීමට ගිය පරිසර හානිය අවම කිරීමට අනෙකුත් ආයතනවල සහයෝගය ලබා ගනිමින් අප අධිකාරිය ක්‍රියාත්මක විය.

**වගුව. 2 2016 වසර තෙල් මඟින් සිදු විය හැකි දූෂණ අවම කිරීමට සිදු කළ මෙහෙයුම්**

| දිනය | ස්ථානය හා සිදුවීම | හානිය |
|---|---|---|
| 2015 දෙසැම්බර් 31 සිට 2016 ජනවාරි 05 දින දක්වා | මුතුරාජවෙල ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්තයට අයත් තෙල් නලයකින් තෙල් කාන්දු වීම. | • ගුවන් යානා තෙල් ටොන් 22 ක් ලුනාව කළපුවට එකතු නිසා කළපු ජලය සහ කඩොලාන ප්‍රදේශ දූෂණය වීම.<br>• ජලජ සතුන් බොහෝමයක් මිය යාම.<br>• කඩොලාන ශාකවලට මාරාන්තික හානි සිදු වීම.<br>• 2016 ජනවාරි 05 වන දින දක්වා, දින 06ක් තෙල් ඉවත් කිරීමේ මෙහෙයුම දියත් කිරීමට සිදු වීම. |
| 2016 ජනවාරි 16 | අකුරැස්ස ප්‍රදේශයේ තෙල් පිරවුම් හලක තෙල් ගබඩාවෙන් තෙල් කාන්දු වීම. | • තෙල් ලීටර 11,333 ක් පමණ කාන්දු වීමෙන් නිල්වලා ගඟ දූෂණයකට ලක් වීම. |
| 2016 මාර්තු 24 | පොල් තෙල් ප්‍රවාහනය කරමින් තිබූ බවුසරයක් කළුතර වෙට්ටුමකඩ ස්ථානයේදී අනතුරකට ලක්වීම. | • කළු ගං කළපුව දූෂණයකට ලක් වීම. |
| 2016 මැයි 05 | මිරිස්ස මුහුදේ ධීවර බෝට්ටුවකින් තෙල් කාන්දුවක් සිදු වීම. | • ඩීසල් තෙල් ලීටර් 15ක් සාගරය එකතු වීම. කුඩා තෙල් ප්‍රමාණයක් බැවින් වූ හානිය අවම වූ අතර ඉක්මණින් ඉවත් කළ හැකි විය. |
| 2016 මැයි 23 | ඔරුගොඩවත්ත ප්‍රදේශයේ තෙල් ටැංකිවලින් තෙල් කාන්දු වීම. | • එම ප්‍රදේශය ආශ්‍රිතව අධික වර්ෂාව හේතුවෙන් ජල ගැලීම් තත්ත්වයක් ඇති වී තිබූ බැවින් නිවාස කිහිපයකට තෙල් ගලා යාම. |
| 2016 සැප්තැම්බර් 02 | කොළඹ වරායෙහි දී MT LMS Laxapana නැවට තෙල් පැටවීමේ දී සිදු වූ තෙල් කාන්දුවීම | • තෙල් මෙට්‍රික් ටොන් 2ක් පමණ මුහුදට එක් වීමෙන් නැව් අවට වරාය ප්‍රදේශයේ මුහුදු ප්‍රදේශය දූෂණයට ලක් වීම. |

මෙම තෙල් විසිරීම්වලට අමතරව කොළඹ වරායේ පිටත මුහුදේ පිහිටි තෙල් සැපයුම් බෝයාවේ කුඩා පරිමාණයේ තෙල් කාන්දුවීම් 2ක් ද 2016 වර්ෂය තුළ සිදු වූ අතර ඒ සඳහා පිළියම් යෙදීමට අප ආයතනය මැදිහත් විය. ඉහත මෙහෙයුම් සාර්ථකව සිදු කර සිදු වීමට ගිය දූෂණ තත්ත්වය අවම කිරීමට හැකි විය.


## 1.3 හෝටල් හා කර්මාන්තශාලා වලින් අපජලය මුහුදට එකතුවීම පාලනය

සමුද්‍රය වෙත අපද්‍රව්‍ය බැහැර කිරීම අවම කිරීම හා බැහැර කරන අපද්‍රව්‍ය පිරිපහදු කිරීමෙන් පමණක් බැහැර කිරීම දිරිගැන්වීමේ අරමුණින් 2008 අංක 35 දරණ සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතට අනුකූලව නිකුත් කරන ලද සමුද්‍රීය පාරිසරික ආරක්ෂණ (මුහුදට ඉවත දැමීම සඳහා අවසර පත් නිකුත් කිරීම ) නියෝග අංක 01/2013 ලෙසින් ප්‍රකාශිත රෙගුලාසි 2013 වසරේ සිට ක්‍රියාවට නංවන ලදී.

මේ අනුව සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සියලුම ප්‍රාදේශීය කාර්යාල හරහා පිරිපහදු කරන ලද අපජලය බැහැර කිරීමේ බලපත්‍ර වලට අදාල අයදුම්පත්‍ර නිකුත් කරනු ලබයි.ප්‍රාදේශීය කාර්යාල හරහා ප්‍රධාන කාර්යාලය වෙත ලැබෙන අයදුම්පත්‍ර නිසි ඇගයීමට ලක්කිරීමෙන් අනතුරුව බලපත්‍ර නිකුත්කිරීමට කටයුතු කරනු ලබයි.

වෙරළ කලාපය තුල පිහිටි හෝටල් /කර්මාන්තශාලා මඟින් වෙරළ කලාපයට හෝ සාගරයට මුදාහරිනු ලබන අපජලය හා අපද්‍රව්‍ය සඳහා බලපත්‍ර නිකුත් කිරීමට අමතරව අධිකරණ නියෝග මඟින් රාජසන්තක කරනු ලබන නඩු භාණ්ඩ ගැඹුරු මුහුදේ ගිල්වා විනාශකිරීම සඳහා ද මෙමබලපත්‍රය නිකුත් කරනු ලබයි.

2016 වර්ෂය සඳහා සමුද්‍රීය පාරිසරික ආරක්ෂණ මුහුදට ඉවත දැමීම සඳහා අවසර පත් බලපත්‍ර 95 නිකුත් කර ඇත ඇති අතර එය 2015 වර්ෂයට සාපේක්ෂව 63 % ක වර්ධනයකි. එම බලපත්‍ර නිකුත් කිරීමෙන් 2016 වර්ෂයේ රුපියල් මිලියන 2.4 ක ආදායමක් ලබා ඇති අතර එය 2015 වර්ෂයට සාපේක්ෂව තුන්ගුණයක වැඩිවීමකි.




## 1.4 නෞකාවල ජනනය වන අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ සේවාව

නැව් ගමනාගමනය අතරතුර දී ජනනය වන අපද්‍රව්‍ය මුහුදට එකතුවීම මඟින් සමුද්‍ර දූෂණය වීමට හැකියාවක් ඇති බැවින් ශ්‍රී ලංකාවේ වරායන්ට පැමිණෙන නැව් වලට අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ සේවාවක් සැපයීම මඟින් එම දූෂණය අවම කිරීමට සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය ක්‍රියාකරයි. මේ සඳහා වාර්ෂිකව සේවා සපයන්නන් ලියාපදිංචි කරන අතර 2016 වසර සඳහා සේවා සපයන ආයතන 23 ක් ලියාපදිංචි කරන ලදී. එම ආයතන පහත පරිදි වානිජ වරායන් සඳහා ලියාපදිංචි වී ඇත.


**වගුව. 3 වානිජ වරායන් අනුව ලියාපදිංචි වී ඇති ආයතන සංඛ්‍යාව**

| ලියාපදිංචි වරායන් | කොළඹ | ගාල්ල | හම්බන්තොට | ත්‍රිකුණාමලය |
|---|---|---|---|---|
| ලියාපදිංචි වී ඇති ආයතන සංඛ්‍යාව | 22 | 12 | 11 | 09 |

එක් එක් නැවෙන් අපද්‍රව්‍ය ලබාගැනීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම 2016 ජුලි මස 01 වන දින සිට විද්‍යුත් සේවාවක් ලෙස සිදුකරන අතර කොළඹ වරාය සඳහා පැය 24 ක සේවා සැපයීමක් ආරම්භ කරන ලදී. ඒ අනුව 2016 වර්ෂයේ ජනවාරි මස 01 වන දින සිට ජූනි මස 30 වන දින දක්වා නෞකා සඳහා බලපත්‍ර 698 ක් නිකුත් කරනු ලැබූ අතර 2016 ජුලි මස 01 වන දින සිට දෙසැම්බර් 31 වන දින දක්වා විද්‍යුත් සේවාව යටතේ බලපත්‍ර 722ක් නිකුත් කරන ලදී.

නව ක්‍රමවේදය යටතේ නෞකාවලින් ඉවත් කරනු ලබන දැවිතෙල් වල අඩංගු තෙල් ප්‍රමාණයන් අනුව ඝන මීටර් 5 ක් ඉක්මවන විට එක් ඝන මීටරයකට රු. 500.00 බැගින් අයකරනු ලැබේ.

2016 වර්ෂයේ දී නිකුත් කල සම්පූර්ණ බලපත්‍ර 1422 ක් යටතේ දැවිතෙල් ඝන මීටර් 18,775 ක් හා ඝන අපද්‍රව්‍ය ඝන මීටර් 4,399 ක් ඉවත් කර ඇත.



## 1.5 වෙරළ කළමනාකරණ කමිටු පිහිටුවීම හා සමුද්‍ර පරිසර දූෂණ නිරීක්ෂණ කුළුණු ඉදිකිරීම.

වෙරළ භාවිතා කරන විවිධ පාර්ශවකරුවන්ගෙන් සැදුම්ලත් වෙරළ කළමනාකරණ කමිටු ලංකාව වටා වෙරළ තීරය ආවරණය වන පරිදි දිස්ත්‍රික් මට්ටමින් පිහිටුවීම ආරම්භ කරන ලදී. එම වෙරළ තීරයන් දූෂණයෙන් තොරව පවත්වා ගැනීම උදෙසා විවිධ ක්‍රියාමාර්ග සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම මෙම කමිටුවල කාර්යභාර්ය වේ.

මෙම ව්‍යාපෘතිය යටතේ මොරගල්ල හා උණවටුණ වෙරළ තීරයෙහි ජීවිතාරක්ෂක හා පරිසර දූෂණ නිරීක්ෂණ කුළුණ බැගින් ඉදිකරන ලදී. මේ සඳහා වෙරළාක්ෂක දෙපාර්තමේන්තුවේ ශ්‍රම දායකත්වය ලබා දෙන ලදී.

උණවටුණ ජීවිතාරක්ෂක හා පරිසර දූෂණ නිරීක්ෂණ කුළුණ 2016 ජුනි මස 24 වන දින ඛනිජතෙල් සම්පත් සංවර්ධන ගරු අමාත්‍ය චන්දිම වීරක්කොඩි මැතිතුමා හා මහවැලි සංවර්ධන හා පරිසර ගරු නියෝජ්‍ය අමාත්‍ය අනුරාධ ජයරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් විවෘත විය. මොරගල්ල ජීවිතාරක්ෂක හා පරිසර දූෂණ නිරීක්ෂණ කුළුණ 2016 ජුලි මස 29 වන දින සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය ගරු අමාත්‍ය රාජිත සේනාරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් විවෘත කරන ලදී.

## 1.6 මුහුදු ජලයේ ගුණාත්මකභාවය පරීක්ෂා කිරීමේ වැඩසටහන

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය වෙරළබඩ දිස්ත්‍රික්කවල පිහිටුවා ඇති ප්‍රාදේශීය කාර්යාල මඟින් තෝරාගත් සමුද්‍ර නාන තොටුපලවල ජල තත්ව පරීක්ෂණ පහත පරිදි සිදු කරනු ලැබේ.

| ප්‍රාදේශීය කාර්යාලය | සමුද්‍ර නාන තොටුපල |
|---|---|
| අම්පාර | ආරුගම්බේ |
| මඩකළපුව | පාසිකුඩා |
| හලාවත | හළාවත වෙරළ උද්‍යානය |
| කොළඹ | ගල්කිස්ස , වැල්ලවත්ත |
| ගාල්ල | හික්කඩුව,කොක්ගල,උණවටුන |
| මාතර | පොල්හේන |
| හම්බන්තොට | පරවිවැල්ල, හම්බන්තොට, කිරින්ද |
| කළුතර | මොරගල්ල |
| ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය |
| මීගමුව | මීගමු වෙරළ උද්‍යානය |
| යාපනය | යාපනය කොටුව, තොන්ඩාමනාරු |

**වගුව. 4 ජල තත්ත්ව පරික්ෂාව සඳහා තෝරාගෙන ඇති නාන තොටුපල**

ජල තත්වය පරීක්ෂණ නිදර්ශක ලෙස ජල සම්පල ලබාගෙන ඇති අතර එහිදී භෞතික මිනුම් වශයෙන් ආම්ලික/භාෂ්මිකතාව, සන්නායකතාව (Conductivity), ලවණතාවය (Salinity), ජලයේ ද්‍රාව්‍ය ඔක්සිජන් (DO), බොරභාවය (Turbidity), උෂ්ණත්වය (Temperature) ලබාගන්නා අතර රසායනික දත්ත ලෙස නයිට්‍රේට්(Nitrate), සහ පොස්පේට්(Phosphate) ප්‍රමාණය ද ජීව දත්ත ලෙස Coliform සහ E coli යන ක්ෂුද්‍රජීවී දත්තයන් මාස් පතා ලබාගනී.

කෙටි කාලීන ජල තත්ව වෙනස් වීම අධ්‍යනය සඳහා ඉහතකී ජීව දත්ව එනම් Total Coliform , Fecal coliform සහ E.coli ගණනය කිරීම ඉතා වැදගත් වන අතර Fecal බැක්ටිරියා ඉතා වැදගත් වන්නේ එය බොහෝමයක් රෝගකාරී බැක්ටිරියාවන් සිටීමට ඇති ඉඩකඩ පෙන්වා දෙන පැහැදිලි දර්ශකයක් බැවිනි.

මෙම ජල තත්ව පරීක්ෂණවලින් ලබාගන්නා දත්ත අදාල නාන තොටුපළ වැඩිදියුණු

කිරීම්වලට මෙන්ම මහජනතාවගේ දැනුවත් වීම පිණිස , ඉතා වැදගත් වන අතර ඒ අනුව සමුද්‍ර නාන තොටුපල කාණ්ඩ කිරීම ද සිදුකරනු ලබයි.

ඉහත අධ්‍යානයන් ගෙන් ලබාගත් තොරතුරු මත සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය අදාල ජල තත්වයන් ඉහල දැමීම සඳහා මුහුදට අපද්‍රව්‍ය බැහැර කිරිම පාලනය සඳහා බලපත්‍ර නිකුත් කිරිම, මුහුදට ජල මාර්ග වැටෙන ස්ථාන අධීක්ෂණය වැනි ක්‍රියාමාර්ග ගෙන ඇත.

ජල තත්ව පරීක්ෂණ වාර්ථා අනුව ඒ ඒ ප්‍රදේශයන් සඳහා සුදුසු කළමනාකරණ ක්‍රමවේද විවිධාකාර වන අතර සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය මඟින් අදාල පියවර ගෙන ඇත.

## 2. දැනුවත් කිරීමේ වැඩසටහන්

### 2.1 පාසල් සමුද්‍ර කණ්ඩායම් දැනුවත් කිරීමේ වැඩසටහන්

දිවයින වටා වෙරළබඩ දිස්ත්‍රික්ක 10ක් තුළ එනම්, කොළඹ, ගම්පහ, පුත්තලම, යාපනය, ත්‍රිකුණාමලය, අම්පාර, මඩකලපුව, හම්බන්තොට, මාතර, ගාල්ල සහ කළුතර යන දිස්ත්‍රික්ක වල ස්ථාපිත කර ඇති සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල 10ක් හරහා මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. මෙහිදී තෝරාගත් වෙරළබඩ පාසල් වල 8-9-10 ශ්‍රේණි වල සමුද්‍ර පරිසරය පිළිබඳ උනන්දුවක් දක්වන සිසුන්ගෙන් සමන්විත පාසල් සමුද්‍ර කණ්ඩායම් 200 ක් මේවන විට පිහිටුවා ඇති අතර එම කණ්ඩායම් ඉලක්ක කර ගනිමින් විවිධ වැඩසටහන් හරහා දැනුවත් කිරීම් සිදුකෙරේ.

සමුද්‍ර පරිසරයේ ඇති වැදගත්කමත්, සමුද්‍ර දූෂණය, එහි ප්‍රතිඵල සහ වළක්වාලීමේ වැදගත්කමත් පාසල් සිසු සිසුවියන් හට අවබෝධ කර පරිසර හිතකාමී සිසු පරපුරක් ඇතිකිරීම මෙම වැඩසටහනේ අරමුණයි.

**වගුව.5 පිහිටුවා ඇති පාසල් සමුද්‍ර කණ්ඩායම්**

| ප්‍රාදේශීය කාර්යාලය | පාසල් සමුද්‍ර කණ්ඩායම් ගණන |
|---|---|
| කොළඹ | 12 |
| මීගමුව | 12 |
| හලාවත | 19 |
| ත්‍රිකුණාමලය | 9 |
| අම්පාර | 12 |
| මඩකලපුව | 10 |
| හම්බන්තොට | 35 |
| මාතර | 39 |
| ගාල්ල | 32 |
| කළුතර | 20 |
| එකතුව | 200 |





2016 වසරේ පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි. සමුද්‍ර පරිසර පද්ධති වල වැදගත්කම හා ඒවා ආරක්ෂා කරගැනීම, සමුද්‍ර ජීවීන් හා ඔවුන් වර්තමානයේ මුහුණ පා ඇති තර්ජන, ආක්‍රමණික සමුද්‍ර ජීවීන්, සමුද්‍ර

දූෂණය, සමුද්‍ර දූෂක ප්‍රභව හා ඒවා අවම කරගැනීම-5R සංකල්පය, බැලස්ට් ජල තර්ජනය, මහද්වීප ප්ලාවිතය වැනි මාතෘකා ඔස්සේ පාසල් සමුද්‍ර කණ්ඩායම් දැනුවත් කරන ලදි.

## 3. සමුද්‍ර පරිසර පද්ධති සංරක්ෂණය

### 3.1 ශ්‍රී ලංකා වෙරළ තීරයේ රුකව සිට පුත්තලම දක්වා මුහුදු තෘණ ගවේෂණය සහ නැවත සිටුවීමේ ව්‍යාපෘතිය

මුහුදු තෘණ යනු සාගර පරිසරය තුළ දැකිය හැකි සපුෂ්ප ශාක වේ.බහුල ලෙස කලපු සහ නොගැඹුරු මුහුදු පත්ල තුළ මෙම මුහුදු තෘණ දැකිය හැකි අතර ඇතැම් විශේෂ ගැඹුරු මුහුදේද දැකිය හැකිය.වඳ වී යාමේ තර්ජනයට ලක්ව ඇති මුහුදු ඌරන් වැනි සතුන් බහුලව ජීවත් වන වාසස්ථානයක් ලෙසද මෙම මුහුදු තෘණ පරිසර පද්ධති හැඳින්විය හැක. ශ්‍රී ලංකාවේද බොහොමයක් කලපු සහ මුහුදු තීරයේ මෙම මුහුදු තෘණ බහුල ලෙස දැකිය හැකි නමුත් ඒවා පිළිබඳ අධ්‍යයනයන් සිදු වී ඇත්තේ ඉතාමත් අල්ප ලෙසය.එබැවින් මෙම ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාවේ රුකව සිට පුත්තලම දක්වා මුහුදු තෘණ ගවේෂණයක් සිදුකරන ලද අතර එක් එක් ප්‍රදේශයන්හි ව්‍යාප්තව පැවති මුහුදු තෘණ වර්ග හඳුනා ගැනීම සිදු කරන ලදී.එමෙන්ම මීගමුව කලපුව ආශ්‍රිතව මුහුදු තෘණ වගා කිරීම (බාහිරව) අධ්‍යයනය සඳහා මූලික පරීක්ෂණයක් සිදු කරන ලදී.එමෙන්ම එක් එක් ප්‍රදේශ වලින් එකතු කර ගන්නා ලද මුහුදු තෘණ පසු අධ්‍යයනයන් සඳහා කල් තබා ගැනීම (Herbarium) සිදු කරන ලදී. ඒ සඳහා අවශ්‍ය පරිදි මුහුදු තෘණ පත්‍රිකාවල සකස් කර නැවත අධ්‍යයනයට පහසු වන පරිදි කල්තබා ගන්නා ලදී.





**මීගමුව කලපුව තුල සිදු කරන ලද මුහුදු තෘණ ගවේෂණ අවස්ථාවක්**





**මුහුදු තෘණ හඳුනා ගැනීමේ සහ කල්තබා ගැනීමේ කටයුතු සිදු කරමින්**









**මීගමුව කලපුව තුල මුහුදු තෘණ නැවත සිටුවීමේ පරීක්ෂණය**

## 3. අන්තර් ජාතික දිනයන් සැමරීම

### 3.1 අන්තර්ජාතික වෙරළ පවිත්‍රතා දිනය හා ජාතික සමුද්‍රීය සම්පත් සුරැකීමේ සතිය 2016

විවිධ සංවර්ධන කටයුතු හා ජනගහනය වැඩි වීම් හේතුවෙන් අධිකව භාවිතා වන විවිධ දූෂකාංග වල බලපෑම නිසා ශ්‍රී ලංකාව වටා සමුද්‍රය, දූෂණය වීමේ අවදානම දිනෙන් දින වැඩි වෙමින් පවතී. ගොඩබිම තුළ ජනනය වන නොදිරන අපද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් සෘජුවම හෝ ඇල මාර්ග ඔස්සේ හෝ වෙරළ සහ සාගර කලාපයන්ට එකතු වේ. එමගින් එම සංවේදි සමුද්‍ර පරිසර පද්ධති මෙන්ම සමුද්‍රය හා බැඳුනු කර්මාන්ත වන ධීවර සහ සංචාරක කර්මාන්තය මත අහිතකර බලපෑම් ඇති කරනු ලබයි. එබැවින් වෙරළ සහ සාගර පරිසර පද්ධති ආරක්ෂා කිරීම සහ ඒ හා බැඳුනු කර්මාන්ත වල තිරසාර බව ආරක්ෂා කිරීම සඳහා සියළු දෙනා දැනුවත් කිරීමේ හා ප්‍රායෝගිකව සහභාගී කරවීමේ, ක්‍රමවත් වැඩපිළිවෙළක් සැකසීම අත්‍යාවශ්‍ය වී ඇත. ශ්‍රී ලංකාව ඇතුළු ලෝක වාසීන් බහුතරයක් එක්ව සෑම වර්ෂයකම සැප්තැම්බර් මස 03 වන සතියේ සෙනසුරාදා දින අන්තර්ජාතික වෙරළ පවිත්‍රතා දිනය සමරනු ලබයි.

මෙම අරමුණ පෙරදැරි කරගෙන ශ්‍රී ලංකාව ඇතුළු ලෝක වාසීන් බහුතරයක් එක්ව සෑම වර්ෂයකම සැප්තැම්බර් මස 03 වන සතියේ සෙනසුරාදා දින අන්තර්ජාතික වෙරළ පවිත්‍රතා දිනය සමරනු ලබයි. උක්ත දිනයට අදාලව පැවැත්වෙන වෙරළ පවිත්‍රතා වැඩසටහන, ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්ත කිරීමේ අරමුණ ඇතිව, මෙම වසරේ පටන් සෑම වසරකම සැප්තැම්බර් මස 03 වන සෙනසුරාදා සිට 04 වන සෙනසුරාදා දක්වා ඇතිව වූ සතියක කාලය "ජාතික සමුද්‍ර සම්පත් සුරැකීමේ සතිය" ලෙස අති ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

මෙම වසර අන්තර්ජාතික වෙරළ පවිත්‍රතා දින ජාතික සැමරුම් උත්සවය 2016 සැප්තැම්බර් මස 17 වන දින කොළඹ දිස්ත්‍රික්කයේ මට්ටක්කුලිය වෙරළ තීරයේදී පවතවන ලද අතර, සැප්තැම්බර් 17 වන දින සිට 23 වන දින දක්වා සාමාන්‍ය ප්‍රජාව, පාසල් ප්‍රජාව සහ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන ඇතුලු ප්‍රජාව සමබන්ධ කර ගනිමින් පළාත් සහ දිස්ත්‍රික් ප්‍රධානීන්ගේ දායකත්වයෙන් හා ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රධානත්වයෙන් හා සම්බන්ධීකරණයෙන්, ලංකාව පුරා වෙරළ හා සාගර පද්ධති පවිත්‍ර කිරීමේ වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරන ලදී.

මෙම වැඩසටහන් සඳහා 5000 ක පමණ ජනතා නියොජනයක් ලද අතර වැඩසටහනින් ලබා ගත් සමුද්‍රීය අපද්‍රව්‍යය පිළිබඳ දත්ත විශ්ලේෂණය කර අවසන් වාර්තාව අන්තර් ජාතික සමුද්‍රුරු සුරැකීමේ ආයතනය වෙත ලබා දෙන ලදී.

**2016 වර්ෂය සඳහා වැඩසටහන පහත සඳහන් පරිදි සිදු කරන ලදී**

**වෙරළ පවිත්‍ර කිරීමේ වැඩසටහන 2016**

| දිස්ත්‍රික්කය | ස්ථාන | ප්‍රධාන උත්සවය |
|---|---|---|
| කොළඹ | කාක දූපත වෙරළ උද්‍යානය, දෙහිවල, වැල්ලවත්ත, ගල්කිස්ස, රත්මලාන, මොරටුව | සැප්. 17 |
| ගම්පහ | මීගමුව වෙරළ උද්‍යානය, දූව, පෝරුතොට, උස්වැටකෙයියාව, කාමච්චෝඩය, වත්තල | සැප්. 17 |
| පුත්තලම | හලාවත, අඹකඳවිල , කන්දකුලිය, මාරවිල, වෙන්නප්පුව | සැප්. 18 |
| මන්නාරම | කීරි වෙරළ, අරිප්පු, වන්කලායි | සැප්. 19 |
| කිලිනොච්චි | නාච්චිකුඩා, කිලාලි, ගච්දාරිමුණි | සැප්. 20 |
| යාපනය | ගුරුනගර් වෙරළ උද්‍යානය , වෙල්වෙට්තුරේ, පේදුරු තුඩුව, තොන්ඩමන්අරු | සැප්. 20 |
| මුලතිවු | මුලතිවු වෙරළ උද්‍යානය, අලම්පිල්, පුදුමාතලන් | සැප්. 20 |
| ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය නාගරික වෙරළ තීරය, කොටුව, තිරුක්කඩලූර්, ජමාලියා, මුරුගාපූරි, උප්පවේලි, ඇලස් උද්‍යානය, ලංකා IOC, ටෝකියෝ සිමෙන්ති ආයතනය හා ප්‍රීමා ආයතනය යාබද වෙරළ තීරයන්, පරවි දූපත | සැප්. 21 |
| මඩකලපුව | සවුකඩි, ආරයම්පති, කට්ටන්කුඩි, කිරාන්, වාලච්චේනයි, වාකරෙයි, වෙන්කලඩි, කලවන්චිකුඩි, මඩකලපුව | සැප්. 21 |
| අම්පාර | ආරුගම්බේ, තිරුක්කෝවිල්, අලයඩිවෙම්බු, සයින්තමරුදූ, පානම, අක්කරපත්තුව, අඞ්ඩාලච්චේන, නින්දවූර්, කාරතිවු, කල්මුණේ-දෙමල ප්‍රාදේශිකය, කල්මුණේ-මුස්ලිම් ප්‍රාදේශිකය | සැප්. 22 |
| හම්බන්තොට | තංගල්ල රණවිරු ස්මාරකය අසල වෙරළ තීරය, කිරින්ද, කලමැටිය, හම්බන්තොට | සැප්. 22 |
| මාතර | මාතර වෙරළ උද්‍යානය, දික්වැල්ල, වැල්ලමඩම, තොටමුණ, වැලිගම, මාතර | සැප්. 22 |
| ගාල්ල | දෙවට, සමනළ උද්‍යාන වෙරළ තීරය, බෙන්තොට, හික්කඩුව, අම්බලන්ගොඩ, බලපිටිය | සැප්. 23 |
| කළුතර | කළුතර කැලිඩෝ වෙරළ තීරය, බේරුවල, පානදුර වෙරළ උද්‍යානය, වාද්දුව | සැප්. 23 |

ප්‍රධාන වැඩසටහන කාක දූපත වෙරළ උද්‍යානය පවත්වන ලදී.
මුළු සහභාගීත්වය = 1086
සහභාගීත්වය

| දිනය | ස්ථානය | වැඩසටහන | සහභාගී වූ කණ්ඩායම් | සහභාගී වූ සංඛ්‍යාව | අනුග්‍රහය |
|---|---|---|---|---|---|
| **සැප්. 17** | කාක දූපත වෙරළ උද්‍යානය | ප්‍රධාන වැඩසටහන මහවැලි සංවර්ධන සහ පරිසර නියෝජ්‍ය අමාත්‍ය ගරු අනුරාධ ජයරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. | සම්භාවනීය අමුත්තන්<br>ශ්‍රී ලංකා නාවික හමුදාව<br>ශ්‍රී ලංකා ගුවන් හමුදාව<br>ශ්‍රී ලංකා යුධ හමුදාව<br>ශ්‍රී ලංකා පොලීසිය<br>සිවිල් ආරක්ෂක බලකාය<br>වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව<br>ධීවර දෙපාර්තුමේන්තුව<br>ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය<br>CINEC විශ්වවිද්‍යාල සිසුන්<br>සාගර විශ්වවිද්‍යාල සිසුන්<br>පාසල් සිසුන්<br>රතු කුරුස සංවිධානය<br>කොළඹ මහ නගර සභාව<br>වෙරළ කළමනාකරණ කමිටුව<br>Colombo Dockyard<br>සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය | 11<br>150<br>135<br>101<br>116<br>61<br>24<br>10<br>14<br>29<br>45<br>80<br>16<br>20<br>40<br>30<br>96 | සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය , වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව , ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ් |





ආරම්භක උත්සවය

වෙරළ පිරිසිදු කරන අවස්ථාවක්





වෙරළ පිරිසිදු කරන අවස්ථාවන්







**පිරිසිදු කිරීමේදි එකතු කරන ලද අපද්‍රව්‍ය**

## ජගත් සාගර දිනය 2016

"පිවිතුරු සයුරක් - නිරෝගිමත් ලොවක්" යන තේමාව යටතේ ජනතාව දැනුවත් කිරීමේ පාගමනක් සහ වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහනක් සමගින් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය ජගත් සාගර දිනය 2016 ජූනි 08 වන දින සමරන ලදී.

මෙම උත්සවයේ සමාරම්භය අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමාගේ සහ තවත් සම්භාවනීය අමුත්තන්ගේ ප්‍රධානත්වයෙන් කොළඹ විහාරමහාදේවී උද්‍යානයේදී පවත්වන ලදී. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය මගින් වාර්ෂිකව නිකුත් කරන සත්සමුදුර සඟරාවේ 2016 ප්‍රකාශනයේ මුල් පිටපත අතිගරු ජනාධිපති තුමාට පිළිගැන්වීමද මෙහිදී සිදු විය.

සමාරම්භක උළෙලින් පසුව පාසැල්, විශ්ව විද්‍යාල, රාජ්‍ය ආයතන, ආරක්ෂක අංශ සහ රාජ්‍ය නොවන සංවිධාන නියෝජනය කරමින් 1500 ක පමණ පිරිසකගේ සහභාගීත්වයෙන් ඇරඹුණු පාගමන විහාරමහාදේවී උද්‍යානයේ සිට ගාලු මුවදොර පිටිය දක්වා ගමන් කරන ලදී. පාගමනින් අනතුරුව වැල්ලවත්ත වෙරළේ සහ කාකදූපත වෙරළ උද්‍යානයේදී වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.








*ජගත් සාගර දිනය වෙනුවෙන් සංවිධානය කරන ලද වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන*



**පාගමන සඳහා අතිගරු ජනාධිපතිතුමා සහභාගි වූ අවස්ථාව**

## ජගත් පරිසර දිනය 2016

මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශයේ මගපෙන්වීම යටතේ ජගත් පරිසර දිනය නිමිත්තෙන් මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටි පාසැල් තුනක සිසුසිසුවියන් දැනුවත් කිරීම සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය මගින් සිදුකරන ලදී. 2016 මැයි මස 24 සහ 25 යන දිනයන්හිදී රන්ගිරි දඹුල්ල ජාතික පාසැල, වීර මොහාන් ජයමහ විද්‍යාලය සහ අකුරම්බොඩ විද්‍යාලය මෙලෙස දැනුවත් කරන ලදී. මෙහිදී එක් පාසැලකින් සිසුන් 200 දෙනෙකු බැගින් පරිසරයේ සහ සමුද්‍ර පරිසරයේ වැදගත්කම ගැන සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ නිළධාරින් සහ මධ්‍යම පරිසර අධිකාරියෙන් පැමිණි සම්පත් දායකයෙකු මගින් දේශන පවත්වන ලදී.





**පිරිසිදු වෙරළක් සහිත නගර ව්‍යාපෘතිය**

ත්‍රිකුණාමළ දිස්ත්‍රික්කය තුල පිරිසිදු වෙරළත් සහිත නගර ව්‍යාපෘතිය යටතේ ක්‍රියාකාරකම් විශාල ප්‍රමාණයක් වසර තුලදී සිදු කරන ලදි. මෙම ව්‍යාපෘතියේ මූලික පරමාර්ථය වනුයේ ත්‍රිකුණාමළ දිස්ත්‍රික්කය තුල පිරිසිදු වෙරළ තීරයක් අවම දූෂණ තත්වයක් යටතේ පවත්වා ගෙන යාම හා සංචාරකයන් ආකර්ෂණය කර ගැනීමයි. මෙමගින් ත්‍රිකුණාමළ දිස්ත්‍රික්කයේ ජනතාවගේ ජිවන තත්වය හා ජිවිකාව උසස්කිරීමට හැකියාව පවතී . මෙම අරමුණ මූලික කරගෙන සාර්ථක ක්‍රියාකාරකම් කිහිපයක් ත්‍රිකුණාමළ දිස්ත්‍රික්කය තුල දී ක්‍රියාත්මක කරන ලදි.

**මුහුදට අපද්‍රව්‍ය බැහැර කරන කාණු ආවරණය සදහා ආවරණ දැල් යෙදවීම.**

මුහුදට අපද්‍රව්‍ය බැහැර කරන කාණු ආවරණය සදහා ආවරණ දැල් යෙදවීම.පිරිසිදු වෙරළ නගර ව්‍යාපෘතිය යටතේ සිදුකරන ප්‍රධාන ක්‍රියාකාරකමකි. ත්‍රිකුණාමළ නගරය ආශ්‍රිතව බ්‍රිතාන්‍ය සමයේ ස්ථාපිත කරන ලද අප ද්‍රව්‍ය බැහැර කිරිමේ කාණු පද්ධතියක් පවතී. බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේ මෙම කාණු පද්ධතිය මගින් වැසි වතුර එකතු කර එය සාගරයට බැහැර කිරිම සිදු කරන ලදි.කෙසේ වුවද මෙම කාණු පද්ධතිය මගින් වර්ථමානයේ ඝන අපද්‍රව්‍ය හා අනෙකුත් අප ද්‍රව්‍ය ඍජුවම මුහුදට රැගෙන යාම සිදු කරන ලබයි.සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් මෙම ගැටලුව හදුනාගැනීමෙන් පසුව ත්‍රිකුණාමළ දිස්ත්‍රික්ක කාර්යාලය විසින් කාණු පද්ධතිය මුහුදට නිරාවරණය වන ස්ථානයේ වානේ වලින් දැල් සහිත ආවරණයක් යෙදීම මගින් ඝන අපද්‍රව්‍ය සාගරයට බැහැර වීම වැලැක්වීම සිදු කරන ලදි.

ආරම්භක පියවරක් වශයෙන් ස්ථාන 20 ක් තෝරාගත් අතර ත්‍රිකුණාමළ නගර සභාව හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සමග එක්ව එම ස්ථාන 20 සදහා දැල් ආවරණ යෙදීම සිදු කරන

ලදි.මේ සඳහා සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් රුපියල් **847200** ක් වියදමක් දරණ ලදි.

මෙහිදී එකතුවන අප ද්‍රව්‍ය නිසිපරිදි ඉවත් කිරිම සදහා කාණු පද්ධතිය සදහා දැල් ආවරණ සකස් කිරිම වෙනුවෙන් අවබෝධතා ගිවිසුමක් සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරිය හා ත්‍රිකුණාමළ නගර සභාව සමග අත්සන් කරන ලදි. ඒ අනුව සියලු ඉදිකිරිම් කටයුතු ත්‍රිකුණාමළ නගර සභාවේ අධික්ෂණය යටතේ නගර සභාව විසින් සිදුකරනුලබන අතර නගර සභාව මෙහිදී එකතුවන අප ද්‍රව්‍ය ඒකතු කිරිම හා නියමිත පරිදි බැහැර කිරිම සඳහා වගකීම භාර ගන්නා ලදි.ඒ අනුව මේ තාක් සෘජුවම කාණු පද්ධතිය මගින් මාතලේ දිස්ත්‍රික් පාසැල් සිසුන් දැනුවත් කිරිම කරන ලදී.

මුහුදට බැහැර කරන ලද අප ද්‍රව්‍ය එසේ බැහැර විම වැලැක්විමේ හැකියාව මෙම අධිකාරියවෙත ලැබුණු අතර එමගින් ත්‍රිකුණාමළ නගරය ආශ්‍රිතව සුපිරිසිදු වෙරළක් පවත්වාගෙන යාමේ හැකියාව වැඩි දියුණු විය





**<u>පාසල් සඳහා කසළ බඳුන් ලබා දීම</u>**

පිරිසිදු වෙරළත් සහිත නගර ව්‍යාපෘතිය යටතේ ත්‍රිකුණාමළ දීස්ත්‍රික්ක වෙරළ ආශ්‍රිත පාසල් සඳහා කසල බදුන් ලබා දීමේ ව්‍යාපෘතිය සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් වසර තුලදී ක්‍රියාත්මක කරන ලදි. මෙම ව්‍යාපෘතිය යටතේ වෙරළට සමිප පාසල් 08 ක් තෝරාගෙන සෑම පාසලක් සඳහාම කසළ බඳුන් 03 බැගින් ලබා දීම සිදුකරන ලදි. එම කසළ බඳුන් පොලතීන්,කාබනික අපද්‍රව්‍ය හා කඩදාසි අපද්‍රව්‍ය බැහැර කරලීම සඳහා යොදවන අතර එමගින් වෙරළ ආශ්‍රිත පරිසරයේ දූෂණ අඩුකිරිමට හැකියාව සේම සාගරයද දූෂණයෙන් වලක්වා ගැනිමට හැකියාව ලැබේ.

මේ සමග සිසුන් සඳහා අප ද්‍රව්‍ය දිරායන කාලය මත පදනම්ව වර්ග කිරිමේ පුහුණුවද ලැබේ නිසි පරිදි අප ද්‍රව්‍ය බැහැර කිරිම පරිසරය පිරිසිදුව පවත්වා ගෙන යාමට උපකාරිවන බව සිසුන්ට අවබෝධ කරලීම හා එමගින් සමුද්‍ර පරිසරය ආරක්ෂා කරගැනීම මෙම ක්‍රියා කාරකමේ මූලික අරමුණ විය.










**<u>වෙරළ ආශ්‍රිත පාසල් වල බිත්ති  සමුද්‍ර පරිසරය හා එය ආරක්ෂා කිරිමට අදාල වන චිත්‍ර මගින් අලංකරණය</u>**

පිරිසිදු වෙරළත් සහිත නගර ව්‍යාපෘතිය යටතේ පාසල් සිසුන් සමග එක්ව ක්‍රියාත්මක කරන ලද තවත් වැඩසටහන වූයේ වෙරළ ආශ්‍රිත පාසල් වල බිත්ති  සමුද්‍ර පරිසරය හා එය ආරක්ෂා කිරිමට අදාල වන චිත්‍ර මගින් අලංකරණය කිරිමයි. ඒ අනුව මේ සදහා පාසල් 08 ක් තෝරා ගත් අතර ඔවුන් වෙත තෝරාගත් ඡායා රූපයක් ඔවුන්ගේ පාසලේ බිත්තියේ ඇදීම සදහා උපදෙස් ලබා දීම සිදු කරන ලදි. මෙමගින් පාසල් සිසුන් හා පොදු මහජනතාව සමුද්‍ර පරිසරයේ වැදගත් කම හා සමුද්‍ර පරිසරය දූෂණය වන ආකාරය හා එය වලක්වා ගන්නා ආකාරයේ දැනුවත් කිරිම මුලික අරමුණ විය. පාසල් සිසුන් විසින් අදිනලද චිත්‍ර වල ඡායාරූප ඇත. 03 හි දක්වා ඇත.

ඉහත ක්‍රියාකාරකම් වලට අතිරේකව දැන්වීම් පුවරු ස්ථාපිත කිරිම පරිසර සතිය ක්‍රියාත්මක කිරිම. වෙරළ පිරිසිදු කිරිමේ වැඩසටහන ආදි ක්‍රියා කාරකම් ද මෙම ව්‍යාපෘතියේ අරමුණ ඉටුකරගැනීමට වසර තුලදී ක්‍රියාත්මක කරන ලදි.


MEPA


WATER HAS BECOME
A GLOBAL GARBAGE
DUMP


$H_2O$



**මුහුදේ තෙල් ගවේෂණ කටයුතු වලට අදාල අධික්ෂණය**

2011 අංක 01 දරණ ඛනිජ තෙල් ඇතුළු ස්වාභාවික සම්පත් සඳහා අක්වෙරළ කැනීම හා ප්‍රයෝජනයට යොදාගැනීමේ (සමුද්‍ර පරිසර ආරක්ෂණ) නියෝගවලට අනුව ශ්‍රී ලංකා ජල තීරයේ ඛනිජ තෙල් ගවේෂණයට අදාලව පාරිසරික බලපත්‍ර නිකුත් කිරීම සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ වගකීමකි. 2016 වසරේ දී පහත ව්‍යාපෘති සඳහා සමුද්‍ර පරිසර ආරක්ෂණ බලපත්‍ර අයදුම්පත් 02ක් ඉදිරිපත් විය.

1. ප්‍රංශයේ ටොටාල් (Total) සමාගම හා ශ්‍රී ලංකාවේ ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය එක්ව ශ්‍රී ලංකාවට නැගෙනහිර මුහුදේ තෙල් සම්පත් ගවේෂණය සඳහා වන සමීක්ෂණ ව්‍යාපෘතිය
2. මේ සඳහා අදාල පාර්ශවකරුවන්ගෙන් සමන්විත තාක්ෂණික කමිටුවක් තුලින් සකස් කරන ලද TOR (නිර්නේය විෂයක්) ඉදිරිපත් කරන ලදී. ඒ අනුව පාරිසරික බලපෑම් තක්සේරුකරණ වාර්තාව සකස් කිරීම එම සමාගම මඟින් සිදු කර ඇත.
3. Schlumberge Multiclient Marine Seismic Acquisition ආයතනය විසින් ශ්‍රී ලංකාවේ බටහිර මුහුදේ ඛනිජතෙල් සම්පත් ගවේෂණයට අදාල සමීක්ෂණ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ පාරිසරික ඇගයීම් වාර්තාව සඳහා තාක්ෂණික කමිටුවක් මඟින් නිර්නේය විෂයය (TOR) සකස් කොට සමාගම වෙත ඉදිරිපත් කර ඇත.

# 5 පරිපාලන, නීති, මානව සම්පත් සංවර්ධන, අභ්‍යන්තර විගණන සහ මූල්‍ය අංශවල සේවය සහ වගකීම.

## 5.1 පරිපාලන අංශය

සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරියේ කාර්යය මණ්ඩලය සේවයේ ස්ථාපිත කිරීමේ සිට සේවය අවසන් කිරීම දක්වා සමස්ථ පිරිස් කළමනාකරණ කාර්යයද අධිකාරියේ සෙසු අංශවල ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සම්පාදනයද පරිපාලන අංශයේ වගකීම වේ. අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරී වන සාමාන්‍යාධිකාරීවරයාගේ මඟපෙන්වීම යටතේ පරිපාලන අංශය කටයුතු කරනු ලබයි.

## 5.2 නීති අංශය

1. 2016 ජනවාරි 01 දින ලුනාව තල්දියවත්ත ප්‍රදේශය ආශ්‍රිතව සිදු වූ සමුද්‍ර පරිසර දූෂණය සම්බන්ධයෙන් පනතෙහි සිවිල් හා අපරාධ වගකීම යටතේ වගකිව යුතු සී/ස ලංකා බණිජ තෙල් ගබඩා පර්යන්තයට එරෙහිව නඩු පැවරීම සඳහා අවශ්‍ය සියලුම තොරතුරු නීතිපති දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇති අතර මේ සම්බන්ධයෙන් නිතිපතිතුමා සමඟ සාකච්ඡා පැවැත්වේ. සිදුවීමෙන් සමුද්‍ර පරිසරයට සිදු වූ හානිය තක්සේරු කිරීම සඳහා නාරා ආයතනයෙන් පිළියෙල කරන ලද පරිසර හානිය පිළිබඳ සවිස්තරාත්මක තක්සේරු වාර්තාවද නීතිපති වෙත භාර දී ඇත.

2. 2016 සැප්තැම්බර් මස 02 වන දින ඉන්ධන තෙල් හුවමාරු කරමින් සිටියදී MT LAXAPANA නෞකාවෙන් කොළඹ වරාය තුළ සිදුවූ සමුද්‍ර පරිසර දූෂණයට එරෙහිව පනතෙහි 26 වන වගන්තිය (අපරාධ වගකීම) යටතේ නඩු පවරා වන්දි ලබා ගැනීම සඳහා අවශ්‍ය සියලු ලේඛණ සහ තොරතුරු නීතිපති දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇති අතර නීතිපති සමඟ මේ සම්බන්ධයෙන් සාකච්ඡා පැවැත්වේ.

3. පනතෙහි 51(2) වගන්තිය යටතේ සම්පාදනය කරන ලද 5 වන නියෝගය වන නෞකා සඳහා අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම් සැපයීමට අදාල නියෝග 2016 දෙසැම්බර් මස 06 වන දින ගැසට් (අංක 1996/27) මගින් ප්‍රකාශයට පත් කරන ලදී. මෙය මෙම නියෝග අධිකාරිය සඳහා සැලකිය යුතු ආදායම් මාර්ගයක් වේ.

## 5.3 අභ්‍යන්තර විගණන අංශය

**අභ්‍යන්තර විගණන අංශයේ විෂය පරාසය**

සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරියේ අරමුණ හා කර්තව්‍යය ඉලක්ක කරගෙන ප්‍රධාන කාර්යාලය සහ උප කාර්යාලයන්හි මූල්‍ය හා භෞතික කටයුතු සියල්ල පරිපාලනය ධනාත්මක සංවර්ධනය ඔස්සේ යහපාලනයෙන් හා විනිවිධභාවයෙන් යුතුව පවත්වාගෙන යන්නේද යන්න කළමනාකරණ දෘෂ්ඨියෙන් අගයා ප්‍රධාන කළමනාකරණය වෙත වාර්තා කිරීම.

රාජකාරි කටයුතු ක්‍රමයෙන් පුළුල් වෙත්ම අභ්‍යන්තර විගණන අංශයේ විෂය පථය ද ක්‍රමයෙන් පුළුල් වේ. අධිකාරිය විසින් සමුද්‍ර දූෂණය වැලැක්වීම, පාලනය කිරීම සඳහා සිය පනතේ ඇති බලතල සැලසුම් සහගතව විවිධ ව්‍යාපෘති ඔස්සේ ක්‍රියාත්මක කර ඇති අතර ඒ හරහා අධිකාරියේ ආදායම් ඉහළ නැංවීමට ක්‍රියා කරමින් පවතී. අධිකාරියේ මූල්‍යය හා භෞතික ක්‍රියාකාරකම් ඉහළ යත්ම අභ්‍යන්තර විගණන අංශයට පැවරෙන්නේ ඉතා සුවිශේෂී කාර්යභාරයකි.

අධිකාරියේ සභාපතිතුමාගේ සෘජු අධීක්ෂණය හා මඟපෙන්වීම යටතේ අභ්‍යන්තර විගණන අංශය ස්ථාපිත කර ඇත. වාර්ෂිකව පිළියෙල කරන අභ්‍යන්තර විගණන සැලැස්ම හා වැඩසටහන අනුව විගණන රාජකාරී සිදුකරන අතර අධිකාරියේ පවතින සැලසුම්, නීති, මෙහෙයුම්, පරිපාලන හා මූල්‍ය යන අංශයන් විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව සිදු කරන රාජකාරී වල ඵලදායීතාවය සම්බන්ධයෙන් විගණන පරීක්ෂණ පවත්වනු ලැබේ. එම පරීක්ෂණ මත පදනම්ව එළඹෙන නිරීක්ෂණ හා යෝජනා ඇතුළත්ව සකස් කරන අභ්‍යන්තර විගණන වාර්තා සභාපතිතුමාගේ අවධානයට ඉදිරිපත් කරනු ලැබේ.

එහිදී පහත සඳහන් කරුණු පිළිබඳව ඇඩි ලෙස අවධානය යොමු කරනු ලැබේ.

1. වැරදි හා වංචා වැළැක්වීම සඳහා ස්ථාපිත කර ඇති අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් ද යන්න විමර්ශනය කිරීම.

2. අධිකාරියේ මූල්‍ය කටයුතු රාජ්‍ය මුදල් රෙගුලාසි ප්‍රකාරව සත්‍ය හා සාධාරණව සිදුවන්නේද යන්න සොයා බැලීම හා ඒ සඳහා ස්ථාපිත කර ඇති අභ්‍යන්තර මූල්‍ය පාලන ක්‍රමය පිළිබඳව විමර්ශනය කිරීම.

3. අධිකාරියේ කාර්යමණ්ඩලය වෙත පවරා ඇති රාජකාරී හා අදාල වගකීම කාර්යක්ෂමව හා සඵලදායීව ඉටුකරන්නේද යන්න සුපරීක්ෂණය

4. අධිකාරිය විසින් සැලසුම් කල පරිදි මෙහෙයුම් හා කාර්යාල කටයුතු සඳහා අවශ්‍ය කරන ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම හා ඵලදායීව එය භාවිතා කරන්නේද යන්න පරීක්ෂාව.

5. රාජ්‍ය ප්‍රතිපත්ති, නීතිරීති, මුදල් රෙගුලාසි හා අධිකාරිය විසින් වරින් වර පනවනු ලබන අභ්‍යන්තර චක්‍රලේඛ අණපනත් වලට අනුකූලව ක්‍රියා කරන්නේද යන්න පරීක්ෂාව

6. අවශ්‍යය අවස්ථාවලදී හදිසි ස්ථානීය විමර්ෂණ පැවැත්වීම.

අභ්‍යන්තර විගණන අංශය විසින් වාර්ෂිකව පිළියෙල කරන විගණන වැඩසටහනට අනුව ප්‍රධාන කාර්යාලයේ ඇති සියලුම අංශ ඇතුලු ප්‍රාදේශිය කාර්යාල විගණනයට භාජනය කරයි. මීට අමතරව විගණන ව්‍යවස්ථාව අනුව වර්ෂයක් තුළ අධිකාරිය විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් අවම වශයෙන් පැවැත්විය යුතුය. මෙය අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදේශනාත්මක කමිටුවක් ලෙස හඳුන්වාදිය හැක. අධිකාරිය විසින් 2016 වර්ෂයේදි විගණන හා කළමනාකරණ රැස්වීම් 04 ක් පවත්වන ලද අතර 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) සී වගන්ති ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සාකච්ඡා කිරීම සඳහා විශේෂ විගණන හා කළමනාකරණ රැස්වීමක්ද පවත්වන ලදී. අභ්‍යන්තර විගණන අංශය විසින් අධිකාරියේ අභිවෘද්ධිය වෙනුවෙන් ප්‍රධාන කළමනාකරණයට අවශ්‍ය තීරණ ගැනීම සඳහා සැමවිටම තොරතුරු වාර්තාකරණයක් සිදු කරයි.

## 5.4 මානව සම්පත් සංවර්ධන අංශය

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජික මහත්ම මහත්මීන් පුහුණු කිරීම තුලින් ඔවුන්ගේ ධාරිතාවය හා හැකියාව වර්ධනය කිරීම මානව සම්පත් සංවර්ධන අංශයේ වගකීම වන අතර අධිකාරියේ ප්‍රධාන විධායක නිළධාරී වන සාමාන්‍යාධිකාරවරයාගේ සියලු මගපෙන්වීම යටතේ මෙම අංශය කටයුතු කරනු ලබයි.

**අංශයේ වගකීම්**

1. අධිකාරියේ කාර්ය මණ්ඩලයේ ධාරිතාවය හා හැකියාව වර්ධනය කිරීම සඳහා වන පුහුණු අවශ්‍යතාවයන් හඳුනා ගැනීම සහ ඒ සඳහා සම්පත් දායකයින් හඳුනා ගැනිමින් දේශීය/ විදේශීය පුහුණු සැලසුම් සකස් කිරීම හා කාර්ය මණ්ඩල සාමාජිකයන් එකී පුහුණු පාඨමාලා සඳහා යොමු කිරීම.

2. පුහුණු වීම ලබන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් නිසි පරිදි පුහුණුවීම් ලබා ගන්නේද එසේ නොමැති නම් එහි අඩුපාඩු තිබේද යන්න පසුවිපරම් කිරීම සහ අඩුපාඩු මග හරවා ගැනීමට අදාල ක්‍රමෝපායන් ඉදිරිපත් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

3. කාර්ය මණ්ඩලයේ වාර්ෂික ප්‍රගති වාර්තා ඇගයීම

4. අධිකාරියේ කාර්ය මණ්ඩලයේ පුද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම,සේවක ශ්‍රේණිගත කිරීම හා උසස් කිරීම හා සේවක ස්ථාන මාරු කිරීම සදහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

5. සේවක මණ්ඩල හා ආයතනික කටයුතු සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශය හා සෙසු බාහිර පාර්ශවයන් විසින් ඉල්ලා ඇති තොරතුරු සාමාන්‍යාධිකාරීවරයාගේ අනුමැතියට යටත්ව යොමු කිරීම.

6. සේවක සුබසාධන කටයුතු.

මෙම වසරේදී අධිකාරියේ නිළධාරීන් සහභාගී වූ දේශීය සහ විදේශීය පුහුණු වැඩසටහන් පිළිබද විස්තර පහත පරිදි වේ.

## දේශීය පුහුණුවීම් සදහා සහභාගී වූ නිළධාරීන් - 2016

| | නම | තනතුර | වැඩසටහන | කාලසීමාව | ස්ථානය |
|---|---|---|---|---|---|
| 01 | එච්. හර්ෂ මධුරංග, එච්.එම්.එච්. උමේන්ද්‍ර | කළමනාකරණ සහකාර | Advance MS Excel for data Analysis | 2016 අප්‍රේල් 29 | AAT Sri Lanka |
| 02 | කේ.ඒ.එන්.දර්ෂනී | කළමනාකරණ සහකාර | CourseinComputerized Accounting | 2016 අප්‍රේල් 03 | AAT Sri Lanka |
| 03 | එන්.ඩී.එස්.එල්. සෙනවිරත්න, ආර්.එන්.එල් දිලිනි, ටී.බී.කේ. සවිත්‍රා, ඒ.එම්. ගම්මන්පිල, එස්.එම්.ඩී. අතුකෝරල, කේ.පී.ඒ.එම්.කේ. ලක්ෂ්මිනී, එස්. තෙනේෂ්කාර්, ඩබ්. කේ. සුවදහැන්නදි, ටී.ඩී. උඩුගම | සහකාර සමුද්‍ර පරිසර නිලධාරී | Workshop on motivation Through Right Attitudes | 2016 අප්‍රේල් 27 | නිපුනතා සංවර්ධන අරමුදල |
| 04 | ඒ.ජේ.අයි.ටී.අබේරත්න මිය | කළමණාකරන සහකාර | Advance Certificate inEnglish for Business &Professional Communication | 2016 අප්‍රේල් 01 | Open University of Sri Lanka |
| 05 | ඒ.ඩී.ඩී සිල්වා, කේ.ඩී.ඩබ්.එස්. කුමාරි | කළමනාකරණ සහකාර | Two Day Workshop on salary Conversion | 2016 මැයි 12 සහ 13 | නිපුනතා සංවර්ධන අරමුදල |
| 06 | ආචාර්ය පී බී ටී ප්‍රදීප් කුමාර, කොමාණ්ඩර් (මාලිමා) ජේ.එම්.බී.එස්.බී ජයවීර ,ඩී.ආර්.සී. ජයවර්ධන ජී.පී.නිලාංජනී මිය,ජී.ඩී.එස්. ප්‍රියදර්ෂිකා මිය,තක්ෂිලා යසරත්න මිය ටී.එම්.එච්.ඩී.තෙන්නකෝන් මිය | සාමාන්‍යාධිකාරී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ගණකාධිකාරී,සහකාර කළමනාකරු (මා.ස.ස) වැ.ආ සහකාර කළමනාකරු (බස්නාහිර/වයඹ),ස.ස.ප.නි | Leade ship & Persona ity Development | **2016 ජුනි 22** | නිපුනතා සංවර්ධන අරමුදල |


| | | | | | |
|---|---|---|---|---|---|
| 07 | එච්.ඒ.අයි. සුරංග,<br>එම්.ටී.ආර්.ජේ. කුමාරසිරි, කේ.ජී.ඩී.කේ.දිසානායක<br>එන්.කේ.අයි.එල්. විජයවර්ධන,<br>ඒ.ජී.අයි.ටී. අබේරත්න<br>ආර්.එස්.ඒ.වී රත්නසිංහ,කේ.ජී.වයි.එල්..කුලසූරිය,<br>ඩබ්.ඩී.කේ. මධුසංඛ, ආර්.පී.ඩී.එච්.සී. රාජපක්ෂ,<br>බී.එන්.ඩී. පෙරේරා, එම්.එම්.ඩී. මුරමුදලි, එච්.ඒ.ඩී<br>එන්.එස්.ගුණවර්ධන, එම්.එම්.ජේ.ඩී. මන්තිලක,<br>එස්.ඩී.ජී.පී. සමරජීව,ආර්.ජී. රාජපුර,<br>කේ.ඒ.එන් දර්ශනි | ලේකම්<br>කළමණාකරන සහකාර | කාර්යාල කලමනාකරණය | 2016 ජූනි 27 | නිපුනතා සංවර්ධන අරමුදල |
| 08 | යු.එල්.ජේ.ඒ.ප්‍රියන්වදා, එච්.එච්. මධුරංග, කේ.ඩී.<br>ඩබ්.එස්. කුමාරි,එච්.එම්.එච්. උමේන්ද්‍රා,<br>එස්.පී.එස්. බණ්ඩාර,බී.ජී.එන්.පී. පෙරේරා,<br>එම්.ඒ.එස්. සුචිත්‍රාංගි, ජී.ඩබ්.ඩී.එම්. කරුණාරත්න,<br>එම්.පී.ඩී.සුරංගි ඩයස්, ආර්.ඒ.යු. රංගනී, ඒ.පී.ජී.<br>වී.එස්. අමරසිංහ,ජේ.එම්.එච්.යු. ජයකොඩි,<br>ටී.ඩී.එම්. පීරිස්, එම්.ආර්.එම්. රිෆ්දි,<br>පී.ආර්. විදානපතිරන,කේ.එම්.අයි. රොෂාන් | කළමණාකරන සහකාර | කාර්යාල කලමනාකරණය | 2016 ජූනි 27 | නිපුනතා සංවර්ධන අරමුදල |
| 09 | ඩී.ආර්.සී. ජයවර්ධන<br>ඩබ්.එච්.ඒ.එස්.කේ. හිටිබණ්ඩාර<br>එස්.ඩී.ජී.පී.සමරජීව,කේ.ඩී.ඩබ්.එස්.කුමාරි | ගණකාධිකාරී,සහකාර කළමනාකරු,(මා.ස.ස)කළම නාකරණ සහකාර | Two Day Workshop on salary Converson | 2016 ජූනි 30<br>ජූලි 01 | නිපුනතා සංවර්ධන අරමුදල |
| 10 | ටී.ඩී.එම්.පීරිස්<br>කේ.ඒ.එන්.දර්ෂණී | කළමනාකරණ සහකාර | දෙමළ භාෂා පාඨමාලාව | 2016 ජූනි මස සිට<br>දෙසැම්බර් මස දක්වා | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව |
| 11 | ඩබ්.අයි.එච්.කේ. විජේරත්න , එච්.පී.ටී.යු. යස<br>එච්.පී.ඒ. චතුරංගි | සහකාර සමුද්‍ර පරිසර නිලධාරී | Worshop on<br>Good Laboraory Practices | 2016 සැප්තැම්බර් 09 | Sri Lanka Association of Testing Laboratories |

| | | | | | |
|---|---|---|---|---|---|
| 12 | එම්.ඒ.එන්.එස්. දිසානයක, ඒ.එච්.ඒ. ශාන්ත | රියදුරු | විද්‍යාත්මක, පිරිමැසුම්දායක සහ ආරක්ෂිත රිය පැදවීම | 2016 සැප්තැම්බර් 06 | Construction Equipment Training Centre |
| 13 | ඒ.ජේ.එම්. ගුනසේකර<br>ආර්.එන්.ප්‍රියදර්ශන<br>එල්.එල්.ආර්.බී.ද සිල්වා, ටී. ශ්‍රීපති<br>ඩබ්.අයි.එච්.කේ. විජේරත්න, ටී.බී.ඒ.එම්. කුමාර<br>පී.එච්.එස්. කුමාර, එම්.පී.එස්. ප්‍රියදර්ශණ,<br>ආර්. රජීහරන්<br>පී. කෝකුලන්, ඩී.එම්.සී.එල්. දිසානායක<br>ජී.කේ.අයි. කුමාර,ආර්.ඩී. සෝමතිලක,<br>ආර්.එම්.ඒ.ඒ. කුමාර, පී.එන්.ඩී. සමරවික්‍රම<br>ඩී.ආර්.සී. ජයවර්ධන<br>බී.එම්.සී.එස්. ගුණතිලක<br>එච්.එච්. මධුරංග, කේ.ජී.වයි.එල්. කුලසූරිය,<br>ඩබ්.ඩී.කේ. මධුසංඛ | කළමනාකරු (මෙහෙයුම්)<br>සහකාර කළමනාකරු (නෞකා)<br>සමුද්‍ර පරිසර නිලධාරී<br>සමුද්‍ර දූෂණය වැළැක්වීමේ ක්.ස.<br>ගණකාධිකාරී<br>සහකාර සමුද්‍ර පරිසර නිලධාරී<br>කළමනාකරණ සහකාර | කිමිදුම්කරණය පිළිබඳ පාඨමාලාව | ඔක්තෝම්බර් - නොවැම්බර් | Blue Deep Diving Centre |
| 14 | කේ.ජී.වයි.එල්. කුලසූරිය , එච්.එච්. මධුරංග | කළමනාකරණ සහකාර | Annual Stock Verification & Disposal of Unserviceable Items | 2016 දෙසැම්බර් 20 | ප්‍රාග් ආයතනය |

## ***විදේශීය පුහුණුවීම් සදහා සහභාගී වූ නිළධාරීන් - 2016***

| | නම | තනතුර | කාල සීමාව | වැඩසටහන | රට |
|---|---|---|---|---|---|
| 01 | සී ඩී ඩබ් සෙනෙවිරත්න මහතා | වැඩබලන සමුද්‍ර පරිසර නිලධාරි | 2016 මාර්තු 07- 10 | Environmental Protection & Management | දෝහ කටාර් |
| 02 | පී එල් එම් සී විජේවර්ණසූරිය මහතා | වැඩබලන සමුද්‍ර පරිසර නිලධාරි | 2016 මැයි 2 – 6 | Science and Innovation in Oil Spill Response | ඔස්ට්‍රේලියා |

| | | | | | |
|---|---|---|---|---|---|
| 03 | ආචාර්ය පී බී ටර්නි ප්‍රදීප් කුමාර | සාමාන්‍යාධිකාරී | 2016 මැයි 18 - 29 | 2016 Royal Colloquium | ස්වීඩන් |
| 04 | එම් ටී කේ දෙල්පච්ත්‍ර මහතා | වැඩබලන සමුද්‍ර පරිසර නිලධාරි | 2016 මැයි 24 - 27 | Oceania Regional Environmental Security Forum | සිංගප්පූරු |
| 05 | ආචාර්ය පී බී ටර්නි ප්‍රදීප් කුමාර | සාමාන්‍යාධිකාරී | 2016 මැයි 4 - 16 | Incorporating Climate Change into Ecosystem Approaches to fisheries and Aquaculture Management | වියට්නාමය |
| 06 | ඒ කාරියවසම් මෙනවිය | කළමනාකරු (නීති) | 2016 ජූනි 8 - 10 | 103rd Session of Legal Committee (LEG) International Maritime Organization (IMO) | ලන්ඩන් |
| 07 | රියර් අද්මිරාල් (විශ්‍රාමික) රෝහණ පෙරේරා | සභාපති | 2016 අගෝස්තු 3 - 9 | 7th Meeting of the Ad Hoc Working Group of the General Assembly on the Regular Process for Global Reporting and Assessment of the state of the Marine Environment | ඇමෙරිකා එක්සත් ජනපදය |
| 08 | ආචාර්ය පී බී ටර්නි ප්‍රදීප් කුමාර<br>කොමාන්ඩ ජේ එම් බී එස් බී ජයවීර මහතා<br>ඒ ජේ එම් ගුණසේකර මහතා | සාමාන්‍යාධිකාරී<br>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)<br>කළමනාකරු (මෙහෙයුම්) | 2016 අගෝස්තු 22 - 25 | Regional Workshop for updating the Regional Contingency Plan & its Annexes in male, Maldives from 22 to 25 August 2016 | මාලදිවයින |
| 09 | රියර් අද්මිරාල් (විශ්‍රාමික) රෝහණ පෙරේරා | සභාපති | 2016 ඔක්තෝම්බර් 24 - 28 | IMO Meeting | ලන්ඩන් |
| 10 | එච් ටී එන් අයි පියදාස මහතා | සහකාර කළමනාකරු (පලාත්) | 2016 අගෝස්තු 18 - 19 | First Global Workshop on Oil Spill Response Planning | ඇමෙරිකා එක්සත් ජනපදය |
| 11 | එල් එල් ආර් බී ද සිල්වා මහතා | සමුද්‍ර පරිසර නිලධාරි | 2016 ඔක්තෝම්බර් 24 - 31 | Overseas Study Tour on "Control & Management" | දකුණු අප්‍රිකාව |


100
90
80
70
60
50
40
30
20
10
0
Local Training
Foreign Training
Local Training
Foreign Training
2015
2016
Number of Training
Number of officers

## 5.5 සැලසුම් අංශය

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සැලසුම් අංශය 2016 වර්ෂයේ මාර්තු මාසදී ස්ථාපිත කරන ලදී. මෙම අධිකාරියේ සංයුක්ත සැලැස්ම හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සහ ප්‍රගතිය පරීක්ෂා කරීම සැලසුම් අංශය විසින් ඉටුකරන ප්‍රධාන කාර්යභාරය වේ.

ඊට අමතරව පහත සඳහන් කාර්යයන්ද මෙම අංශය මඟින් සිදු කරයි.

- සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කිරීම හා සැලසුම් කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩල වෙත සැලසුම් නිර්දේශ ඉදිරිපත් කිරීම.
- මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය වෙත අවශ්‍ය තොරතුරු ලබාදීම.
- සැලසුම් කල ක්‍රියාකාරකම් අධීක්ෂණ හා වාර්තා ඉදිරිපත් කිරීම.
- අංශ අතර සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- වාර්ෂික සැලසුම් සහ පස් අවුරුදු සැලසුම් සකස් කිරීම, අධීක්ෂණය කිරීම හා ඇගයීම
- අවශ්‍යතා අනුව වාර්ෂික සැලසුම් පුනරීක්ෂණය කිරීම
- ආයතනයේ ප්‍රගතිය සමාලෝචනය හා ඒ අනුව ආයතනික ප්‍රතිඵල රාමුව සකස් කිරීම.
- සංවර්ධන ව්‍යාපෘතිවලට අදාල ප්‍රගතිය වාර්තා කිරීම.
- SWOT විශ්ලේෂණය සිදු කිරීම.

## 5.5 මූල්‍ය අංශය

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ මූල්‍ය අංශය එහි මූල්‍ය කළමනාකරණ කටයුතු සඳහා වගකිම දරනු ලබයි. සමස්ථයක් ලෙස සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය කෙරෙහි බලපානු ලබන සියලුම ආර්ථික හා මූල්‍යමය කාරණා සම්බන්ධයෙන් මූල්‍ය සම්පත් ස්ථානගත කිරීම හා සියලුම අරමුණු සඳහා මූල්‍ය සම්පත් බෙදාහැරීම සිදුකරනු ලබයි. කාර්යක්ෂමවත් ඵලදායි ලෙසත් අධිකාරියේ මූල්‍ය සේවා සැපයීමත් ඒ සඳහා මගපෙන්වීම සිදුකිරීමත් සම්බන්ධිකරණ කටයුතු සිදු කිරීම හා පසුවිපරම් කිරීම මගින් අධිකාරියේ මූල්‍ය සම්පත් පාලනය කිරීම මූල්‍ය අංශයේ මූලික අරමුණ වේ.

ක්‍රියාකාරකම්

1. වාර්ෂික අයවැය ඇස්තමේන්තු සැකසීම
2. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම
3. මූල්‍ය ප්‍රකාශන වාර්තා හා මාසික අයවැය පිළිබඳ වාර්තා සැපයීම
4. වැටුප් හා වේතන සඳහා වූ වාර්තා තැබීම හා ගෙවීම් කිරීම
5. ව්‍යාපෘති සක්‍රියව පවත්වාගෙන යාම
6. සියලුම ගෙවීම් කටයුතු
7. ණය හා අත්තිකාරම් සම්බන්ධව ගිණුම් තැබීමේ කටයුතු
8. බැංකු සමග සම්බන්ධිකරණය
9. විගණකාධිපති දෙපාර්තමේන්තුව සමග සම්බන්ධිකරණය
10. ආයෝජන කළමනාකරණය හා අනෙකුත් කටයුතු

වසර තුළදි සිදුකරන ලද විශේෂිත ක්‍රියාකාරකම්

01 වසර තුළදී අධිකාරිය විසින් ජංගම ගිණුමේ ඉතිරිව පවතින ශේෂයන් එක්දින ඉල්ලුම් තැන්පතුවල ආයෝජනය කිරීම මඟින් රුපියල් 1,211,704.17 ක පොලී ආදායමක් උපයා ගැනීමට හැකිවිය.

## 5.5.1 2016 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රගති වාර්තාව - පුනරාවර්තන වියදම්

| වැය විෂය | වැය විෂය විස්තරය | ඇස්තමේන්තුව 2016 | 2016.12.31 දිනට සත්‍ය වියදම | ශේෂය |
|---|---|---|---|---|
| | **පුනරාවර්තන වියදම්** | | | |
| | **පුද්ගල පඩිනඩි** | | | |
| 1001 | වැටුප් හා වේතන | 89,685,000.00 | 89,546,778.00 | 138,222.00 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 2,100,000.00 | 1,382,059.27 | 717,940.73 |
| 1003 | වෙනත් දීමනා | 2,120,000.00 | 2,197,900.00 | (77,900.00) |
| | **මුළු එකතුව** | **93,905,000.00** | **93,126,737.27** | **778,262.73** |
| | **ගමන් වියදම්** | | | |
| 1101 | දේශිය | 3,943,000.00 | 2,987,826.79 | 955,173.21 |
| 1102 | විදේශිය | 3,060,000.00 | 3,059,424.29 | 575.71 |
| | **මුළු එකතුව** | **7,002,000.00** | **6,047,251.08** | **955,748.92** |
| | **සැපයීම්** | | | |
| 1201 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 3,800,000.00 | 1,782,637.51 | 2,017,362.49 |
| 1202 | ඉන්ධන | 3,301,000.00 | 2,099,340.33 | 1,201,659.67 |
| 1205 | වෙනත් | 290,000.00 | 84,000.00 | 206,000.00 |
| | **මුළු එකතුව** | **7,391,000.00** | **3,965,977.84** | **3,425,022.16** |
| | **නඩත්තු වියදම්** | | | |
| 1301 | වාහන | 4,728,000.00 | 3,823,626.40 | 904,373.60 |
| 1302 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 1,699,000.00 | 660,234.88 | 1,038,765.12 |
| 1303 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 500,000.00 | 62,355.00 | 206,000.00 |
| | **මුළු එකතුව** | **6,927,000.00** | **4,546,216.28** | **2,380,783.72** |
| | **සේවා** | | | |
| 1401 | ප්‍රවාහන | - | - | - |
| 1402 | තැපැල් හා සන්නිවේදන | 2,638,000.00 | 1,848,999.03 | 789,000.97 |
| 1403 | විදුලිය සහ ජලය | 3,986,000.00 | 3,479,993.94 | 506,006.06 |
| 1404 | බදු කුලි සහ පළාත් ආයතන බදු | 13,654,000.00 | 13,181,993.92 | 472,006.08 |
| 1405 | වෙනත් පුනරාවර්තන වියදම් | 6,942,000.00 | 5,014,856.51 | 1,927,143.49 |
| | **මුළු එකතුව** | **27,220,000.00** | **23,525,843.40** | **3,694,156.60** |
| | **පුනරාවර්තන වියදම් එකතුව** | **142,446,000.00** | **131,212,025.87** | **11,233,974.13** |

## 5.5.2 2016 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රගති වාර්තාව - ප්‍රාග්ධන වියදම්

| වැය විෂය | වැය විෂය විස්තරය | ඇස්තමේන්තුව 2016 | 2016.12.31 දිනට සත්‍ය වියදම | 2016.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| | **ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම.** | | | |
| 2001 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1,000,000.00 | 981,855.47 | 18,144.53 |
| 2002 | පිරියත යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 600,000.00 | 517,159.54 | 82,840.46 |
| 2003 | වාහන | 1,000,000.00 | 579,129.36 | 420,870.64 |
| | **එකතුව** | **2,600,000.00** | **2,078,144.37** | **521,855.63** |
| | **ප්‍රාග්ධන වත්කම් අත්පත්කර ගැනීම** | | | |
| 2101 | වාහන | - | - | - |
| 2102 | ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 2,000,000.00 | 1,991,624.08 | 8,375.92 |
| 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 2,000,000.00 | 1,973,731.44 | 26,268.56 |
| 2104 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 35,000,000.00 | 34,514,417.00 | 485,583.00 |
| | **එකතුව** | **39,000,000.00** | **38,479,772.52** | **520,227.48** |
| 2401 | ධාරිතා වර්ධනය හා පුහුණුව (මානව සම්පත් සංවර්ධන) | | | |
| | 1.සේවක පුහුණු වැඩසටහන් | 1,600,000.00 | 1,585,281.00 | 14,719.00 |
| | 2. පොත් සහ සගරා මිලදී ගැනීම | 200,000.00 | 199,919.00 | 81.00 |
| | 3.සුභසාධක පහසුකම් දියුණු කිරීම | 150,000.00 | 140,089.00 | 9,911.00 |
| | **එකතුව** | **1,950,000.00** | **1,925,289.00** | **24,711.50** |
| 2502 | අනෙකුත් ප්‍රාග්ධන වියදම් | | | |
| | 1.හදිසි තෙල් හා රසායන ද්‍රව්‍ය විසිරීමකදී ඇතිවිය හැකි බලපෑම් පාලනය | 8,273,000.00 | 8,133,413.42 | 139,586.58 |
| | 2.ජාත්‍යන්තර සම්මුතීන්ට අනුකූලව කටයුතු කිරීම හා නීතිමය රාමුව ශක්තිමත් කිරීම. | 1,100,000.00 | 904,203.58 | 195,796.42 |
| | 3.වෙරළාශ්‍රිත මුහුදු ජලයේ ගුණාත්මක තත්ත්වය නිරීක්ෂණය | 8,288,000.00 | 6,640,778.10 | 1,647,221.90 |
| | 4.නෞකා මඟින් සිදුවන දූෂණය අවම කිරීම | 2,275,000.00 | 2,196,480.27 | 78,519.73 |
| | 5.ධීවර වරාය මඟින් සිදුවන සමුද්‍ර දූෂණය වැලැක්වීමේ ජාතික ව්‍යාපෘතිය | 573,000.00 | 515,425.91 | 57,574.09 |
| | 6.විද්‍යාගාර පහසුකම් වැඩිදියුණු කිරීම | 4,650,000.00 | 1,060,493.50 | 3,589,506.50 |
| | 7.සමුද්‍ර අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වන නීතිමය රාමුව ශක්තිමත් කිරීම | 1,073,000.00 | 841,252.04 | 231,747.96 |
| | 8.නාන තොටුපල සංවර්ධනය කිරීම සහ සමුද්‍ර ජල දූෂණය වැලැක්වීම | 5,066,000.00 | 4,560,874.20 | 505,125.80 |
| | 9.සමුද්‍ර පරිසර පද්ධතිය සඳහා සමුද්‍ර දූෂණ බලපෑම ඇගයීම | 200,000.00 | 184,417.00 | 15,583.00 |
| | 10.දේශගුණ විපර්යාස සඳහා අනුගත වීම | 642,000.00 | 589,303.00 | 52,697.00 |
| | 11.ප්‍රදර්ශන කුටි නිර්මාණය | 800,000.00 | 186,603.63 | 613,396.37 |
| | 12.පාසල් කණ්ඩායම් ස්ථාපිත කිරීම | 2,516,000.00 | 1,520,386.35 | 995,613.65 |
| | 13.ජාතික වැඩසටහන් | 6,632,000.00 | 6,671,098.66 | (39,098.66) |
| | 14.ප්‍රදේශයන් අධීක්ෂණය සහ සම්බන්ධීකරණය | 362,000.00 | 304,519.28 | 57,480.72 |
| | 15.ප්‍රාදේශිය කාර්යාල ස්ථාපිත කිරීම | 4,000,000.00 | 3,934,074.58 | 65,925.42 |
| | **එකතුව** | **46,450,000.00** | **38,243,323.52** | **8,206,676.48** |
| | **මුළු ප්‍රාග්ධන වියදම් එකතුව** | **90,000,000.00** | **80,726.528.91** | **9,273,471.09** |

# 6 අධිකාරියේ මුල්‍ය ප්‍රකාශන

## 6.1 ගිණුම්කරන ප්‍රතිපත්ති

**6.1.1 සංස්ථාමය තොරතුරු**

2008 අංක 35 දරණ සමුද්‍ර දූෂණ වැලැක්වීමේ පනත යටතේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය ස්ථාපිත කර ඇත. අංක 758 බේස්ලයින් පාර. කොළඹ 09 යන ස්ථානයේ අධිකාරියේ ප්‍රධාන කාර්යාලය ස්ථාපිත කර ඇත.

**6.1.2 අධිකාරියේ ප්‍රමුඛ කාර්යභාරය හා මෙහෙයුම්වල ස්භාවය.**

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ මූලික කර්තව්‍ය වනුයේ නියෝගයන් ඵලදායීව බලාත්මක කිරීම, අදාළ වන ජාත්‍යන්තර සම්මුතීන්වල ප්‍රතිපාදන ක්‍රියාවට නැංවීම, ආශ්‍රිත පාර්ශවයන් හා සම්පත් සම්බන්ධිකරණය හා ස්ථානගත කිරීම තුළින් වර්තමානයට හා අනාගතය සඳහා සමුද්‍රීය පරිසරය තිරසාරි ලෙස කළමනාකරණය කිරීම පිණිස ශ්‍රී ලංකා සමුද්‍ර තිරයන්හි සමුද්‍ර දූෂණය වැලැක්වීම, පාලනය කිරීම හා කළමනාකරණය කිරීමයි.

**6.1.3 සාමාන්‍ය ගිණුම්කරන ප්‍රතිපත්ති**

6.1.3.1 **මුල්‍ය වාර්තා පිළියෙල කිරීමේ පදනම**

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ මුල්‍ය ප්‍රකාශය, මුල්‍ය තත්ත්ව ප්‍රකාශය, මුල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ගිණුම්කරණ ප්‍රතිපත්ති හා මුල්‍ය ප්‍රකාශන සඳහා සටහන් වලින් සමන්විත වේ. මෙම මුල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ප්‍රකාශයට පත්කර ඇති රාජ්‍ය අංශයේ ගිණුම්කරන ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කොට ඇත.

ශ්‍රී ලංකා රාජය අංශය සඳහා වූ ගිණුම්කරන ප්‍රමිත 2011 සිට බලාත්මක වුවද සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් එම ප්‍රමිත 2010 සිට බලාත්මක වන පරිදි මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා භාවිතා කර ඇත.
මුලය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත අංක 01 ට අනුව ඉදිරිපත් කර ඇති අතර රාජ්‍ය අංශ ප්‍රමිත නිකුත් කොට නොමැති අවස්ථාවලදී ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා භාවිතා කර ඇත.

6.1.3.2 පොදුවේ පිළිගත් ගිණුම්කරන ප්‍රතිපත්ති සහ ඓතිහාසික පිරිවැය පදනම් කරගෙන 2016 වසර සඳහා මුල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

6.1.3.3 ගිණුම් කෙරෙහි බලපාන උද්ධමන සාධකය සඳහා ගැලපීම් සිදු කර නොමැත.

6.1.3.4 ආදායම් සහ වියදම් උපචිත පදනම මත ගිණුම්ගත කර ඇත.

6.1.3.5 අතීත ක්‍රියාකාරකමක් හේතුවෙන් වර්තමානයේ පැන නැගී ඇති වගකීමක් මුල්‍ය තත්ත්ව ප්‍රකාශයට ඇතුලත් කිරීම සිදුකරනු ලබන්නේ වගකීම පියවීම සඳහා ආර්ථිකමය ප්‍රතිලාභ සහිත සම්පත් පිටතට ගලායාමක් ඇතිවේ යැයි අපේක්ෂා කරන අවස්ථාවලදී පමණි.

6.1.3.6 මුල්‍ය ප්‍රකාශව දිනයේ සිට ඉල්ලුවිට ගෙවිය යුතු ණයහිමියන් හා වසරක් තුළදී පියවිය යුතු වගකීම් මුල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් ලෙස දක්වා ඇත.

6.1.3.7 ඉල්ලුවිට ගෙවිය යුතු නොවන තුළ පියවිය යුතු වගකිම් මුලා තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන වගකිම් ලෙස දක්වා ඇත.

### 6.1.4 දේපල, පිරියත සහ උපකරණ

6.1.4.1 දේපල, පිරියත සහ උපකරණ ඒවායේ පිරිවැය මත වාර්තා කරනු ලබයි. ප්‍රයෝජනවත් ජීව කාලය මත ඒවා භාවිතා කරන අරමුණ සඳහා යොදා ගන්නා අවස්ථාවේ සිට සරල මාර්ග ක්‍රමයට ක්ෂය කිරිම සිදුකරනු ලබයි. ක්ෂය කිරිම සඳහා භාවිතා කරන ක්ෂය අනුපාතයන් පහත දැක්වේ.

| වත්කම් | ක්ෂය ප්‍රතිශතය |
|---|---|
| මෝටර් රථ | 20% |
| පරිගණක ආශ්‍රිත උපකරණ | 15% |
| කාර්යාලීය උපකරණ | 15% |
| ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ | 10% |
| විද්‍යාගාර හා තාක්ෂණික උපකරණ | 10% |
| පොත්පත් | 10% |
| ප්‍රදර්ශන ආකෘති | 20% |

6.1.4.2 දේපල, පිරියත සහ උපකරණ මිලදිගත් කාර්යය සඳහා එය භාවිතා කිරිමට හැකි අවස්ථාවේදි එම වත්කම ක්ෂය කිරිම ආරම්භ කරන අතර, ක්ෂය කිරිම සරල මාර්ග ක්‍රමය මත වත්කමේ ප්‍රයෝජනවත් ජීව කාලය තුල සිදුකරනු ලබයි.

### 6.1.5 ආදායම

ශ්‍රී ලංකා රජයෙන් ලැබෙන් ප්‍රදාන අධිකාරියේ ප්‍රධාන ආදායම් මාර්ගය වේ. මෙයට අමතරව අධිකාරිය විසින් පහත ක්‍රියාකාරකම් සම්බන්ධව බලපත්‍ර නිකුත් කිරිම මගින් සැලකිය යුතු මෙහෙයුම් අදායමක් උපයා ගනු ලබයි.

නෞකා සඳහා අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහන පහසුකම් සැපයීම සඳහා ණයහිමියන් හා වසරකට වඩා වැඩි කාලයක

1. ඛණිජ තෙල් ගවේශන කටයුතු කිරිම සඳහා බලපත්‍ර නිකුත් කිරිම.
2. බංකරින් කටයුතු සඳහා බලපත්‍ර නිකුත් කිරිම.
3. තෙල් විසිරිම් පාලන ක්‍රියාකාරි සැලසුම් අනුමත කිරිම.
4. අපද්‍රව්‍ය බැහැරකිරීම් සඳහා බලපත්‍ර නිකුත් කිරිම.

### 6.1.5.1 අධිකාරිය මගින් ජනනය කරන ආදායම

අධිකාරිය මගින් ජනනය කරනු ලබන අදායම උපචිත පදනම මත හදුනාගනු ලබයි.

6.1.5.2 රජයෙන් ලැබෙන ප්‍රදාන

අධිකාරියට ප්‍රාග්ධන සහ පුනරාවර්තන ලෙස වර්ග දෙකක ප්‍රදාන ලැබේ. ප්‍රදාන සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන ගිණුම් ප්‍රතිපත්තිය පහත දැක්වේ.

### 6.1.5.3 ප්‍රාග්ධන ප්‍රදාන

6.1.5.4 දේපල, පිරියත සහ උපකරණ මිලට ගැනිම හා ඉදිකිරිම සඳහා ලැබෙන ප්‍රදාන අදාල වත්කම්වල ප්‍රයෝජනවත් ජීවකාලය තුළ ආදායම හැටියට හඳුනාගැනීම සිදු කරනු ලබයි.

6.1.5.5 ශ්‍රී ලංකාව වටා සිදුවිය හැකි සමුද්‍ර දූෂණය වැලැක්විම ආශ්‍රිත කටයුතු සඳහා ලැබෙන ප්‍රදාන අස්පෘශ්‍ය වත්කම් නිර්මාණය සිදු වුවද අස්පෘශ්‍ය වත්කම් හදුනාගැනිමේ නිර්ණායකයන් සම්පූර්ණ විමක් සිදුනොවන බැවින් සමුද්‍ර දූෂණ වැලැක්විමේ ක්‍රියාකාරකම් සඳහා දරනු ලබන වියදම් සඳහා ලැබෙන ප්‍රදාන අදාල ක්‍රියාකාරකම් සිදුකරනු ලැබු වර්ෂයේ අදායමක් ලෙස හදුනාගැනිම සිදුකරනු ලබයි

### 6.1.5.6 පුනරාවර්තන ප්‍රදාන

පුනරාවර්තන වියදම් සඳහා ලැබෙන ප්‍රදාන අදාල වර්ෂය තුළ ම අදායමක් හැටියට හදුනාගනු ලැබේ.

### 6.1.6 සේවක ප්‍රතිලාභ
#### 6.1.6.1 නියත දායකත්ව සැලසුම්
දායකත්ව ප්‍රතිලාභ සඳහා වන වගකීමට අදාල වන වියදම් දරණ කාලපරිච්ඡේදය තුළ වියදමක් ලෙස හඳුනාගනු ලැබේ. සේවකයනගේ දළ වැටුප පදනම් කරගෙන සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට සහ සේවක අර්ථසාධක අරමුදලට පිළිවෙලින් 3% සහ 15% ක දායකත්වය අධිකාරිය විසින් දරනු ලබයි.

#### 6.1.6.2 නියත ප්‍රතිලාභ සැලසුම
පාරිතෝෂිතය නියත ප්‍රතිලාභ සැලසුම වේ. අදාළ වන ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන මත සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය පාරිතෝෂිත ගෙවීමට බැඳි සිටී. මෙම වගකීම සඳහා වෙන් කිරිමක් මුල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා ඇත. මෙම මුදල ගණනය කරනු ලබන්නේ සේවකයාගේ වර්ෂ අවසාන වැටුපෙන් භාගයක් ඔහු සම්පූර්ණ කරන ලද සේවා කාලයෙන් වැඩි කිරිමෙනි. සේවා කාලය ගණනය කරනු ලබන්නේ සේවයේ පළමු වසරේ සිටයි. 1983 අංක 12 දරණ පාරිතෝසිත ගෙවීම් පනත යටතේ සියලුම සේවකයන් සඳහා පාරිතෝෂිතය සඳහා වෙන් කිරිමක් සිදුකර ඇත. මෙම වෙන්කිරිම මුල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන වගකීම් යටතේ දක්වා ඇත.

### 6.1.7 සන්සන්දනාත්මක තොරතුරු
ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරිම තහවුරු කිරිම සඳහා අවශ්‍ය අවස්ථාවලදි සන්සන්දනාත්මක තොරතුරු නැවත සකස් කර ඇත.

### 6.1.8 ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්
සියලු ප්‍රමාණාත්මක ශේෂපත්‍ර දිනට පසු සිදුවීම් සලකා බලන ලද අතර ගැලපුම් කිරිම සඳහා අවශ්‍ය වන අවස්ථාවලදි හෝ හෙලිදරව් කිරිම පවතින තොගය නිශ්චිතව ගණනය කිරීමට ඇති ප්‍රායෝගික දුෂ්කරතාවය සහ සමහර වීදුරු උපකරණ ඉතා කෙටි කාලපරිච්ඡේදයක් තුළදී භාවිතයෙන් ඉවත් කොට නැවත ලබගැනීමට සිදු අවශ්‍ය වන අවස්ථාවලදි අදාල තොරතුරු සටහන් වශයෙන් මූලය ප්‍රකාශනවල ඇතුළත් කොට ඇත.

### 6.1.9 මුදල් ප්‍රවාහ ප්‍රකාශය
මුදල් ප්‍රවාහ ප්‍රකාශය වක්‍ර ක්‍රමය භාවිතා කොට සකස් කර ඇත.

### 6.1.10 වාර්තා කරන හා ඉදිරිපත් කරන මුදල් වර්ගය
මූල්‍ය ප්‍රකාශන ශ්‍රි ලංකා රුපියල්වලින් ඉදිරිපත් කොට ඇත. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ වාර්තා කරන මුදුල් ඒකකයද ශ්‍රි ලංකා රුපියල් වේ.

- **තොගය**

වසර තුළ භාවිතා කරන ලද තොගයෙහි පිරිවැය පදනම් කරගෙන මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශයට මාරු කිරීම සිදුකරනු ලබයි. වසර අවසානයේ ඉතිරි තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයන් දෙකෙන් වඩා අඩු අගයට අගය කරනු ලබයි.

- **පුස්තකාල පොත්**

පුස්තකාල පොත් ඒවායේ පිරිවැය මත වාර්තා කර ඇත. ප්‍රයෝජනවත් ජීව කාලය මත සරල මාර්ග ක්‍රමය පදනම් කර ගනිමින් මෙම පොත් ක්ෂය කිරීම සිදුකරනු ලබයි.

- **රසායන ද්‍රව්‍ය සහ විදුරු උපකරණ තොග**

රසායන ද්‍රව්‍ය සහ විදුරු උපකරණවල මිලදී ගැණුම් පිරිවැය අදාල මිලදී ගැනීම සිදුවූ කාල පරිච්ඡේදය තුළදීම මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශයට මාරු කිරීම රසායන ද්‍රව්‍ය සහ විදුරු උපකරණ සම්බන්ධයෙන් වන අධිකාරියේ ප්‍රතිපත්තිය වේ. මෙම ක්‍රමවේදය භාවිතා කිරීම සිදුකරනු ලබන්නේ රසායන ද්‍රව්‍යවල වර්ෂය අවසානයේ වීමයි. කෙසේ වුවද විද්‍යාගාරය විසින් රසායන ද්‍රව්‍ය සහ වීදුරු උපකරණ සඳහා තොග ලෙජරයක් පවත්වාගෙන යනු ලබයි.

.

# 6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
2016 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| වත්කම් | සටහන | 2016<br>රු | 2015<br>රු |
|---|---|---|---|
| **ජංගම වත්කම්** | | | |
| මුදල් ශේෂය | 10 | 30,024,657.89 | 29,181,624.75 |
| ණයගැතියෝ | 11 | 48,999.90 | 60,152.52 |
| තැන්පතු | 12 | 2,596,000.00 | 2,091,000.00 |
| ඉදිරියට කල ගෙවීම් | 13 | 2,204,656.60 | 1,666,487.02 |
| කෙටිකාලීන ආයෝජන(භාණ්ඩාගාර බිල්පත්) | 29 | 15,816,119.87 | 14,750,372.00 |
| අයකර ගත යුතු සේවක ණය | 14 | 5,267,412.05 | 4,806,479.09 |
| තොගය | 28 | 4,182,303.30 | 4,417,793.50 |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපලපිරියත සහ උපකරණ , | 09 | 114,822,734.84 | 65,831,860.85 |
| **මුළු වත්කම්** | | 174,962,884.45 | 122,752,781.78 |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| උපචිත ගෙවීම් | 15 | 23,001,605.19 | 9,409,665.57 |
| කලින් ලද ආදායම් | 24 | 2,398,767.00 | 773,082.19 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| ආපදා ණය සඳහා මුදල | 16 | 7,443,319.99 | 7,241,779.43 |
| පාරිතෝෂිත සඳහා වෙන්කිරිම | 17 | 13,736,758.00 | 10,931,250.00 |
| **මුළු වගකීම්** | | **46,581,834.27** | **28,355,777.19** |
| **ශුද්ධ වත්කම්** | | **128,381,834.27** | **93,890,793.04** |
| **හිමිකම්** | | | |
| රජයේ ප්‍රදාන සහ ප්‍රාග්ධනය (විලම්බිත ප්‍රදාන) | 18 | 80,308,318.58 | 65,778,874.32 |
| වැඩ නිමවී නොමැති ප්‍රාග්ධන වියදම් (ගොඩනැගිලි) | 20 | 34,514,417.00 | - |
| වැඩ නිමවී නොමැති ප්‍රාග්ධන වියදම් | 26 | 12,048,760.59 | 25,207,173.31 |
| තොග සඳහා ප්‍රාග්ධන යෙදවුම් | 25 | 3,858,594.00 | 3,858,594.00 |
| සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ අරමුදල | 22 | 17,416,123.94 | 16,350,374.68 |
| උපචිත හිගයඅතිරික්තය/ | 21 | (19,764,379.11) | (16,798,010.99) |
| **මුළු හිමිකම්** | | **128,381,834.27** | **93,890,793.04** |

# 6.3 මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය

## සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
## 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය

| ආදායම | සටහන | 2016<br>රු | 2015<br>රු |
|---|---|---|---|
| භාණ්ඩාගාර ප්‍රදාන | 1 | 196,990,302.56 | 141,221,723.01 |
| ලියාපදිංචි කිරීම් හා බලපත්‍ර ගාස්තුව | 2 | 17,430,909.42 | 12,959,886.99 |
| වෙනත් ආදායම් | 3 | 5,029,616.86 | 2,910,944.39 |
| **මුළු ආදායම** | | **219,450,828.84** | **157,086,624.55** |
| **වියදම්** | | | |
| වැටුප් හා වේතන ගෙවීම් | 4 | 96,641,764.42 | 85,360,458.55 |
| සැපයුම් හා පරිභෝජන ද්‍රව්‍ය වියදම් | 5 | 8,747,684.32 | 7,370,861.27 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 6 | 29,518,860.70 | 23,651,730.11 |
| ප්‍රදාන හා මාරු කිරීම් | 7 | 71,654,455.72 | 27,847,538.73 |
| මූල්‍ය වියදම් | 8 | 54,533.78 | 34,560.00 |
| ස්ථාවර වත්කම් ක්ෂය වීම් | 9 | 15,800,198.02 | 16,097,155.46 |
| **මුළු වියදම්** | | **222,417,196.96** | **160,362,304.12** |
| කාලපරිච්ඡේදය සඳහා<br>ඌණතාවයඅතිරික්තය/ | | **(2,966,368.12)** | **(3,269,749.73)** |

# 6.4 හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

| | ප්‍රාග්ධන ප්‍රදාන | තොගයට අදාල ප්‍රදාන | භාවිතයට පවතින ප්‍රාග්ධනය ප්‍රදාන | වැඩ කරමින් පවතින ගොඩනැගිලි සඳහා ප්‍රාග්ධන ප්‍රදාව | අරමුදල | සමුච්චිත හිගයඅතිරික්තය/ | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 2016.01.01 දිනට ශේෂය | 65,778,874.32 | 3,858,594.00 | 25,207,173.31 | - | 16,350,374.68 | (16,798,010.99) | 94,397,005.32 |
| **ගිණුම්කරන ප්‍රතිපත්ති වෙනස්වීම** | | | | | | | |
| ප්‍රාග්ධන ගිණුමට මාරු කිරීම් | | | 4,298.14 | | | | |
| 2016.01.01 දිනට ගලපන ලද ශේෂය | 65,778,874.32 | 3,858,594.00 | 25,211,471.45 | - | 16,350,374.68 | (16,798,010.99) | 94,397,005.32 |
| ප්‍රාග්ධන අරමුදල් ලැබීම | 142,306,041.67 | - | - | - | - | - | 142,306,041.67 |
| ප්‍රාග්ධන ප්‍රදාන ආදායමට මාරු කිරීම. | (9,271,871.09) | - | 9,271,871.09 | - | - | - | - |
| භාවිතයට පවතින ප්‍රාග්ධනය ප්‍රදාන මාරු කිරීම් | - | - | (22,434,581.95) | - | - | - | (22,434,581.95) |
| වැඩ නිම වී නොමැති ගොඩනැගිලි | (34,514,417.00) | - | - | 34,514,417.00 | - | - | - |
| පොළී ආදායම් ලැබීම් | - | - | - | - | 1,065,749.26 | - | 1,065,749.26 |
| ප්‍රාග්ධන ප්‍රදාන ආදායමට මාරු කිරීම. | (83,990,308.56) | - | - | - | - | - | (83,990,308.56) |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තයඌණතාවය/ | - | - | - | - | - | (2,966,368.12) | (2,966,368.12) |
| **2016.12.31 දිනට ශේෂය** | **80,308,319.34** | **3,858,594.00** | **12,048,760.59** | **34,514,417.00** | **17,416,123.94** | **(19,764,379.11)** | **128,381,835.03** |

# 6.5 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
2016 වසර සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2016 | 2015 |
|---|---|---|
| මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ මුදල් ප්‍රවාහය | | |
| කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/ ඌණතාවය | (2,966,368.12) | (3,269,749.73) |
| **ගැලපුම් කිරිම** | | |
| වර්ෂය සඳහා ක්ෂය වෙන්කිරිම | 15,800,198.02 | 16,097,155.46 |
| වත්කම් ඉවත්කිරීමේ අලාභය | - | 7,971.01 |
| අත්තිකාරම් වියදමට මාරු කිරිම | - | (447,043.50) |
| පාරිතෝෂිත සඳහා වෙන්කිරිම | 3,515,027.15 | 1,796,190.00 |
| අත්තිකාරම් වියදමට මාරු කිරිම | 4,298.14 | - |
| පාරිතෝෂිත ගෙවීම් | (709,519.15) | - |
| හදුනාගත් ආදායම් ඉකුත් වර්ෂවල ප්‍රදානයන්ගෙන් | (83,990,308.56) | (43,999,723.01) |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් අතිරික්තය/ ඌණතාවය** | **(68,346,672.52)** | **(29,815,199.77)** |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්** | | |
| තැන්පතු (අඩුවීම/වැඩිවීම) | (505,000.00) | (61,500.00) |
| පෙර ගෙවුම්(වැඩිවීම/අඩුවීම) | (538,169.58) | 405,292.67 |
| ණයගැතියන්ගෙන්(වැඩිවීම/අඩුවීම) | 11,152.62 | (12,895.52) |
| ජංගම බැරකම්වලින්(වැඩිවීම/අඩුවීම) | 13,591,939.62 | (6,133,939.80) |
| තොගය(අඩුවීම/වැඩිවීම) | 235,490.20 | (559,199.50) |
| **මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(55,551,259.66)** | **(36,177,441.92)** |
| **ආයෝජන කටයුතු** | | |
| භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය | (15,816,119.87) | (14,750,372.00) |
| භාණ්ඩාගාර බිල්පත් කල්පිරිම | 14,750,372.00 | 13,916,148.17 |
| දේපලපිරියත හා උපකරණ මිලදී ගැනිම , | (30,329,642.96) | (16,975,439.53) |
| වැඩ නිම වී නොමැති ගොඩනැගිලි | (34,514,417.00) | - |
| භාණ්ඩාගාර බිල්පත් ආයෝජන පොළී | 1,065,749.26 | 834,224.55 |
| කාර්යමණ්ඩල ණයෙන් ලද ණය පොළිය | 202,140.56 | 261,218.60 |
| කාලපරිච්ඡේදයේ කාර්යමණ්ඩල ණය (වැඩිවීම/අඩුවිම) | (460,392.96) | 353,024.09 |
| කලින් ලද ආදායම | 1,625,684.81 | (680,136.99) |
| ඉවත්කල වත්කම් | - | 47,058.00 |
| **ආයෝජන කටයුතු වලින් ශුද්ධ ජනනය වූ මුදල් ප්‍රවාහය** | **(63,477,166.16)** | **(16,994,275.11)** |
| **මුල්‍යනය කටයුතු** | | |
| ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන | 119,871,458.96 | 50,500,000.00 |
| බැංකු ගාස්තු මහජන බැංකුව | - | (4,292.45) |
| **මුල්‍යය කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **119,871,458.96** | **50,495,707.55** |
| **කාලපරිච්ඡේදය තුළ මුදල් හා මුදල්වලට සමාන දෑ වල ශුද්ධ අඩුවීම/වැඩිවීම** | **843,033.14** | **(2,676,009.49)** |
| වසර ආරම්භයේදි මුදල් හා මුදල් වලට සමාන දෑ | **29,181,624.75** | **31,857,634.23** |
| වසර අවසානයේදි මුදල් හා මුදල් වලට සමාන දෑ | **30,024,657.89** | **29,181,624.74** |

# 6.6 මුල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
## මුල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| සටහන 01 | භාණ්ඩාගාරයේ ප්‍රදාන | |
|---|---|---|
| | **2016** | **2015** |
| පුනරාවර්තන ප්‍රදාන | 112,999,994.00 | 97,222,000.00 |
| ආදායමට ප්‍රාග්ධන ප්‍රදාන මාරුව -ප්‍රවර්තන වර්ෂය | 68,190,110.62 | 27,847,538.73 |
| ආදායමට ප්‍රාග්ධන ප්‍රදාන මාරුව - විලම්බිත ප්‍රදාන | 15,800,197.94 | 16,152,184.28 |
| | **196,990,302.56** | **141,221,723.01** |

| සටහන 02 | ගාස්තු දඩ මුදල් හා බලපත්‍ර ගාස්තු | |
|---|---|---|
| | **2016** | **2015** |
| අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහන සේවයලියාපදිංචි ගාස්තු - | 3,446,000.00 | 3,995,000.00 |
| අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහන සේවය ගාස්තුබලපත්‍ර - | 9,742,594.35 | 6,578,750.00 |
| අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහන සේවය-ඉල්ලුම්පත්‍ර ගාස්තු | 46,500.00 | 54,000.00 |
| බංකරින් ඉල්ලුම්පත්‍ර ගාස්තු | 12,000.00 | 19,000.00 |
| බංකරින් ලියාපදිංචිය 2015 | 1,650,000.00 | 1,560,000.00 |
| Road Tunker ලියාපදිංචිය | 81,000.00 | 40,000.00 |
| NOSCOP ඉල්ලුම්පත්‍ර ගාස්තු | 50,000.00 | - |
| Dumping ආදායම | 2,402,815.07 | 713,136.99 |
| | **17,430,909.42** | **12,959,886.99** |

| සටහන 03 | වෙනත් ආදායම් | |
|---|---|---|
| | **2016** | **2015** |
| සැපයුම්කරුවන්ගේ ලියාපදිංචි ගාස්තු | 284,000.00 | 167,000.00 |
| වෙනත් ආදායම් | 371,655.49 | 2,114,404.56 |
| පොත් අත්තිකාරම් පොළිය | 4,257.20 | 5,134.50 |
| පොළී ආදායම් | 1,211,704.17 | 624,405.33 |
| අනුග්‍රාහක ප්‍රදාන | 3,158,000.00 | - |
| | **5,029,616.86** | **2,910,944.39** |

| සටහන 04 | වැටුප් හා සේවක ප්‍රතිලාභ ගෙවීම | |
|---|---|---|
| | **2016** | **2015** |
| වැටුප් හා වේතන | 89,546,778.00 | 82,159,052.32 |
| අතිකාලනිවාඩු දින ගෙවීම්/ | 1,382,059.27 | 880,966.23 |
| වෙනත් දීමනා | 2,197,900.00 | 524,250.00 |
| පාරිතෝෂිත සඳහා වෙන්කිරීම් | 3,515,027.15 | 1,796,190.00 |
| | **96,641,764.42** | **85,360,458.55** |

| සටහන **05** | සැපයුම් හා භාවිතාකල පාරිභෝජන භාණ්ඩ | |
|---|---|---|
| සැපයුම් 05.01 | **2016** | **2015** |
| ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 2,018,127.71 | 749,951.38 |
| ඉන්ධන සහ ලිහිසි තෙල් | 2,099,340.33 | 1,550,054.44 |
| නිල ඇඳුම් | 84,000.00 | 179,500.00 |
| | **4,201,468.04** | **2,479,505.82** |
| නඩත්තු වියදම් 05.02 | **2016** | **2015** |
| වාහන නඩත්තු වියදම් | 3,823,626.40 | 3,261,544.66 |
| පිරියත සහ උපකරණ නඩත්තු වියදම්යන්ත්‍ර , | 660,234.88 | 1,436,752.57 |
| කාර්යාල නඩත්තු වියදම් | 62,355.00 | 193,058.22 |
| | **4,546,216.28** | **4,891,355.45** |

| සටහන **06** | වෙනත් පුනරාවර්තන වියදම් | |
|---|---|---|
| ගමන් වියදම් 06.01 | **2016** | **2015** |
| දේශීය ගමන් වියදම් | 2,987,826.79 | 2,236,337.30 |
| විදේශීය ගමන් වියදම් | 3,059,424.29 | 1,982,156.45 |
| | **6,047,251.08** | **4,218,493.75** |
| ගිවිසුම් ගත සේවා 06.02 | | |
| විදුලි සංදේශ තැපැල් ගාස්තු/ | 1,848,999.03 | 1,403,270.06 |
| විදුලි බලය සහ ජල වියදම් | 3,479,993.94 | 2,948,663.76 |
| කාර්යාල කුලී | 13,181,993.92 | 10,937,146.22 |
| වෙනත් ගිවිසුම්ගත සේවා | 4,960,322.73 | 4,144,156.32 |
| | **23,471,309.62** | **19,433,236.36** |

| සටහන **07** | ප්‍රදාන සහ අනෙකුත් මාරු කිරීම් | |
|---|---|---|
| | **2016** | **2015** |
| වසර සඳහා වූ මුළු ප්‍රාග්ධන ප්‍රදාන | 142,306,041.67 | 67,554,428.81 |
| අඩුකලා: | | |
| ප්‍රාග්ධන වත්කම්මිලට ගැනිමසඳහා යොදාගත්ප්‍රදාන | (30,329,642.96) | (16,975,439.53) |
| වැඩ නිම වී නොමැති ගොඩනැඟිලි | (34,514,417.00) | - |
| වැඩ නිම වි නොමැති ප්‍රාග්ධන වියදම් | (9,271,871.09) | (22,731,450.55) |
| වසර තුළ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශයට මාරු කිරීම් | **68,190,110.62** | **27,847,538.73** |

| සටහන **08** | මූල්‍ය වියදම් | |
|---|---|---|
| | **2016** | **2015** |
| බැංකු ගාස්තු | 54,533.78 | 34,560.00 |
| | **54,533.78** | **34,560.00** |

| සටහන 09 | දේපලපිරියත හා උපකරණ ක්ෂයවිම්, | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| වත්කම් වර්ගය | පිරිවැය-2016 | | | ක්ෂය – 2016 | | | ලියාහල අගය |
| | 01.01.2016 | එකතු විම | 31.12.2016 | 01.01.2016 | එකතු විම | 31.12.2016 | |
| *මෝටර් රථ* | *57,676,699.63* | *-* | *57,676,699.63* | *39,679,721.19* | *7,556,799.76* | *47,236,520.95* | *10,440,178.68* |
| *දැව භාණ්ඩ සහ කාර්යාලඋපකරණ* | *36,025,814.81* | *12,448,916.71* | *48,474,731.52* | *17,720,419.65* | *3,966,558.94* | *21,686,978.59* | *26,787,752.93* |
| *තාක්ෂණික උපකරණ* | *41,411,230.78* | *17,571,607.25* | *58,982,838.08* | *12,564,589.61* | *4,193,168.80* | *16,757,758.40* | *42,225,079.63* |
| *පුස්තකාල පොත්* | *778,569.50* | *309,119.00* | *1,087,688.50* | *148,711.36* | *83,670.52* | *232,381.89* | *855,306.61* |
| *වැඩ නිම වි නොමැති ගොඩනැගිලි* | *-* | *34,514,417.00* | *34,514,417.00* | *-* | *-* | *-* | *34,514,417.00* |
| *එකතුව* | *135,892,314.72* | *64,844,059.96* | *200,736,374.68* | *70,113,441.81* | *15,800,198.02* | *85,913,639.83* | *114,822,734.85* |

| සටහන 10 | මුදල් හා මුදල් වලට සමාන දෑ | |
|---|---|---|
| මුදල් හා මුදල් වලට සමාන දෑ | 2016 | 2015 |
| ලංකා බැංකුව194109- | 26,042,550.56 | 26,721,324.41 |
| මහජන බැංකුව | 2,176,507.68 | 2,435,300.34 |
| ලංකා බැංකුව -75553755 | 1,805,599.65 | 25,000.00 |
| | **30,024,657.89** | **29,181,624.75** |

| සටහන 11 | ණයගැතියෝ | |
|---|---|---|
| | 2016 | 2015 |
| ශානිකා මැරයින් | 8,366.00 | - |
| පියවා නොමැති අත්තිකාරම් | 2,781.38 | - |
| ශෙහාන් කුරුනේරු -කුලි ගෙවිම් | 6,000.00 | 6,000.00 |
| සී. සපුමෙහොට්ටි | 2,477.52 | 2,477.52 |
| ආර්.එන්.රණවීර | 12,500.00 | 12,500.00 |
| ලක්ෂිත දයාරත්න | - | 2,800.00 |
| අසංක විජේවර්ණසූරිය | - | 8,500.00 |
| සී.ඩී.ඩබ්. සෙනවිරත්න | - | 13,500.00 |
| උත්සව අත්තිකාරම් | 16,875.00 | 14,375.00 |
| | **48,999.90** | **60,152.52** |

| සටහන 12 | තැන්පතු | |
|---|---|---|
| | **2016** | **2015** |
| තැන්පතු කුලි- ප්‍රාදේශිය කාර්යාලය ගාල්ල | 96,000.00 | 96,000.00 |
| තැන්පතු කුලි -ප්‍රධාන කාර්යාලය | 2,400,000.00 | 1,950,000.00 |
| තැන්පතු කුලි - ප්‍රාදේශිය කාර්යාලය ත්‍රිකුණාමලය | 7,500.00 | 7,500.00 |
| තැන්පතු ජංගම දූරකථන සඳහා අන්තර්ජාල - පහසුකම් | 11,000.00 | 6,000.00 |
| තැන්පතු ජංගම දූරකථන සඳහා අන්තර්ජාල - පහසුකම් | 31,500.00 | - |
| නැවත අයවිය යුතු තැන්පතු | 50,000.00 | 31,500.00 |
| | **2,596,000.00** | **2,091,000.00** |

| සටහන 13 | ඉදිරියට කල ගෙවීම් | |
|---|---|---|
| | **2016** | **2015** |
| ගෙවල් කුලි පෙර ගෙවුම් | 772,642.01 | 722,301.37 |
| රථවාහන නඩත්තු වියදම් පෙර ගෙවුම් | 644,114.01 | 577,163.10 |
| නඩත්තු කටයුතු සඳහා පෙර ගෙවුම් | 497,172.59 | 22,732.10 |
| වෙනත් | 290,727.99 | 344,290.45 |
| | **2,204,656.60** | **1,666,487.02** |

| සටහන 14 | ආපසු අය කල යුතු කාර්යමණ්ඩල ණය | |
|---|---|---|
| | **2016** | **2015** |
| ආරම්භක ණය ශේෂය | 4,806,479.09 | 5,159,503.18 |
| එකතු කලා: | | |
| ආරම්භක ශේෂ ගැලපීම් | 4,763.37 | - |
| වසර තුළ දුන් ණය | 3,811,000.00 | 3,924,000.00 |
| ආපසු අයකල හැකි මුළු ප්‍රමාණය | 8,622,242.46 | 9,083,503.18 |
| අඩුකලා: | | |
| වසර තුළ අයකරගත් ණය | 3,354,830.41 | 4,277,024.09 |
| අවසන් ශේෂය | **5,267,412.31** | **4,806,479.09** |

| සටහන 15 | ජංගම බැරකම් | |
|---|---|---|
| | **2016** | **2015** |
| ගෙවිය යුතු අතිකාල දීමනා | 407,733.07 | 350,253.91 |
| ගෙවිය යුතු විදුලිය සහ ජල ගාස්තු | 266,693.63 | 33,827.34 |
| ගෙවිය යුතු දුරකථන ගාස්තු | 212,797.20 | 89,010.23 |
| ඇනලිටිකල් ඉන්සිටුමන්ට්ස් ප්‍රයිවට් ලිමිටඞ් | 2,298,965.00 | 842,301.64 |
| ප්‍රයිම් සිලෝන් | 51,000.00 | 51,000.00 |
| වයිනා හාබර් ඉංජිනියරින් | 1,000.00 | 1,000.00 |
| එස් ආර් ටි සිකියුරිටි සර්විස් | 49,290.00 | 54,855.00 |
| ශ්‍රී ලංකා ස්ටේට් ට්‍රේඩින් | 38,800.00 | 36,710.00 |
| කෝල්ඩ් ස්ටෝරේජ් | - | 336,938.75 |
| වැටුප් හා අනෙකුත් දීමනා | 1,532,572.97 | - |
| ගෙවිය යුතු ගමන් වියදම් දිමනා | 560,050.09 | - |
| ගෙවිය යුතු ඉන්ධන ප්‍රතිපූර්ණයන් | 179,642.35 | - |
| බැංකු තැම්පතු | 130,000.00 | - |
| ගෙවිය යුතු ගොඩනැඟිලි කුලී | 144,840.00 | - |
| ඇක්සස් ඉන්ටනැෂනල් ප්‍රයිවට් ලිමිටඞ් | 16,530.12 | - |
| බිස්නස් මැෂින් ප්‍රයිවට් ලිමිටඞ් | 10,350.00 | - |
| හල්කෙම් ලංකා ප්‍රයිවට් ලිමිටඞ් | 143,750.00 | - |
| ආර්. රගු | 18,500.00 | - |
| ට්‍රින්කෝ ඔටෝමොබයිල් | 16,755.00 | - |
| ක්ලිට්‍රෝන් ප්‍රයිවට් ලිමිටඞ් | 44,000.00 | - |
| ටොයෝටා ලංකා | 38,240.09 | - |
| ඇල්පා ඉන්ඩස්ට්‍රීස් | 518,536.10 | - |

| | | |
|---|---|---|
| මැක්ලර්නස් ලොජෙස්ටික් | 1,242,000.00 | - |
| මිහිරි බේක් හවුස් | 47,725.00 | - |
| ඇසෝසියේටඩ් නිවුස් පේපර්ස් | 180,663.00 | - |
| ඩී.එන්.පණ්ඩිතරත්න | 95,354.38 | - |
| සූරිය ස්ටේෂනරීස් | 12,108.75 | - |
| භූමිටෙක් ප්‍රයිවට් ලිමිටඩ් | 6,777,500.00 | - |
| හයිටෙක් ටෙක්නොලොජීස් | 402,500.00 | - |
| කේම්බ්‍රිජ් ට්‍රේඩර්ස් | 3,850.00 | - |
| නිෂු ලංකා | 6,008.34 | - |
| නාරා ආයතනය | 100,950.00 | - |
| ඇටොමික් එනර්ජි බෝර්ඩ් | 37,605.00 | - |
| ගෙවිය යුතු අනෙකුත් ගෙවීම් | 60,630.00 | - |
| ඇලුවේ ග්ලාස් ඉංජිනියරින් ප්‍රයිවට් ලිමිටඩ් | 70,863.00 | - |
| සෙලියුලර් ආර්කේඩ් සිකියුරිටි සොලියුෂන් | 189,061.88 | - |
| මධ්‍යම ඉංජිනේරු ඉදිකිරීම් ආයතනය | 3,928,026.23 | - |
| රාජ්‍ය මුද්‍රණ දෙපාර්තමේන්තුව | 655,118.75 | - |
| මොඩන් එයාර් කොම්. ප්‍රයිවට් ලිමිටඩ් | 92,842.67 | - |
| ගෙවිය යුතු උ.වි.ගෙ. බදු | 460.00 | - |
| ගෙවිය යුතු WRS | 489,842.65 | - |
| සවුත් බීච් රිසෝට් | 10,000.00 | - |
| සංජීව මෝටර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | - | 152,750.00 |
| ගෙවිය යුතු වෙනත් වියදම් | 484,410.67 | 1,218,000.00 |
| ගෙවිය යුතු මුද්දර බදු | 50.00 | 25.00 |
| සිලෝන් ෆිෂරිස් හාබර් කොපරේෂන් | 1,431,266.45 | 5,634,980.00 |
| ඉන්ඩස්ට්‍ර සර්වේ ඉන්ජිනියර්ස් | - | 120,222.54 |
| ටොප් ෂයින් සර්විසස් | - | 81,899.95 |
| එස්. ගොඩගේ ඇන්ඩ් බ්‍රදර්ස් | - | 32,106.00 |
| තිරුකෝවිල් ප්‍රාදේශිය සභා | - | 10,677.30 |
| දන්කොටුව පොසිලේන් | - | 50,520.00 |
| දිස්ත්‍රික් ලේකම් - හම්බන්තොට | - | 117,640.00 |
| ජෝන් කීල්ස් ඔටෝමේෂන් | - | 16,000.00 |
| මයි ටූල්ස් ඔටෝමොබයිල් ටෙක් | - | 1,200.00 |
| පී.බී.ටී.ප්‍රදීප් කුමාර | - | 46,703.92 |
| රුහුණු විශ්වවිද්‍යාලය | - | 127,996.55 |
| සුමුදු ප්‍රියදර්ශිකා | - | 12.00 |
| රන්ජිත් මීගස්වත්තේ | - | 312.64 |
| එල්. ඒ. එල්. අජිත් | 2,722.80 | 2,722.80 |
| | **23,001,605.19** | **9,409,665.57** |

| සටහන 16 | කාර්යමණ්ඩල ණය අරමුදල | |
|---|---|---|
| | **2016** | **2015** |
| ආරම්භක ණය ශේෂය | 7,241,779.43 | 6,984,853.28 |
| එකතු කලා: | | |
| වර්ෂය සඳහා පොළිය | 202,140.56 | 261,218.60 |
| අඩුකලා: | | |
| බැංකු ගාස්තු | - | 4,292.45 |
| අවසන් ශේෂය | **7,443,919.99** | **7,241,779.43** |

| සටහන 17 | පාරිතෝෂිත සඳහා වෙන්කිරිම් | |
|---|---|---|
| | | 2015 |
| ආරම්භක ශේෂය | 10,931,250.00 | 9,135,060.00 |
| සංශෝධනය කරන ලද ශේෂය | | |
| වර්ෂය සඳහා වෙන්කිරිම් | 3,515,027.15 | 1,796,190.00 |
| | 14,446,277.15 | 10,931,250.00 |
| අඩු කලා: | | |
| වර්ෂය තුළ ගෙවිම් | 709,519.15 | - |
| අවසන් ශේෂය | **13,736,758.00** | **10,931,250.00** |

| සටහන 18 | රජයේ ප්‍රදාන සහ ප්‍රාග්ධනය | |
|---|---|---|
| | 2016 | 2015 |
| ආරම්භක ශේෂය | 65,778,874.32 | 64,955,619.07 |
| වැරදි නිවැරදි කිරිම් | | |
| එකතු කලා: | | |
| වසර තුළ ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන | 142,306,041.67 | 67,554,428.81 |
| | 208,084,915.99 | 132,510,047.88 |
| අඩුකලා: | | |
| ආදායම හැටියට සලකන ප්‍රධාන | 83,990,308.56 | 43,999,723.01 |
| වැඩ නිමවි නොමැති ප්‍රාග්ධන වියදම් | 9,271,871.09 | 22,731,450.55 |
| වැඩ නිමවි නොමැති ගොඩනැගිලි | 34,514,417.00 | **-** |
| අවසන් ශේෂය | **80,308,319.34** | **65,778,874.32** |

| සටහන 19 | ආදායම් ලෙස හඳුනාගත් විලම්බිත රජයේ ප්‍රදාන | |
|---|---|---|
| | 2016 | 2015 |
| ආරම්භක ශේෂය | 65,778,874.32 | 64,955,619.07 |
| වත්කම් මිලට ගැනුම් | 30,329,642.96 | 16,975,439.53 |
| | **96,108,517.28** | **81,931,058.60** |
| අඩුකලා: | | |
| ආදායම් ලෙස හඳුනාගත් විලම්බිත ප්‍රාග්ධනය | 15,800,197.94 | 16,152,184.28 |
| අවසන් ශේෂය | **80,308,319.34** | **65,778,874.32** |

| සටහන 20 | වැඩ නිම වී නොමැති ගොඩනැගිලි සඳහා රජයේ ප්‍රාග්ධනය | |
|---|---|---|
| | 2016 | 2015 |
| ආරම්භක ශේෂය | - | - |
| වසර තුළදී ලද ප්‍රාග්ධන ප්‍රදාන | 34,514,417.00 | - |
| අඩුකලා: | | |
| හදුනාගත් වත්කම් | - | - |
| අවසන් ශේෂය | **34,514,417.00** | **-** |

| සටහන 21 | සමුච්චිත හිගය | |
|---|---|---|
| | 2016 | 2015 |
| ආරම්භක ශේෂය | (16,798,010.99) | (13,528,261.26) |
| වැරදි නිවැරදි කිරීම් විලම්බිත ආදායම් - | - | - |
| වැරදි නිවැරදි කිරීම් | - | - |
| විලම්බිත ආදායමට මාරු කිරීම් | - | - |
| සංශෝධනය කරන ලද ශේෂය පාරිතෝෂිත - | | |
| වර්ෂය සඳහා හිගය /අතිරික්තය | (2,966,368.12) | (3,269,749.73) |
| අවසන් ශේෂය | **(19,764,379.11)** | **(16,798,010.99)** |

| සටහන 22 | සමුද්‍රීය පරිසර ආරක්ෂණ අරමුදල | |
|---|---|---|
| | 2016 | 2015 |
| ආරම්භක ශේෂය | 16,350,374.68 | 15,516,150.13 |
| පොළී ආදායම - භාණ්ඩාගාර බිල්පත් | 1,065,749.26 | 834,224.55 |
| අවසන් ශේෂය | **17,416,123.94** | **16,350,374.68** |

| සටහන 23 | ඊ අයි ඒ තැන්පතු | |
|---|---|---|
| | 2016 | 2015 |
| ආරම්භක ශේෂය | - | 447,043.50 |
| අඩුකලා: | - | - |
| වර්ෂය තුළ දැරූ වියදම් | - | 447,043.50 |
| අවසන් ශේෂය | **-** | **-** |

| සටහන 24 | ඉදිරියට ලද ආදායම් | |
|---|---|---|
| ඉදිරියට ලද ආදායම් | 2016 | 2015 |
| අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහන සේවය ලියාපදංචි හා බලපත්‍ර-2016 | 856,000.00 | 33,000.00 |
| බංකරින් ලියාපදිංචි ගාස්තු හා බලපත්‍ර ගාස්තු 2016 | 656,000.00 | 8,000.00 |
| අපද්‍රව්‍ය බැහැර කිරීමේ නියෝග ලියාපදිංචිය 2016 | 776,767.00 | 637,082.19 |
| සැපයුම්කරුවන් ලියාපදිංචිය 2016 | 110,000.00 | 95,000.00 |
| | **2,398,767.00** | **773,082.19** |

| සටහන 25 | ප්‍රදාන ලැබීම් | |
|---|---|---|
| ප්‍රදාන ලැබීම් | 2016 | 2015 |
| වසර තුළ ලද ප්‍රදාන | 3,858,594.00 | 3,858,594.00 |
| අඩුකලා: | | |
| අදායම් වියදම් ගිණුමට මාරු කිරීම් | **-** | **-** |
| අවසන් ශේෂය | **3,858,594.00** | **3,858,594.00** |

| සටහන 26 | ප්‍රාග්ධන නොනිමි වැඩ ගිණුම | |
|---|---|---|
| ප්‍රාග්ධන නොනිමි වැඩ ගිණුම | 2016 | 2015 |
| ආරම්භක ශේෂය | 25,207,173.31 | 19,530,151.57 |
| එකතු කලා: | | |
| වියදම් වෙනස්වීම් | 4,298.14 | - |
| වසර තුළ මාරු කිරිම් | 9,271,871.09 | 22,731,450.55 |
| | 34,483,342.54 | 42,261,602.12 |
| අඩුකලා; | | |
| වසර තුළ දැරූ වියදම් | 22,434,581.95 | 17,054,428.81 |
| අවසන් ශේෂය | **12,048,760.59** | **25,207,173.31** |

| සටහන 27 | ප්‍රාග්ධන ප්‍රදාන සැසඳුම් | |
|---|---|---|
| ප්‍රාග්ධන ප්‍රදාන සැසඳුම් | 2016 | **2015** |
| වසර සඳහා ප්‍රාග්ධන ප්‍රදාන | 89,998,400.00 | 50,500,000.00 |
| වාහන සංචිතය | - | - |
| ඊ අයි ඒ වියදම් මාරුකිරිම | - | - |
| බැලැස්ට් ජල ව්‍යාපෘති ප්‍රදාන | 2,000,000.00 | - |
| හරිත වරාය සංවර්ධන ව්‍යාපෘතිය | 26,420,381.78 | - |
| දැයට සෙවන ව්‍යාපෘතිය | 733,589.33 | - |
| කොරියානු ව්‍යාපෘතිය | 719,088.61 | - |
| නොනිමි වැඩ ගිණුමට මාරු කිරිම් | 22,434,581.95 | 17,054,428.81 |
| මුළු ප්‍රාග්ධන ප්‍රදාන ලැබිම් | **142,306,041.67** | **67,554,428.81** |
| අඩුකිරිම: | | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම | (30,329,642.96) | (16,975,439.53) |
| නිම කර නොමැති ගොඩනැගිලි | (34,514,417.00) | - |
| නොනිමි වැඩ ගිණුමට මාරු කිරිම් | (9,271,871.09) | (22,731,450.55) |
| | **68,190,110.62** | **27,847,538.73** |

| සටහන 28 | ප්‍රදාන ලැබිම් | |
|---|---|---|
| ප්‍රදාන ලැබිම් | 2016 | 2015 |
| වසර තුළ ලද ප්‍රදාන | 4,417,793.50 | 3,858,594.00 |
| ලිපිද්‍රව්‍ය තොගය | 323,709.30 | 559,199.50 |
| අඩුකලා: | | |
| අදායම් වියදම් ගිණුමට මාරු කිරිම් | 559,199.50 | **-** |
| අවසන් ශේෂය | **4,182,203.30** | **4,417,793.50** |

| සටහන 29 | කෙටිකාලීන ආයෝජනය | |
|---|---|---|
| | 2016 | 2015 |
| ආරම්භක ශේෂය | 14,750,372.00 | 13,916,147.26 |
| එකතු කලා: | | |
| පොළී ආදායම් | 1,065,747.87 | 834,224.55 |
| අඩු කලා: | | |
| බැංකු ගාස්තු | **-** | **-** |
| අවසාන ශේෂය | **15,816,119.87** | **14,750,372.00** |

| සටහන 30<br>ප්‍රදාන හා අනෙකුත් ගෙවීම් | | 2016 | 2016 |
|---|---|---|---|
| ගෙවීම් | සත්‍ය වියදම | වත්කම් සඳහා | වියදම් |
| ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම. | | | |
| 2001. ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 918,855.47 | 868,265.11 | 113,590.36 |
| 2002. පිරියත යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 517,159.54 | 50,240.00 | 466,919.54 |
| 2003. වාහන | 579,129.36 | - | 579,129.36 |
| ප්‍රාග්ධන වත්කම් අත්කර ගැනීම | | | |
| 2102. ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 1,991,624.08 | 1,991,624.08 | - |
| 2103. යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 1,973,731.44 | 1,790,581.44 | 183,150.00 |
| 2104.ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 34,514,417.00 | 34,514,417.00 | - |
| 2401. ධාරිතා වර්ධනය හා පුහුණුව (මානව සම්පත් සංවර්ධන) | 1,925,288.50 | 337,008.00 | 1,588,280.50 |
| 2502. අනෙකුත් ප්‍රාග්ධන වියදම් | | | |
| 1.හදිසි තෙල් හා රසායන ද්‍රව්‍ය විසිරීමකදී ඇතිවිය හැකි බලපෑම් පාලනය | 8,133,413.42 | 4,826,682.25 | 3,306,731.17 |
| 2.ජාත්‍යන්තර සම්මුතීන්ට අනුකූලව කටයුතු කිරීම හා නීතිමය රාමුව ශක්තිමත් කිරීම. | 904,203.58 | 112,200.00 | 792,003.58 |
| 3.වෙරළාශ්‍රිත මුහුදු ජලයේ ගුණාත්මක තත්ත්වය නිරීක්ෂණය | 6,640,778.10 | 279,383.00 | 6,361,395.10 |
| 4.නෞකා මඟින් සිදුවන දූෂණය අවම කිරීම | 2,196,480.27 | 1,802,359.25 | 394,121.02 |
| 5.ධීවර වරාය මඟින් සිදුවන සමුද්‍ර දූෂණය වැලැක්වීමේ ජාතික ව්‍යාපෘතිය | 515,425.91 | - | 515,425.91 |
| 6.විද්‍යාගාර පහසුකම් වැඩිදියුණු කිරීම | 1,060,493.50 | 977,500.00 | 82,993.50 |
| 7.සමුද්‍ර අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වන නීතිමය රාමුව ශක්තිමත් කිරීම | 841,252.04 | - | 841,252.04 |
| 8.නාන තොටුපල සංවර්ධනය කිරීම සහ සමුද්‍ර ජල දූෂණය වැලැක්වීම | 4,560,874.20 | - | 4,560,874.20 |
| 9.සමුද්‍ර පරිසර පද්ධතිය සඳහා සමුද්‍ර දූෂණ බලපෑම ඇගයීම | 184,417.00 | - | 184,417.00 |
| 10.දේශගුණ විපර්යාස සඳහා අනුගත වීම | 589,303.00 | - | 589,303.00 |
| 11.ප්‍රදර්ශන කුටි නිර්මාණය | 186,603.63 | - | 186,603.63 |
| 12.පාසල් කණ්ඩායම් ස්ථාපිත කිරීම | 1,520,386.35 | - | 1,520,386.35 |
| 13.ජාතික වැඩසටහන් | 6,671,098.66 | 112,000.00 | 6,559,098.66 |
| 14.ප්‍රදේශයන් අධීක්ෂණය සහ සම්බන්ධීකරණය | 304,519.28 | - | 304,519.28 |
| 15.ප්‍රාදේශිය කාර්යාල ස්ථාපිත කිරීම | 3,934,074.58 | 3,873,095.58 | 60,979.00 |
| බැලැස්ට් ජල ව්‍යාපෘතිය | 2,000,000.00 | 1,386,945.00 | 613,055.00 |
| හරිත ධීවර වරාය ව්‍යාපෘතිය | 26,420,381.78 | - | 26,420,381.78 |
| ආක්‍රමණශීලි ආගන්තුක ජීවී විශේෂ පාලනය කිරීමේ ව්‍යාපෘතිය | 733,589.33 | 30,000.00 | 703,589.33 |
| ශ්‍රී ලංකා අපද්‍රව්‍ය ධාරිතා වර්ධන ව්‍යාපෘතිය | 719,088.61 | - | 719,088.61 |
| වැඩ නිමවී නොමැති ප්‍රාග්ධන වියදම් (2014/2015) | 22,434,581.95 | 11,891,758.95 | 10,542,823.00 |
| අන්තර්ජාතික වෙරළ පවිත්‍රතා දින වියදම් 2015 | 3,464,344.80 | - | 3,464,344.80 |
| | **136,498,515.38** | **64,844,059.66** | **71,654,455.72** |

31 අධිකාරිය විසින් 2015 අගෝස්තු මාසයේදි මාස 6 කදි කල්පිරෙන භාණ්ඩාගාර බිල්පත්වල රුපියල් 13,916,147.26 ක් ආයෝජනය කල අතර එය 2016 වසර තුළදි කල් පිරෙන ලදී. එම මුළු මුදලම නැවත ආයෝජනය කරන ලදී. (පොළිය සහ මුල් ආයෝජන වටිනාකම) 2016 වසර තුළදි රුපියල් 1,065,749.26 ක් පොළිය වශයෙන් උපයා ගන්නා ලදී. 2016 ඔක්තෝම්බර් මාසයේදී නැවත ආයෝජනය කරන ලද මුදල රුපියල් 15,816,119.57 වන අතර එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වත්කම් යටතේ දක්වා ඇත.

32 අධිකාරියේ ජංගම ගිණුම් හි දිනය අවසානයේ ඉතිරිව පවතින අතිරික්ත මුදල් භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිමිලදි ගැනිම සඳහා ආයෝජනය කිරිම අධිකාරිය විසින් ආරම්භ කරන ලදී. මෙම ආයෝජන ක්‍රියාවලිය වසර අවසානය දක්වා දෛනිකව ක්‍රියාත්මක කල අතර එමඟින් රුපියල් 1,211,704.17 ක පොළි ආදායමක් උපයා ගන්නා ලදී. මෙම පොළි ආදායම වර්ෂය සඳහා වන මුළු ආදායමට ඇතුළත් කර ඇත.

33 අධිකාරිය විසින් රුපියල් 30,329,642.96 ක් වටිනා ස්ථාවර වත්කම් වසර තුළදි අත්පත් කර ගන්නා ලදී. මෙම වත්කම් වලට කාර්යාල උපකරණ, ගෘහභාණ්ඩ, විද්‍යාගාර උපකරණ, තාක්ෂණික උපකරණ, පරිගණක යනාදිය ඇතුළත් විය.

34 පාරිතෝෂිත වෙන්කිරිම

1. පාරිතෝෂිත ගණනය කිරිමේ පදනම මූලික වේතනය සහ ජීවන වියදම් දිමනාවේ එකතුව ලෙස සලකන ලදී.

2. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය අනුව රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගත යුතු කාලය වයස අවුරුදු 60 දක්වා වැඩි කර ඇත. ඒ අනුව අධිකාරිය විසින් සේවකයන් සේවයෙන් විශ්‍රාම ගන්නා වයස අවුරුදු 60 ක් ලෙස සලකන ලදී.

3. රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අනුව පාරිතෝෂිත වෙන්කිරිම සඳහා වෙනම ගිණුමක් පැවතිය යුතුය. (වෙන්කිරිම් වලට සමාන මුදල් වටිනාකමක්) 2016 වසර තුළදි ගිණුමක් ආරම්භ කිරිමට අපේක්ෂා කලද ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන නොමැති විම නිසා අධිකාරිය විසින් ගිණුමක් ආරම්භ නොකරන ලදි. ගිණුමක් ආරම්භ කර අතිරික්ත මුදල් පවතින අකාරය මත එම ගිණුමට ප්‍රතිපාදන මාරු කිරිම ඉදිරියේදි සිදුවනු ඇත.

35. උපයෝජනය කිරීමට ඇති ප්‍රාග්ධන ප්‍රදාන (පසුගිය වර්ෂයේ මෙය කෙරීගෙන යන ප්‍රාග්ධන ක්‍රියාකාරකම් ලෙස දක්වා ඇත.)

වසර තුළදී රුපියල් මිලියන 89.998 ක් ප්‍රාග්ධන ප්‍රදාන වශයෙන් භාණ්ඩාගාරයෙන් ලැබුණු අතර එයින් රුපියල් 80,726,528.91 ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාකාරකම් සඳහා වියදම් කරන ලදී. ඉතිරි රුපියල් 9,271,871.09 අවසාන මුදල් ශේෂයේ ඇතුළත්ව ඇත. ක්රියාකාරකම් සැලැස්මේ ක්‍රියාකාරකම් සැලසුම් අනුව ඉටු නොකිරීම හා සැපයුම්කරුවන් විසින් භාණ්ඩ හා සේවා නිවැරදි කාල රාමුව තුළ නොසැපයීම මෙම තත්ත්වය ඇතිවීමට හේතු විය. ඊට අතිරේකව 2014 /2015 වර්ෂවල ඉදිරියට ගෙන එනු ලැබූ 2,772,591.36 ක් අවසන් ශේෂයේ ඇතුළත් ව ඇත. ඒ අනුව රු.12,044,462.45 ක් හිමිකම් යටතේ උපයෝජනය කිරීමට ඇති ප්‍රාග්ධන ප්‍රදාන ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා ඇත. (යෝජිත වියදම් පිළිබඳ විස්තර ඇමුණුම 1 හි දක්වා ඇත.)

36 තොගය

තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධිත අගය යන දෙකෙන් වඩා අඩු අගය මත ගණනය කර ඇත.

තෙල් විසිරුම් කාරක තොගයේ පිරිවැයට වඩා ශුද්ධ උපලබ්ධිත අගය අඩු බව දැක්වීම සඳහා කිසිදු සාධකයක් නොවීය. තෙල් විසිරුම් කාරක තොගයේ කල් ඉකුත්වීමේ වසර 2017 ලෙස සඳහන් වුවද තාක්ෂණික අංශය විසින් මෙම තෙල් විසිරුම් කාරක තවත් වසර දෙකක් හෝ තුනක් භාවිතා කිරීමට හැකියාවක් ඇති බවට අදහස් කරන ලදී. ඒ අනුව වසර තුළදී තොගය සඳහා කිසිදු ගැලපීමක් සිදු නොකරන ලදී.

.

කෙසේ වුවද භෞතික පරික්ෂාවේදි තෙල් විසුරුම්කාරක ලීටර් 1600 ක් Ceylon Petroleum Storage Limited ආයතනයට ආපසු එවීමේ පදනම මත 2014.05.30 දින යවා ඇති බව නිරීක්ෂණය විය. මෙම තෙල් විසුරුම්කාරක ලබාදීම සිදුකර ඇත්තේ ගබඩාවේ පැවති තෙල් විසුරුම්කාරක ලීටර් 5800 යෙනි. කෙසේ වුවද ආපසු එවීම 2016.12.31 දින දක්වා සිදුකර නොතිබුණි. තොගය මූල්‍ය ප්‍රකාශයේ ජංගම වත්කමක් ලෙස දක්වා ඇත. මීට අදාලව සිහිකැදවීම් කිහිපයක් අදාල ආයතනය වෙත සිදුකර ඇති අතර හැකි ඉක්මනින් ප්‍රතිපූර්ණය සිදු කරන බව දන්වා ඇත. ඒ අනුව මෙම ගණුදෙනුව තොගයේ විකුණුමක් ලෙස නොසලකන ලදී.

ඉහත තෙල් විසිරුම්කාරක තොගයට අමතරව ගබඩා භෞතික තොග සමීක්ෂණයේදි සැලකිය යුතු වටිනාකමක් සහිත ලිපිද්‍රව්‍ය තොගයක් ගබඩාවේ පවතින බව නිරීක්ෂණය විය. එම නිසා ලිපිද්‍රව්‍ය තොග අයිතම ලෙස සැලකීමට තීරණය කරන ලදී. (ඇමුණුම 02). පසුගිය වසරේ ඉදිරියට ගෙන එන ලද ලිපිද්‍රව්‍ය තොග ශේෂය ප්‍රවර්තන වර්ෂය තුළදී සියල්ලම භාවිතයට ගන්නා ලදී. ඒ අනුව භාවිතා කරන ලද ලිපිද්‍රව්‍ය වටිනාකම මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශයේ වියදමක් ලෙස දක්වා ඇත. 2016.12.31 දිනට පවතින ලිපිද්‍රව්‍ය වටිනාකම තොග යටතේ දක්වා ඇත.

තොගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වත්කමක් ලෙස දක්වා ඇත.

37. පුස්තකාල පොත්

පොත්වල වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ස්ථාවර වත්කම් යටතේ පුස්තකාල පොත් ලෙස දක්වා ඇති අතර වසර තුලදී මිලදී ගනු ලැබූ පොත්වල පිරිවැය විලම්බිත ප්‍රධාන ගිණුමට මාරු කරන ලද අතර පොත්වල ප්‍රයෝජනවත් ජීව කාලය මත ලියහැරීම සිදුකරනු ලබයි.

පුස්තකාල පොත්වල ප්‍රයෝජනවත් ජීව කාලය වසර 10 ක් ලෙස සලකන ලදී.

38. රසායන ද්‍රව්‍ය සහ විදුරු උපකරණ තොගය

රසායන ද්‍රව්‍ය හා විදුරු උපකරණ සම්බන්ධයෙන් අධිකාරිය යොදාගනු ලබන ප්‍රතිපත්තිය වනුයේ රසායන ද්‍රව්‍යවල හා විදුරු උපකරණවල මිලදි ගැනිමේ මුළු පිරිවැය මිලදිගත් වර්ෂයේ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශයට වියදමක් ලෙස ලියාහැරිමයි.

මෙම ක්‍රමය භාවිතා කිරිමට හේතුවනුයේ වර්ෂය අවසානයේ පවතින රසායන ද්‍රව්‍ය තොග නිවැරදි පරිදි ගණනය කිරිමේ පවතින ප්‍රායෝගික දුෂ්කරතාවය සහ විදුරු උපකරණ ඉතා කෙටිකාලයකදි භාවිතයෙන් ඉවත් කිරිමට සිදුවිමයි. කෙසේ වුවද විද්‍යාගාරය විසින් රසායන ද්‍රව්‍ය හා විදුරු උපකරණ වාර්තා කිරීම අරමුණු කරගෙන වෙනම තොග ලෙජරයක් පවත්වාගෙන යනු ලබයි.

39. වැඩ නිම වී නොමැති ගොඩනැගිලි

ප්‍රවර්තන වර්ෂය තුළ අධිකාරිය විසින් දඩල්ල ප්‍රදේශයේ අධිකාරියටම අයත් ඉඩමක දකුණු පළාත් කාර්යාලය සහ ගාල්ල ප්‍රාදේශිය කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම ආරම්භ කර ඇත. මෙම ගොඩනැගිලි සංකීර්ණයට විද්‍යාගාරයක් ද ඇතුළත්ව ඇත. මෙම ගොඩනැගිල්ල සඳහා ඇස්තමේන්තුගත වියදම ආසන්න ලෙස රුපියල් මිලියන 57.2, ඇස්තමේන්තුගත මුදලින් රුපියල් මිලියන 35 ක් 2016 වසර තුළද ඉතිරි මුදල වන රුපියල් මිලියන 22.2 ක් 2017 වර්ෂය තුළ ද ලැබිමට ඇත. කැබිනට් අනුමැතියක් මත මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරිම් කටයුතු මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යංශය මඟින් සිදුකරයි. ප්‍රවර්තන වර්ෂය තුළදී මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යංශය මඟින් ඉදිකිරිම් කටයුතු ආරම්භ කිරීමට සහ ප්‍රවර්තන වසර තුළදි ඉදිකිරිම් කටයුතු සඳහා රුපියල් මිලියන 34.5 ක් අධිකාරිය මඟින් ගෙවීමක්ද සිදුකර ඇත. මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යංශයට ගෙවන ලද වටිනාකම වැඩ නිම වී නොමැති ගොඩනැගිලි ලෙස, ස්ථාවර වත්කම් යටතේ ඇති දේපල, පිරියත සහ උපකරණ වටිනාකමෙහි දක්වා ඇත. ගොඩනැගිල්ල ඉදිකිරීම් සඳහා අදාල ප්‍රාග්ධන ප්‍රදාන හිමිකම් ලෙස ගොඩනැගිල්ලේ වැඩ අවසන් වන තෙක් පවත්වාගෙන යනු ලබයි. ගොඩනැගිල්ලේ වැඩ 2017 වර්ෂය තුළදී අවසන් කිරීමට අපේක්ෂා කරයි.

40. අන්තර්ජාතික වෙරළ පවිත්‍රතා දිනය 2015 (ICC).

2016 වර්ෂය සඳහා අන්තර්ජාතික වෙරළ පවිත්‍රතා දින වැඩසටහන සඳහා ලද අනුග්‍රාහක ප්‍රදාන මඟින් 2015 අන්තර්ජාතික වෙරළ පවිත්‍රතා දින වැඩසටහන සඳහා ගෙවීමට තිබූ ශේෂය 2016 වර්ෂය තුළ ගෙවන ලදී. මුලු ගෙවිය යුතු වටිනාකම රුපියල් 3,464,344.80 කි. මෙම වටිනාකම මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශයේ ප්‍රදාන හා අනෙකුත් ගෙවීම් මාරුකිරීම් ලෙස දක්වා ඇත.

41 2016.12.31 දිනට අවසන් වී නොමැති නීති කර්තව්‍යයන්

සයිප්‍රස් ධජය යටතේ යාත්‍රා කරනු ලැබූ තෙමෝෆයිලේ සියෙරා නෞකාව කොළඹ වරායට පිටතින් පානදුරට ආසන්න ප්‍රදේශයේ නැංගුරම් ලා තිබියදී 2012 අගෝස්තු මස 23 දින ගිලී යාම නිසා සිදු වූ සමුද්‍ර දූෂණයට අදාලව පනතේ 26 වෙනි වගන්තියේ අපරාධ වගකීම යටතේ නෞකාවට විරුද්ධව නීතිමය කටයුතු ආරම්භ කර ඇත. මෙම නීති කටයුතු පනතේ 50 වෙනි වගන්තිය යටතේ නීතිපති දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලබයි. අවශ්‍ය කරනු ලබන ලේඛන සහ තොරතුරු නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

නීතිපති දෙපාර්තමේන්තුව මඟින් ඉදිරි කටයුතු සිදුකෙරෙමින් පවතී.

ඇමුණුම 01

# සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
# 2016 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වියදම් විස්තර

| | සැපයුම්කරුවන් | විස්තරය | වටිනාකම | වැය විෂය |
|---|---|---|---|---|
| 1 | ගෙස්ටෙට්නර් ඔෆ් සිලෝන් පීඑල්සී | මුද්‍රණ යන්ත්‍ර සැපයීම | 114,540.00 | 4.1 |
| 2 | භූමි ටෙක් ප්‍රයිවට් ලිමිටඩ් | විද්‍යාගාර ශිතකරණ මිලදී ගැනීම | 977,500.00 | 6.1 |
| 3 | හල්කෙම් ලංකා ප්‍රයිවට් ලිමිටඩ් | අත්වැසුම් මිලදී ගැනීම | 304,750.00 | 1.2 |
| 4 | හල්කෙම් ලංකා ප්‍රයිවට් ලිමිටඩ් | අත්වැසුම් හා ජීවිත ආරක්ෂණ කබා මිලදී ගැනීම | 564,420.00 | CGU |
| 5 | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | පාසැල් සමුද්‍ර කණ්ඩායම් සඳහා මාර්ගෝපදේශ මුද්‍රණය | 793,500.00 | 12.2 |
| 6 | හෙමාස් ඉන්ටර්නැෂනල් ප්‍රයිවට් ලිමිටඩ් | විද්‍යාගාර ඉන්කියුබේටරය මිලදී ගැනීම | 3,756,590.00 | 6.1 |
| 7 | මැක් ලර්නස් ලොජෙස්ටික් ලිමිටඩ් | | 158,675.00 | 4.1 |
| 8 | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | සඟරා මුද්‍රණය | 80,500.00 | 3.6 |
| 9 | ක්ලිට්‍රෝන් ප්‍රයිවට් ලිමිටඩ් | මල්ටි පැරාමීටර්ස් මිලදී ගැනීම | 720,000.00 | 3.1 |
| 10 | සයින් ටෙක් ඇඩ්වර්ටයිසින් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් | ප්‍රදර්ශන කුටි සැකසීම | 622,143.90 | 11.1 |

ඇමුණුම 02

## සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
## 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ ලිපිද්‍රව්‍ය අයිතම

| | දිනය | සැපයුම්කරු | අයිතමය | ඒකක පිරිවැය | ප්‍රමාණය | වටිනාකම |
|---|---|---|---|---|---|---|
| 1 | 2016.05.16 | ඒ ටෙක් ටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් | SCX4521 | 6,900.00 | 1 | 6,900.00 |
| 2 | 2016.05.16 | ඩේටා ටෙක් බිස්නස් සෙන්ටර් | HP CE 505 | 9,759.00 | 3 | 29,277.00 |
| 3 | 2016.11.22 | ශ්‍රී ලංකා ස්ටේට් ට්රේඩින් | HP 22 | 3,080.00 | 4 | 12,320.00 |
| 4 | 2016.05.16 | ඩේටා ටෙක් බිස්නස් සෙන්ටර් | HP 702 Black | 3,396.00 | 1 | 3,396.00 |
| 5 | 2016.05.16 | ඒ ටෙක් ටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් | Lexmark MX 310 DN | 26,500.00 | 4 | 106,000.00 |
| 6 | 2016.05.16 | ඔෆිස් නෙට්වර්ක් ප්‍රයිවට් ලිමිටඩ් | Canon F*9 | 8,990.00 | 2 | 17,980.00 |
| 7 | 2016.05.16 | ඒ ටෙක් ටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් | Richo Sp 3400 HS | 7,100.00 | 2 | 14,200.00 |
| 8 | 2016.05.16 | සොෆ්ලොජික් රිටෙයල් ප්‍රයිවට් ලිමිටඩ් | Xerox 5335 | 24,067.12 | 1 | 24,067.12 |
| 9 | 2016.08.11 | ඒපී එන්ටර්ප්‍රයිසස් | A4 Papers | 426.07 | 184 | 78,396.88 |
| 10 | 2016.08.11 | ඒපී එන්ටර්ප්‍රයිසස් | Legal Papers | 630.62 | 15 | 9,459.30 |
| 11 | 2016.06.16 | රෙන්බෝ ස්ටේශනරීස් ඇන්ඩ් ඉලෙක්ට්‍රිකල්ස් | 9*4 Envelop | 1.19 | 10300 | 12,257.00 |
| 12 | 2016.06.16 | රෙන්බෝ ස්ටේශනරීස් ඇන්ඩ් ඉලෙක්ට්‍රිකල්ස් | 10*12 Envelop | 3.80 | 1520 | 5,776.00 |
| 13 | 2016.06.16 | රෙන්බෝ ස්ටේශනරීස් ඇන්ඩ් ඉලෙක්ට්‍රිකල්ස් | 10*15 Envelop | 4.60 | 800 | 3,680.00 |

# 6.7සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
## මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
## 2012 සිට 2016 දක්වා (රුපියල්)

| වත්කම් | | 2016 | 2015 | 2014 | 2013 | 2012 |
|---|---|---|---|---|---|---|
| ජංගම වත්කම් | | | | | | |
| මුදල් ශේෂය | 10 | 30,024,657.89 | 29,181,624.75 | 31,857,634.23 | 15,553,928.21 | 5,512,790.27 |
| ණයගැතියෝ | 11 | 48,999.90 | 60,152.52 | 47,257.00 | 22,250.00 | 13,500.00 |
| තැන්පතු | 12 | 2,596,000.00 | 2,091,000.00 | 2,029,500.00 | 2,014,100.00 | 1,219,100.00 |
| ඉදිරියට කල ගෙවීම් | 13 | 2,204,656.60 | 1,666,487.02 | 2,071,779.68 | 602,149.49 | 597,394.81 |
| ආයෝජන(භාණ්ඩාගාර බිල්පත්) | | 15,816,119.87 | 14,750,372.00 | 13,916,147.26 | 12,979,451.23 | 11,755,525.00 |
| අයකර ගත යුතු සේවක ණය | 14 | 5,267,412.05 | 4,806,479.09 | 5,159,503.18 | 6,238,964.09 | 5,633,670.23 |
| තොගය | 23 | 4,182,303.30 | 4,417,793.50 | 3,858,594.00 | 3,858,594.00 | |
| ජංගම නොවන වත්කම් | | | | | | |
| දේපලපිරියත සහ , උපකරණ | 09 | 114,822,734.84 | 65,831,860.85 | 64,955,616.96 | 38,211,544.09 | 43,404,750.36 |
| **මුළු වත්කම්** | | 174,962,884.45 | 122,752,781.78 | 123,896,032.31 | 79,480,981.11 | 68,136,730.67 |
| වගකීම් | | | | | | 2,372,439.26 |
| ජංගම වගකීම් | | | | | | 486,990.50 |
| උපචිත ගෙවීම් | 15 | 23,001,605.19 | 9,409,665.57 | 15,543,605.37 | 422,894.10 | 1,694,000.00 |
| තත්ත්ව ඇගයීම් ව්‍යාපෘතිවල තැන්පතු | 21 | 2,398,767.00 | 773,082.19 | 447,043.50 | 447,043.50 | |
| කලින් ලද ආදායම් ලැබීම් | 22 | | | 1,453,219.18 | 2,015,000.00 | |
| ජංගම නොවන වගකීම් | | 7,443,319.99 | 7,241,779.43 | | | |
| සමුද්‍ර පරිසර ආරක්ෂණ අරමුදල | 20 | 13,736,758.00 | 10,931,250.00 | 15,516,150.13 | 14,579,453.20 | 13,355,525.74 |
| ආපදා ණය සඳහා මුදල | 16 | 46,581,834.27 | 28,355,777.19 | 6,984,853.28 | 6,752,928.71 | 6,565,640.22 |
| පාරිතෝෂිත සඳහා වෙන්කිරිම | 17 | 128,381,834.27 | | 9,135,060.00 | 7,284,380.00 | 4,480,874.50 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **මුළු වගකීම්** | | 93,890,793.04 | | 49,079,931.46 | 31,501,699.51 | 28,955,470.22 |
| **ශුද්ධ වත්කම්** | | | | 74,816,100.85 | 47,979,281.60 | 39,181,261.00 |
| **හිමිකම්** | | 80,308,318.58 | 65,778,874.32 | | | |
| රජයේ ප්‍රදාන සහ ප්‍රාග්ධන(විලම්බිත ප්‍රදාන) | 18 | 34,514,417.00 | - | 64,955,616.49 | 38,211,543.55 | 43,404,750.36 |
| උපචිත හිඟය | 19 | 12,048,760.59 | 25,207,173.31 | (13,492,831.26) | (8,572,678.50) | (4,223,489.36) |
| වැඩ නිමවී නොමැති ප්‍රාග්ධන වියදම් | 24 | 3,858,594.00 | 3,858,594.00 | 19,530,151.57 | 14,481,822.55 | - |
| තොග සඳහා ප්‍රාග්ධන යෙදවුම් | 23 | 17,416,123.94 | 16,350,374.68 | 3,858,594.00 | 3,858,594.00 | - |
| මුළු හිමිකම් | | (19,764,379.11) | (16,798,010.99) | 74,816,100.85 | 47,979,281.60 | 39,181,261.00 |

## 6.8සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

## මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය

## 2012 සිට 2016 දක්වා

| විස්තරය | සටහන් | 2016 රුපියල් | 2015 රුපියල් | 2014 රුපියල් | 2013 රුපියල් | 2012 රුපියල් |
|---|---|---|---|---|---|---|
| භාණ්ඩාගාර ප්‍රදාන | 1 | 196,990,302.56 | 141,221,723.01 | 100,052,473.75 | 79,059,481.67 | 79,902,066.62 |
| ලියාපදිංචි හා බලපත්‍ර ගාස්තුව | 2 | 17,430,909.42 | 12,959,886.99 | 12,038,930.82 | 11,976,053.17 | 10,033,547.94 |
| වෙනත් ආදායම් | 3 | 5,029,616.86 | 2,910,944.39 | 2,619,793.00 | 1,168,403.50 | 1,095,406.19 |
| **මුළු ආදායම** | | **219,450,828.84** | **157,086,624.55** | **114,711,197.57** | **92,203,938.34** | **91,031,020.75** |
| **වියදම්** | | | | | | |
| වැටුප් හා වේතන ගෙවීම් | 4 | 96,641,764.42 | 85,360,458.55 | 55,794,565.26 | 41,797,413.42 | 39,005,981.99 |
| සැපයුම් හා පරිභෝජන ද්‍රව්‍ය | 5 | 8,747,684.32 | 7,370,861.27 | 6,539,776.55 | 5,297,828.16 | 4,329,712.86 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 6 | 29,518,860.70 | 23,651,730.11 | 19,865,034.64 | 14,482,504.22 | 13,081,247.73 |
| ප්‍රදාන හා මාරු කිරීම් | 7 | 71,654,455.72 | 27,847,538.73 | 24,906,853.19 | 23,058,734.95 | 26,924,095.44 |
| මූල්‍ය වියදම් | 8 | 54,533.78 | 34,560.00 | 35,430.00 | 36,800.00 | 47,162.10 |
| ස්ථාවර වත්කම් ක්ෂය වීම් | 9 | 15,800,198.02 | 16,097,155.46 | 12,525,120.63 | 10,335,446.79 | 9,457,531.25 |
| **මුළු වියදම්** | | **222,417,196.96** | **160,362,304.12** | **119,666,780.27** | **95,008,727.55** | **92,845,731.37** |
| කාලපරිච්ඡේදය සඳහා ඌණතාවය/අතිරික්තය | | **(2,966,368.12)** | **(3,269,749.73)** | **(4,955,582.70)** | **(2,804,789.20)** | **(1,814,710.62)** |

# 7. විගණකාධිපති වාර්තාව

**විගණකාධිපති දෙපාර්තමේන්තුව**
**கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்**
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } අයිඊඑන්/ඊ/එමඊපීඒ/01/16/31 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2017 සැප්තැම්බර් 10 දින

සභාපති,

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය.

**සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 20 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපතිවරයා වෙත 2017 ජුනි 13 දින නිකුත්කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරුකිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලිපිද්‍රව්‍ය තොග වටිනාකම රු.299,914 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුහුණතෙහි දැක්විය යුතු වටිනාකම රු.1,386,945 ක් වූ අස්පෘශ්‍ය වත්කම් ගෘහ භාණ්ඩ හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | (i) කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබාදිය හැකි බව දක්වා ඇතත්, වැඩසටහන් |

3

04 ක් සඳහා නිලධාරීන් තිදෙනෙකුට රු.825,000 ක් ඉක්මවා අතුරු අග්‍රිම ලබාදී තිබුණි.

(ii) චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව අවස්ථා 31 කදී නිලධාරීන් 14 දෙනෙකු වෙත අවශ්‍යතාවය ඉක්මවා එකතුව රු.738,854 ක් වූ අතුරු අග්‍රිම ලබා දී තිබුණි.

| | |
|---|---|
| (ආ) 2007 පෙබරවාරි 28 දිනැති අංක සීඑස්ප්/පීඅයි/40 දරන රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛය | වැඩමුළු හා සම්මන්ත්‍රණ හෝටල්වල පැවැත්විය නොහැකි වුවද "ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සඳහා වූ වැඩමුළුව" යන මැයෙන් 2016 නොවැම්බර් 22 හා 23 යන දෙදින පෞද්ගලික හෝටලයක වැඩමුළු පවත්වා රු.478,800 ක් ගෙවීම්කර තිබුණි. |
| (ඇ) 2016 ජනවාරි 01 දිනැති අංක 01/2016 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | රාජ්‍ය ආයතනවල සියලු වාහන සම්බන්ධ පරිගණක දත්ත පද්ධතියක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය රජය විසින් අවධාරණය කර තිබුණ ද අධිකාරිය විසින් එසේ කර නොතිබුණි. |
| (ඇ) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ආයතනයේ ශාඛාවන්හි ඇති බඩු හරිවැරදි බැලීම සඳහා සෑම වර්ෂයකම දෙසැම්බර් 15 වන දින හෝ ඊට ආසන්නව සමීක්ෂණ මණ්ඩලයක් පත්කළ යුතු වුවත්, සමීක්ෂණ මණ්ඩලය පත්කර තිබුණේ 2017 අප්‍රේල් 04 දිනදිය. ඒ හේතු කොටගෙන භාණ්ඩ සමීක්ෂණ කටයුතු ප්‍රමාද වී තිබුණි. තවද භෞතික ශේෂය වාර්තා කිරීම සඳහා අදාළ ආකෘති පත්‍ර ද භාවිතා කර නොතිබුණි. |

2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

---

අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහන සේවා පහසුකම් සැපයීම සඳහා වරායන් තුළ සේවා නියුක්ත කර ඇති නිලධාරීන් සඳහා 2010 දෙසැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි දිනකට රු.750 බැගින් දීමනාවක් හා 2016

වර්ෂයේ සිට දිවා, රාත්‍රී වැඩමුර අනුව නව ගෙවීම් ක්‍රමවේදයකට දීමනා ගෙවා තිබුණි. එහෙත් ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණු අතර මේ සඳහා 2014 සිට 2016 දක්වා වූ වර්ෂවලදී රු.987,900 ක දීමනා ගෙවා තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

---

3.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.2,966,368 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.3,269,750 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සසඳන විට සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.303,382 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ගාස්තු, දඩමුදල්, බලපත්‍ර ගාස්තු හා අනෙකුත් ආදායම් රු.4,471,022 කින් වැඩිවීම ඉහත වර්ධනයට හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේදී රු.1,814,711 ක ඌනතාවය සමාලෝචිත වර්ෂයේදී රු.2,966,368ක් දක්වා වැඩිවී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය ගැලපීමෙන් පසු 2012 වර්ෂයේදී අධිකාරියේ දායකත්වය රු.46,648,802 ක් වී තිබුණි. එය අඛණ්ඩව වර්ධනය වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී රු.109,475,594 ක් වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

---

4.1 කාර්යසාධනය

---

2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත මගින් අධිකාරිය ස්ථාපිත කර තිබූ අතර පනතට අනුව ප්‍රධාන අරමුණු පහත සඳහන් කෙරේ.

(i) ශ්‍රී ලංකා ජලතීරයේ හෝ වෙනත් යම් සමුද්‍ර කලාපවල හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ හා වෙරළ කලාපය තුළ නැව් ආශ්‍රිත කාර්යයන්ගෙන් සහ වෙරළ ආශ්‍රිත සමුද්‍රය සම්බන්ධ යම් කටයුත්තකින් ඇති වන දූෂණය වැළැක්වීම, අවම කිරීම, පාලනය කිරීම සහ

කළමනාකරණ කාර්යයන් සඳහා යෝජනා සැකසීම, ක්‍රියාත්මක කිරීම හා වෙනත් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සමඟ සහයෝගීත්වයෙන් පර්යේෂණ පැවැත්වීම.

(ii) ශ්‍රී ලංකා ජල තීරය, සමුද්‍ර කලාප, පෙර වෙරළ හා වෙරළ කලාපය යම් තෙල් හානිකර හෝ වෙනත් දූෂකයකින් දූෂණය වීම මගහරවා ආරක්ෂා කිරීමට, පියවර ගැනීම, ප්‍රමාණවත් හා යෝග්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම් සැලසීම හා ජාතික තෙල් දූෂණ හදිසි සැලැස්මක් සකස්කර ක්‍රියාත්මක කිරීම.

(iii) සමුද්‍ර දූෂණය සම්බන්ධ සියළු ජාත්‍යන්තර සම්මුතීන් සහ අදාල මූලපත්‍ර පිළිගැනීම හා නිර්දේශ කිරීම.

(iv) ඛනිජතෙල් ආශ්‍රිත ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ස්වභාවික සම්පත් ගවේෂණයේ යෙදී සිටින පාර්ශවයන්ගේ ක්‍රියාකාරීත්වය අධීක්ෂණය කිරීම, සමුද්‍රීය පරිසරය ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ විවිධ ප්‍රජා කාණ්ඩායම් දැනුවත් කිරීම.

එම අරමුණු අතරින් පහත සඳහන් අරමුණු ඉටුකර නොතිබුණි.

(අ) පාරිසරික වශයෙන් ඉහළ වැදගත්කමක් සහිත ප්‍රදේශ, ජෛව විවිධත්වය හා පරිසර සංවේදී සේවාවන් සංරක්ෂණය වන ආකාරයට පරිසර සංවේදී භූමි ප්‍රදේශ ආරක්ෂා කිරීම හා සංරක්ෂණය ප්‍රවර්ධන කිරීම කෙරෙහි අධිකාරියේ දැඩි අවධානය යොමුවිය යුතු වුවද උස්වැටකෙයියාව තල්දියවත්ත ලුනාව කළපුවේ බටහිර ඉවුරට ආසන්න ස්ථානයකදී ඛනිජ තෙල් නලයකින් සිදුවූ තෙල් කාන්දුව හේතුවෙන් කළපුවේ ජලයටත්, අනතුරුව ඒ ආශ්‍රිතව ඇති කඩොලාන පරිසරයටත් තෙල් මුසුවී පාරිසරික වශයෙන් ඉහළ වැදගත්කමක් සහිත ප්‍රදේශ විනාශ වී තිබුණි.

(ආ) හලාවත කාර්යාලයට අදාල හලාවත කලපුවෙහි ප්‍රධාන මෝයකට ආසන්නයේ පිහිටි කුරුසපාඩුව ප්‍රදේශයේ පිහිටි භූමියකට හලාවත නගර සභාව විසින් අවිධිමත් ලෙස කසළ මුදාහැරීම සම්බන්ධයෙන් පනතේ පවතින නෛතික බලතල ක්‍රියාත්මක කර අදාල දඩ පනවා සමුද්‍ර දූෂණය වැලැක්වීමට කටයුතු කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8.7 හා 7.9 ඡේදවලට පටහැනිව ලංසු ඇගයීම හේතුවෙන් පිළිවෙලින් රු.885,000 ක් හා රු. 1,982,100 ක් වටිනා ටී- ෂර්ට් 1,500 ක් හා තොප්පි 10,000 ක් මිලදීගැනීම හේතුකොටගෙන රු.580,000 ක අලාභයක් සිදුවී තිබුණි.

(ආ) වාර්ෂික ප්‍රසම්පාදන සැලස්මේ අන්තර්ගත නොවූ රූපවාහිනී යන්ත්‍රයක් මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර තිබූ අඟල් 42 රූපවාහිනියක් වෙනුවට අඟල් 49 රූපවාහිනී යන්ත්‍රයක් රු.129,999 කට මිලදීගෙන තිබුණි. කෙසේ වුවද මෙම යන්ත්‍රය ක්‍රියාකරවීම සඳහා අවශ්‍ය සම්බන්ධතා පහසුකම් අධිකාරිය සතුව නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා කිහිපයකදී විද්‍යාගාරයට රු.14,120,045 ක උපකරණ මිලදී ගෙන තිබුණද එහි ප්‍රමිතිකරණ කටයුතු 2017 ජනවාරි වන විටත් අවසන් කර නොතිබුණි. ඒ අනුව විද්‍යාගාරයෙන් ජලය පිළිබඳ ප්‍රමිති ගත වාර්තා ලබාගත නොහැකි වීම නිසා එම වාර්තා බාහිර ආයතන මගින් ලබාගැනීමට 2016 වර්ෂය තුළ රු.2,078,560 ක මුදලක් වියදම්කර තිබුණි.

(ඈ) ඇස්තමේන්තුගත පිරිවැය රු.30,400,000 ක් වූ හරිත ධීවර වරාය ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2017 අප්‍රේල් 30 දින අවසන් කර තිබුණ ද අවසන් ව්‍යාපෘති වාර්තා පිළියෙල කර මිරිස්ස ධීවර වරායට භාරදීමේ කටයුතු මේ දක්වා ඉටුකර නොතිබුණි.

(ඉ) 2013 වර්ෂයේදී ලද අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ත්‍රිකුණාමල කාර්යාලයේ විද්‍යාගාරයක් ස්ථාපිත කිරීමට තීරණය කළද, 2017 ජනවාරි දක්වාම විද්‍යාගාරයක් ස්ථාපිත කර නොතිබුණි. කෙසේ වුවද 2014 හා 2015 වර්ෂවලදී එම විද්‍යාගාරය සඳහා රු. 2,075,253 ක් වටිනා උපකරණ මිලදීගෙන තිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

------------------------------------

2016 ක්‍රියාකාරී සැලස්ම තුළ තිරසාර දූෂණයෙන් තොර වෙරළ හා සමුද්‍ර පරිසරය උදෙසා ජාතික ක්‍රියාකාරී සැලස්ම සකස් කිරීම සඳහා රු.1,500,000 ක මුදලක් වෙන්කර තිබූ අතර ඒ සඳහා

අවශ්‍ය උපදේශන සේවාවක් සපයා ගැනීමට භාෂා ත්‍රිත්වයෙන් පුවත් පත් දැන්වීම් 03 ක් පළකිරීම සඳහා රු.87,285 ක වියදමක් දරා තිබුණි. එසේ වුවද අදාල වැඩසටහන සඳහා මුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් එම මුදල් මහවැලි හා පරිසර අමාත්‍යාංශය විසින් මෙහෙයවන ලද ශ්‍රී ලංකා නෙක්ස්ට් - දේශගුණික විපර්යාසවලට අනුගත වීමේ වැඩසටහන සඳහා ලබා දී තිබුණි. ඒ අනුව යථෝක්ත ක්‍රියාකාරකම 2017 වර්ෂයට කල් දමා තිබුණු බැවින් පුවත් පත් දැන්වීම් පළ කිරීමේ වියදම් නිෂ්ඵල වියදමක් වී තිබුණි.

## 4.4 අරමුදල් ඌන උපයෝජනය

-----------------------------

ප්‍රාග්ධන වියදම් සඳහා 2014, 2015 හා 2016 වර්ෂවලදී ලැබුණු රු.6,595,327 ක් උපයෝජනය නොකර 2017 මැයි 15 දින දක්වාම වියදම් කිරීමට අපේක්ෂිත වියදම් ගිණුමේ සටහන් කර තිබුණි.

## 4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගන්නා ලද රු.10,843,550 ක් වූ විද්‍යාගාර උපකරණ 14 ක් විගණිත දිනය වූ 2017 ජනවාරි වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශීය කාර්යාල 09 ක තොරතුරු මධ්‍යස්ථාන ඇති කර ඒවායේ සවිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.167,200 ක ප්‍රදර්ශන පුවරු 11 මිලදීගෙන තිබුණද ඒවා බෙදාහැරීමකින් තොරව 2017 ජනවාරි වන විටත් නිෂ්කාර්යව ගබඩා කර තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ රු.111,355 කට මිලදී ගත් ප්‍රති වෛරස මෘදුකාංග 40 ක් වසරකට ආසන්න කාලයක් භාවිතයට නොගෙන නිෂ්ක්‍රීයව තිබුණු අතර එම මෘදුකාංග කල් ඉකුත් වී තිබුණි. කෙසේ වුවද ඒවා වෙනුවට වෙනත් ප්‍රති වෛරස මෘදුකාංග ලබා ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය 202 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 172 ක් වූයෙන් පුරප්පාඩු 30 පැවතුණි. ඉන් තෘතීය හා ද්විතීය මට්ටමේ තනතුරු 20 ක් පුරප්පාඩු පැවතීම අධිකාරියේ මෙහෙයුම් ක්‍රියාකාරීත්වයට බාධාවක් වී තිබුණි.

(ආ) බඳවාගැනීමේ පටිපාටිය අනුව වර්ෂ තුන සම්පූර්ණ වීමට පෙර සියළු තනතුරු සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්විය යුතු වුවද එකී විභාග නොපවත්වා අධිකාරියේ සියළුම සේවකයින් සඳහා වැටුප් වර්ධක ලබාදී තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

--------------------------------------------

5.1 අභ්‍යන්තර විගණනය

----------------------

අධිකාරිය තුළ අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර විගණන නිලධාරීන් දෙදෙනෙකු පමණක් ඒ සඳහා අනුයුක්ත කර තිබුණි. නමුත් 2015 වර්ෂයේ සිට මේ දක්වාම අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබුණි.

5.2 අයවැය ලේඛනමය පාලනය

------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇස්තමේන්තුගත වියදම් හා තථ්‍ය වියදම් අතර සියයට 10 සිට සියයට 88 ක් දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොමැති බව නිරීක්ෂණය විය.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
AGDSL
Auditor General's Department

5.3 නොවිසඳී ඇති විගණන ඡේද

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2008 අංක 35 දරන සමුද්‍රීය දූෂණය වැලැක්වීමේ පනතේ විධිවිධාන යටතේ, 2012 අංක 01 දරන නියෝගයට අනුව තෙල් උතුරායාම පිළිබඳ හදිසි සැලැස්ම ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය වෙත ඉදිරිපත් කර අනුමත කරවා ගතයුතු වුවද, ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් එම සැලැස්ම ඉදිරිපත් නොකිරීම පිළිබඳව සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් අවධානය යොමුකර නොතිබීම හේතුවෙන් හදිසි තෙල් විසිරීමකදී එම ආයතනය සම්බන්ධ වගකීම අධිකාරියෙන් බැහැරව පැවතුණි.

(ආ) ධීවර වරායන්හි පවතින අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

(ඇ) මුහුදු සීමාවේ සිට මීටර් 300 ක් ගොඩබිම දක්වා වූ සීමාවේ මුහුදට අපද්‍රව්‍ය බැහැරවන ආකාරයෙන් තනා ඇති වැසිකිළි හා අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය නොකර මුහුදට දැමීම සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන දැනුවත් කිරීමටත්, ප්‍රතිචක්‍රීයකරණය නොකර මුහුදට දමන අපද්‍රව්‍ය සම්බන්ධයෙන් සංචාරක කර්මාන්තයට විශේෂ බලපෑමක් විය හැකි බැවින් එම ගැටළුව සම්බන්ධව සංචාරක සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් සමඟ සාකච්ඡා කොට ඉදිරියේදී ක්‍රියාකළ හැකි ආකාරය පිළිබඳව වාර්තාවක් සකස් කිරීමටත් තීරණය කළද එය ඉටුකර නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින් වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) කාර්ය මණ්ඩලය පරිපාලනය. | | බඳවාගැනීමේ කටයුතු, උසස්වීම් ලබාදීම හා විනය පරීක්ෂණ යනාදී කටයුතු විධිමත්ව සිදු නොකිරීම. |
| (ආ) ව්‍යාපෘති හා සැලසුම් ක්‍රියාත්මක කිරීම. | i. | නියමිත දිනට ව්‍යාපෘති අවසන් කර නොතිබීම. |

10

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

| | | |
|---|---|---|
| | ii. | ව්‍යාපෘතිවලට අදාල අවසන් නිරීක්ෂණ හා ගිණුම් ලබාගැනීමට කටයුතු කර නොතිබීම. |
| | iii. | සැලසුම් ක්‍රියාත්මක කිරීමේ කටයුතු විධිමත් කර නොතිබීම. |
| | iv. | පසුවිපරම් කටයුතු ක්‍රියාත්මක කර නොතිබීම. |
| (ඈ) වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | | වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී වෙන්කර ඇති ප්‍රතිපාදන කෙරෙහි අවධානය යොමු නොකිරීම හේතුවෙන් ඒ සඳහා අධිවැය දරා තිබීම. |
| (ඈ) තොග පාලනය. | | භාණ්ඩ ගබඩාවට භාරගැනීම, නිකුත් කිරීම හා ලේඛනගත පොත් යාවත්කාලීන කර නොතිබීම. |
| (ඉ) වත්කම් පාලනය | i. | තාක්ෂණික හා විද්‍යාගාර උපකරණ සඳහා කිසිදු ආරක්ෂණ ක්‍රමවේදයක් භාවිතා නොකිරීම. |
| | ii. | එම උපකරණ සම්බන්ධයෙන් වගකීම් භාර නිලධාරියෙකු නම් කර නොතිබීම. |
| (ඊ) අභ්‍යන්තර පාලනය | i. | ගෙවන ලද වවුචර්වල "ගෙවන ලදී" මුද්‍රා යොදා නොතිබීම. |
| | ii. | චෙක්පත් හා මුදල් කුවිතාන්සි පොත් නිකුත් කිරීම සඳහා පිළිගත් ආකෘතියට අනුව උප පත්‍රිකා ලේඛනයක් නඩත්තු කර නොතිබීම. |

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

11